හදිසි නීති රෙගුලාසි මේ වගේ දේවල් සඳහා පාවිච්චි කරන්න එපා කියල විශේෂයෙන් මම ඉල්ලා සිටිනවා. ඊළඟට ගරු රාජ්‍ය ආරක්ෂක නියෝජ්‍ය ඇමතිතුමාට මා විශේෂයෙන් කියන්න කැමතියි. පසුගිය දින ගණනාව තුළ ගරු මුදල් ඇමතිතුමා විසින් මේ රටේ දූෂණය සහ නාස්තිය ගැන නොයෙකුත් ප්‍රකාශයන් කර තිබෙනවා. දූෂණය සහ නාස්තියට සම්බරව අද මේ රටේ මංකොල්ලකෑම් සිදුවී තිබෙන බව මා මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. සමහර විට ඊටත් වැඩි තත්ත්වයකින් වෙන්න පුළුවන්. උතුරේ සහ නැගෙනහිර පළාත්වල සිදුවී තිබෙන මංකොල්ලකෑම්වල එකතුව අරගෙන බැලුවොත් ඊටත් වැඩිවෙන්න පුළුවන්. ඒ නිසා වර්තමානයේදී බැංකු ශාඛාවල් ගණනාවක් වසා දමා එක් ප්‍රධාන බැංකුවක් කරා ඒ ශාඛාවල සියලු දේ ගෙන ඒමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට පටන් ගෙන තිබෙනවා. බැංකු කැඩීම නිසා බැංකු වසා දැමීමේ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට අද ආණ්ඩුව පටන් ගෙන තිබෙනවා. ඉදිරියේදී ආණ්ඩුව අනුගමනය කරන්න බලාපොරොත්තු වෙන්නේ මේ ප්‍රතිපත්තියද කියා අපි අහන්න කැමතියි. ඉදිරියේදී තව තවත් බැංකු ශාඛාවල් මංකොල්ලකෑම් සිදු වුවොත් ශාඛාවෙන් ශාඛාව වසා දමමින් එක් බැංකුවක් කරා එම ශාඛාවල් හකුලුවාගෙන ඒමේ ප්‍රතිපත්තියක් අනුගමනය කරන්නට බලාපොරොත්තු වෙනවාද ? එසේ නැතිනම් හරියාකාර ආරක්ෂක විධිවිධාන වැඩ පිළිවෙලක් දියත් කරන්න බලාපොරොත්තු වනවාද කියන ටික අපි අහන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, වට මේස සාකච්ඡාව පිළිබඳව කිසිවක් කතා නොකරන්නට කට වහගෙන ඉන්නට විරුද්ධ පාර්ශ්වය එකඟ වුණාය කියන ප්‍රවෘත්තියක් පසුගියද, විශේෂයෙන් පෙරේද 'සත්' පත්‍රයේ පළ කර තිබුණා. විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයකු හැටියටත්, වෙනම පක්ෂයක් නියෝජනය කරන කෙනෙක් හැටියටත් මා කියන්නට ඕනෑ, මම නම් එම තීරණයේ නොසිටි බව. විරුද්ධ පාර්ශ්වය රැස් වී එවැනි සාකච්ඡාවක් කළෙත් නැහැ. එක එක පක්ෂ හැටියට එක් එක් අය තීරණ ගන්නට පුළුවනි. නමුත් අප තවම බලා ගෙන ඉන්නවා, වට මේස සාකච්ඡාවේ ප්‍රතිඵලය කුමක්ද කියා. ඊට ප්‍රථමයෙන් අප යම් යම් ප්‍රකාශ කරමින් වගකීමෙන් තොරව හැසිරෙන්නේ නැහැ. නමුත් මේ සභාවේ මන්ත්‍රීවරයකු හැටියට මේ සභාවේදී නගන්නට ප්‍රශ්නයක් තිබෙනවා නම්, එය නැගීම අත්හැර දැමීමට කිසි ලෙසකින් අප සූදානම් වෙන්නේ නැත කියන ටික මෙම හදිසි නීතිය පැනවීම පිළිබඳ විවාදයේදී මම මතක් කරන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, විශේෂයෙන්ම ගම්පහ ගරු මන්ත්‍රීතුමා (එස්. ඩී. බණ්ඩාරනායක මහතා) නොයෙකුත් අදහස් ප්‍රකාශ කළා. අප කියන්නට ඕනෑ, මේ රටේ සිංහල භාෂාවට රාජ්‍ය භාෂාව වශයෙන් ඇති තත්ත්වය වෙනස් කිරීමට කිසි ලෙසකින්වත් අප එකඟ වෙන්නේ නැති බව. මේ රටේ සමස්ත ජනතාවගේ මතයත් ඒකයි. මේ රටේ රාජ්‍ය භාෂාව වන සිංහල භාෂාවට අමතරව ද්‍රවිඩ ජනතාවගේ භාෂාව දියුණු කර ගැනීමේ සහ එය පාවිච්චි කිරීමේ හැකියාව පිළිබඳ එකඟතාවත් තිබෙද්දී වෙනත් නොයෙකුත් උත්සාහයයන්හි යෙදීමේ අවශ්‍යතාවක් ඇති වී තිබෙනවාය කියන ටික අපි දකින්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත්, ලංකා සමසමාජ පක්ෂය මෙන්ම ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයත් එකඟ වූ ඒ සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම යටතේ ඉන්දියාවට පිටත් කර හැරීම සඳහා එකඟතාවයෙන් සිටි ප්‍රමාණය සහ ලංකාවේ පුරවැසිභාවය දීම සඳහා එකඟතාවයෙන් සිටි ප්‍රමාණය සම්බන්ධ කාරණා මෙයට ප්‍රථම මම මේ ගරු සභාවේදී මතු කර තිබෙනවා. එම සිරිමා-ශාස්ත්‍රී ගිවිසුම ක්‍රියාත්මක කරන්නට එකඟ වුණු සියළු ම පක්ෂ, එක්සත් ජාතික පක්ෂය සහ අද මේ පාර්ලිමේන්තුව තුළ සිටින මෙන්ම පාර්ලිමේන්තුව තුළ නැති දේශපාලන පක්ෂ, එම ගිවිසුම ක්‍රියාත්මක කිරීමේ වගකීමේ කොටස්කාරයන් හැටියට සිටි පක්ෂ, එයට වඩා වෙනස් තීරණයක් ගන්නවා නම් ඒ සඳහා මහජනතාවගේ අනුමැතියක් අවශ්‍යයි. ඒ වාගේම එවැනි වෙනසක් කරනවා නම් එසේ කිරීමට හේතුව මොකක්ද කියන කාරණයත් දැනගැනීමට අවශ්‍යයි. අන්න ඒ ටික හදිසි නීතිය පිළිබඳව පැවැත්වෙන මේ විවාදයේදී විශේෂයෙන්ම අප කියා සිටින්න ඕනෑ. ඒ අතරම හදිසි නීතිය පාවිච්චි කරමින් මේ රටේ මුළු මහත් ජාතික ප්‍රශ්න සියල්ලක්ම ඒ යටතේ විසඳන්නට උත්සාහ දරන්නට එපාය කියන කාරණයත් මේ අවස්ථාවේදී සඳහන් කරන්න ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[දිනේෂ් ගුණවර්ධන මහතා]

මෙයට අමතරව අද රාජ්‍ය ආරක්ෂාව පවත්වා ගෙන යාමට බැරි තත්ත්වයකට රාජ්‍ය ආරක්ෂක බලකායයත් වැටී ඇති බවත් මතක් කරන්න ඕනෑ. මෙයට හේතු වී ඇති කාරණා ගණනාවක්ම මීට ප්‍රථමයෙන් මම ගරු සභාවේදී මතු කළා. ඒවා නැවත නැවතත් මතක් කර දෙන්නට මම බලාපොරොත්තු වෙන්නේ නැහැ. මෙහිදී විශේෂයෙන්ම මතක් කර දිය යුතු එක් කාරණයක් තිබෙනවා. එනම්, අද රටේ පරිපාලනය සම්පූර්ණයෙන්ම අවුල් සහගත තත්ත්වයකට පරිවර්තනය වී ඇති බවයි. කැබිනට් වෙනසක් සිදු වන බවක් ගැන පසුගිය සති දෙක තුළ පුවත්පත්වල ප්‍රවෘත්ති පළ වුණා. එම ප්‍රවෘත්තිය වැරදිය කියා රජය කියන්නේත් නැහැ. මේ නිසා කිසිම දෙපාර්තමේන්තුවක නිලධාරියෙක් වැඩක් කරන්නෙ නැහැ. අලුත් ඇමතිවරයා හැටියට එන්නේ කවුද කියා බලා ගෙන ඉන්නවා. උසස් නිලධාරීන් මෙන්ම පහළ මට්ටමේ නිලධාරීනුත් ඒ අන්දමට බලා ගෙන සිටිනවා. එවැනි වෙනසක් සිදු වේය කියා බලා ගෙන සිටින නිසා, මේ අන්දමට මුළු රටේම රාජ්‍ය පරිපාලනය අඩපණ වන තත්ත්වයකට පත් වී ඇති හෙයින් රජය එවැනි පියවරක් ගන්නේ නැති නම් අඩු වශයෙන් ඒ සම්බන්ධයෙන් ප්‍රවෘත්ති පත්‍රවලට නිවේදනයක් නිකුත් කරන්නට රජයේ වගකීමක් තිබෙනවා නේද ? ඒක එක තත්ත්වයක්. අනික් පැත්තෙන් ආර්ථික වශයෙන් රට වැටී ඇති මේ අර්බුදකාරී ස්වභාවය නිසා රටේ එදිනෙද කටයුතු ගැන මෙන්ම අනාගතය පිළිබඳව සැකයකින් ජීවත්වන තත්ත්වයකට රටේ ජනතාව වැටී ඇති අවස්ථාවක, මහජන විශ්වාසය නැවතත් දිනා ගැනීම සඳහා, ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමය කෙරෙහි ජනතාවගේ තිබෙන බලාපොරොත්තුව සහ විශ්වාසය දිනා ගැනීම සඳහා මෙම හදිසි නීතිය දික් කරනවාට වඩා මහා මැතිවරණයක් පවත්වා සැබෑ ජනතා විශ්වාසය තහවුරු කරන ලෙස මෙම හදිසි නීතිය පිළිබඳ විවාදයේදී ඉල්ලා සිටිමින් මා නවතිනවා.

අ. භා. 3.14

ගාමිණී ජයසූරිය මහතා (කෘෂිකාර්මික සංවර්ධනය හා පර්යේෂණ පිළිබඳ ඇමතිතුමා සහ ආහාර හා සමුපකාර ඇමතිතුමා)
(திரு. காமினி ஜயசூரிய — விவசாய அபிவிருத்தி, ஆராய்ச்சி அமைச்சரும் உணவு, கூட்டுறவு அமைச்சரும்)
(Mr. Gamani Jayasuriya–Minister of Agricultural Development & Research and Minister of Food and Co-operatives)

ගරු කථානායකතුමනි, දීර්ඝ කථාවක් කරන්න නොවෙයි මා නැගී සිටියේ. මහරගම ගරු මන්ත්‍රීතුමා (දිනේෂ් ගුණවර්ධන මහතා) ප්‍රකාශ කළා පසුගිය දවස්වල ඇති වූ වර්ෂාව නිසා, ගංවතුර නිසා ගොවි මහත්වරුන්ට යම්කිසි කරදරයකට මුහුණ පාන්නට සිදු වී තිබෙනවාය කියා. ඒක සත්‍යයක්. ඒ කාරණය අපිත් තේරුම් ගෙන තිබෙනවා. ඒ සම්බන්ධයෙන් මම දැනටමත් යම් පියවරක් ගෙන තිබෙනවා. එවැනි ප්‍රදේශවල සිටින දිසාපතිවරුන්ට මම දැනුම් දී තිබෙනවා. ඒ ගොවිතැන් වගා හානි පිළිබඳව වාර්තා ඉදිරිපත් කරන්නය කියා. ඒ වාර්තා ලැබුණාට පස්සෙ අපට කරන්න පුළුවන් අත දීමක් උදව්වක් කරන්න සූදානම් බව මම ප්‍රකාශ කරනවා.

ඒ එක්කම ප්‍රශ්නයක් මතු කළා සමුපකාර සම්බන්ධයෙන් හදිසි නීතිය පාවිච්චි කරනවාය කියා. සමුපකාරය පිළිබඳව තත්ත්වය මොකක්ද කියා මේ මන්ත්‍රීවරු කීප දෙනෙක්ම දන්නවා. ඇත්ත වශයෙන්ම විශාල ප්‍රතිසංවිධානයක්, එහෙම නැත්නම් අඩුපාඩු සකස් කිරීමක් කරන්න සිද්ධ වී තිබෙනවා. වගකිය යුතු ඇමතිවරයෙක් හැටියට මම මහරගම මන්ත්‍රීතුමාට ප්‍රකාශ කරන්න කැමතියි අපි නිකම්ම හිතා මතා හදිසි නීතිය පාවිච්චි කරන්න බලාපොරොත්තු වෙන්නෙ නැහැ කියා. අවශ්‍යතාවක් ඇති වුණොත්, වෙනත් මාර්ගයක් නැත්නම් තමයි අපි ඒ අනුව ක්‍රියා කරන්නෙ. මේ කාරණා දෙක මතක් කරන්නයි මම නැගී සිටියේ.

අ. භා. 3.16

මෛත්‍රීපාල සේනානායක මහතා (මැදවච්චිය)
(திரு. மைத்திரிபால சேனநாயக்க — மதவாச்சி)
(Mr. Maithripala Senanayeke–Medawachchiya)

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තු සැසි වාරය මාසයක් පමණ කල් තබා අද උදේ ජනාධිපතිතුමා කථාවක් පවත්වා නැවත විවෘත කිරීමෙන් පසුව පළමුවන කටයුත්ත හැටියට ඉදිරිපත් කර තිබෙන හදිසි නීතිය නැවත වරක් දීර්ඝ කිරීමේ යෝජනාව පිළිබඳ විවාදයටයි මේ සභාව දැන් කන් දිගෙන සිටින්නේ.

අපට දැනගන්න ලැබී තිබෙන හැටියට පාර්ලිමේන්තුව මාසයක් පමණ කල් තැබුවේ වට මේස සාකච්ඡාවේදී ඉදිරිපත් වන අදහස්, ප්‍රතිඅදහස් මේ ස්ථානයේ පාවිච්චි කර වට මේස සාකච්ඡාවට යම් බාධාවක් ඇති වන විධියේ කටයුතු කෙරෙයි කියන විශ්වාසය උඩ බවයි. නමුත් මම කණගාටු වෙනවා ජනාධිපතිතුමා අද උදේ කළ එතුමාගේ ප්‍රතිපත්ති කථාවෙන්ම එතුමා මේ අවස්ථාව පාවිච්චි කර තිබෙනවාය කියා ඒ වටමේස සාකච්ඡාවට සම්බන්ධ කරුණු ගැනත් විශේෂයෙන්ම විරුද්ධ පක්ෂයේ ආණ්ඩු තිබුණු කාලයේදී ඒවායින් වෙච්ච සිද්ධීන් ගැනත් මේ සභාවටත් ජනතාවටත් දීර්ඝ ඉතිහාසයක් සහිත කරුණු ප්‍රකාශ කිරීමට.

එතුමාගේ කථාවෙන් මොකක්ද අපට කිව්වේ ? මෙන්න මේ මේ විධියට මේ රටේ දේශපාලන ක්ෂේත්‍රයේ වෙනස්කම් ඇති වුණාය කිව්වා. නිදහස ලැබුණාට පසුව මේ මේ ආණ්ඩු ඇති වුණාය කිව්වා. එද සමගියෙන් සිටි ජාතීන් අද භේද භින්න වී තිබෙනවාය කිව්වා. ඒ භේද භින්න වීමට හේතු වූ එක කාරණයක් නම් ගරු බණ්ඩාරනායක මහතා සිංහල භාෂා පනත ඉදිරිපත් කිරීමය කියන එක එතුමා නොකියා කිව්වා. අන්න ඒ විධියට කරුණු ප්‍රකාශ කරන්න අද මේ සභාව පාවිච්චි කර තිබෙනවා. එතුමා තව දුරටත් කිව්වා පළමුවන වතාවට ත්‍රස්තවාදීන්ගේ ක්‍රියාවලට මුහුණ දීමට අවස්ථාව ඇති වුණා නම් ඒ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ නගරාධිපතිවරයෙකු වූ දුරෙයප්පා මහතාගේ මරණයෙන් 1975 දී ඇති වුණු ත්‍රස්තවාදී ක්‍රියාවය කියා. එපමණක් නොවෙයි, එතුමාගේ කථාවෙන් තවත් දෙයක් කිව්ව. 1960 සිට 1965 දක්වා පැවති ශ්‍රී ලංකා නිදහස් පක්ෂ ආණ්ඩුව කාලයේදී පළමුවන වරට යුද්ධ හමුදාව යාපනය අර්ධද්වීපයට අරගෙන ගොස් ඔවුන් එහි පැළපදියම් කිරීම නිසා යම්කිසි විධියක තත්ත්වයක් ඇති වුණා කියන ප්‍රකාශයකුත් එතුමා විසින් කරන්නට යෙදුණා.

ගරු කථානායකතුමනි, මා විශේෂයෙන්ම මේ අවස්ථාවේ මතක් කර සිටින්නේ මෙයයි. අද මේ රටේ යම් විධියක අසමගිකම් තිබෙනවා නම් නැත්නම් ජාතීන් අතර යම් විධියක ප්‍රශ්න ඇති වී තිබෙනවා නම් එවැනි අවස්ථාවක ඔය විධියේ දේවල් නොකියා ඒවා අමතක කර වටමේස සාකච්ඡා මගින් හෝ වෙනත් මාර්ගයකින් හෝ ඒවා සමථයකට පත් කර ගැනීමට පියවර ගන්නවා වෙනුවට නැවත නැවතත් ඕවා මතක් කිරීම අවශ්‍යද කියන ප්‍රශ්නය මේ අවස්ථාවේදී අහන්නට මට සිදු වී තිබෙනවා.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. අතිගරු ජනාධිපතිතුමාගේ දේශනය ගැන කථා කරන්නට විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා වෙනම දිනයක් ඉල්ලා තිබෙනවා.

මෛත්‍රීපාල සේනානායක මහතා
(திரு. மைத்திரிபால சேனநாயக்க)
(Mr. Maithripala Senanayeke)

මම කියන්නට අදහස් කළේ ඔපමණයි. මේ අවස්ථාවේදී එතුමා කී කරුණු මේ හදිසි නීතියට අදාළ නිසයි, මා ඒ ගැන සඳහන් කළේ. මේ ආණ්ඩුව තවත් අවුරුදු 6 කට බලය ලබාගෙන එයින් මාස 9 කටත් වැඩි කාලයක් හදිසි තත්ත්වයක් පවත්වාගෙන යන මේ අවස්ථාවේ කළ යුතු වන්නේ අර විධියේ දේවල් මතක් කිරීම නොවෙයි. මේ රටේ ඇතිවේගෙන යන සිද්ධීන් මර්ධනය කර පාලනයක් ගෙන යැමට හැකියාවක් මෙතෙක් කල් මේ ආණ්ඩුවට ඇති වී නැති බව කණගාටුවෙන් වුවත් කියන්නට අපට සිදු වී තිබෙනවා.

මොකක්ද අද සිද්ද වේගෙන යන්නේ ? අපට දැනගන්නට ලැබී තිබෙන අන්දමට ඊයෙත් බැංකුවක් කඩා ලක්ෂ 120 ක පමණ දේවල් අරගෙන තිබෙනවා. මහරගම ගරු මන්ත්‍රීතුමා සඳහන් කළ අන්දමට පරිපාලනයේ පහසුව සඳහා බැංකු කීපයක වත්කම් එක තැනකට ගත් විට අර පිරිසට එයින් වාසියක් සැලසෙනවා. වෙන විධියකට කියනවා නම් එසේ කිරීම නිසා දහ පොලක් කඩා ගත යුතු සල්ලි එක තැනක් කැඩීමෙන් අරගන්නට ඔවුන්ට අවස්ථාව ලැබෙනවා. ඔය විදියේ තත්ත්වයක් අද මේ රටේ ඇති වී තිබෙනවා.

විරුද්ධ පාර්ශ්වයේ අය වශයෙන් මුලදී මේ හදිසි නීතියට අපිත් සහයෝගය දුන්නා. එහෙත් අද අපට සිදු වී තිබෙනවා එයට සහයෝගය නොදී සිටින්නට. සහයෝගය නොදීමට අපට සිදු වී තිබෙන්නේ මේ රජය ගෙන යන වැඩ පිළිවෙළ නිසයි. හදිසි නීතිය පාවිච්චි කර කළ යුතු දේවල් නොකිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නිසා ඉතා කණගාටුදායක තත්ත්වයක් ඇති වී තිබෙන බවයි අපට කියන්නට සිදු වී තිබෙන්නේ. ඒ නිසා හදිසි නීතිය දීක් කිරීම ගැන අපි අපේ විරුද්ධත්වය ප්‍රකාශ කරනවා. මේ හදිසි නීතිය නියම විධියට පාවිච්චි කර අසහනයන්ගෙන් හා අද රට මුහුණ පා තිබෙන ප්‍රශ්නවලින් රට මුදවා ගැනීමට තමුන්නාන්සේලා පියවර ගන්නවා ඇත යන විශ්වාසය පිට මා නිහඬ වෙනවා.

අනිල් මූණසිංහ මහතා (මතුගම)
(திரு. அனில் முனசிங்ஹ — மத்துகம)
(Mr. Anil Moonesinghe–Matugama)

Mr. Speaker it has now become a part of the custom of this House every month to debate the extension of the Emergency by the Public Security Ordinance Proclamation. It is, therefore, more and more a repetition of what was stated earlier on both sides of the House. But in recent times it has appeared to me that the Proclamation under the Public Security Ordinance has become more an accepted thing amongst all elements in society, so much so that they treat it not as something extraordinary, but as something which is part and parcel of the ordinary laws of the country.

Sir, we heard from the hon. Members on the opposite side about the anti-terrorist legislation. We were asked pointedly whether we were for it or whether we were against it. You brought your anti-terrorist legislation – but, has terrorism declined ? On the contrary, it is escalating daily, so much so that this Government appears to be suffering from paradlysis. No action is being taken to subdue this. No adequate action is being taken to subdue terrorism, so much so that I am reminded of the second world war when I was a young boy. (*Interruption.*) But there is a repetition of history. That is unfortunately the case. Because, at the very beginning of the war there were communiques published in our newspapers about how the British army were carrying out a strategic retreat everyday until they strategically retreated into the confines of the United Kingdom.

Similarly, we have the People's Bank announcements :

"the People's Bank announces the merger of the Branches listed below with the Branches noted against each, with the view to offering greater security and redeployment of both staff and equipment. This arrangement will come into effect from 27th of February 1984."

Then it relates to various branches in the Northern region and the Eastern region.

I do not deny that it is necessary during times of war sometimes to take a step back in order to take two steps forward.

I remember during the 1971 incidents a number of Police Stations were closed–only temporarily, because with that closure a greater communication was established, a shorter line was established, and from there onwards, again an expansion took place. So we do not know whether this Government is still on the retreat.

From the time that Emergency was declared we are in retreat. The Government is in paralysis and this has become the order of the day, unfortunately today also.

හරින්ද්‍ර කොරයා මහතා (වැඩබලන රාජ්‍ය පරිපාලන ඇමතිතුමා)
(திரு. ஹரிந்திர கொறயா — பதில் பொது நிர்வாக அமைச்சர்)
(Mr. Harindra Corea–Acting Minister of Public Administration)

The onslaught will come.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

"The onslaught will come." I am very happy to hear that. But what is happening ? The last "Weekend" paper said that the crime wave in Sri Lanka is raging, with housebreaking, theft, rape, murder becoming more brutal and more random everyday ; and everybody recognises it. I think the Hon. Minister of Internal Security will admit that the crime rate today is at the highest in Sri Lanka's history.

What is happening ? The Emergency is there, you have anti-terrorist laws, you have the wherewithal, but despite all these, there is a complete escalation of acts of violence being committed in our country. The amount of thefts, Sir, and also the house-breaking, robbery, the number of banks that have been broken into, the amount of money taken away – this has become a part of the life of our country. Therefore, is not the Opposition justified in asking the Government, "What is the use of this Emergency ? What is the result of it ? Have you been able to contain these acts ? Have you been able even to establish a semblance of Government in some sections of the Northern and Eastern Provinces." Now we read in the newspaper that some of the safes were taken away from banks in broad daylight and brought back also in broad daylight, empty. In other words, the Government has to admit that it has lost control in the Northern and Eastern regions of this country. Sir, it is from this point of view that we think that the Government is becoming ineffective and paralysed. And I saw the hon. Members very disheartened this morning. So if this is taking place only in the North and East, I can imagine ; it is happening all over the country.

Some time ago, Sir, we had a strike of private buses. They refused to run the buses all throughout the Island. Unfortunately, the Government was held to ransom. For one day people suffered without buses. Because the Central Transport Board has not been given sufficient funds to buy enough buses, the fleet which should be in the region of about 12,000 today, unfortunately, is in the region of about 6,000. These are all parts of the same system.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනිල් මුණසිංහ මහතා]

According to the newspapers this escalation of violence is due to the fact that the poorer are getting poorer. Economic causes are at the base of this violence according to many newspapers.

Sir, I can see that in many parts of the country in every village, there is betting taking place now. Illegal gambling is taking place. Every village today has a betting centre, something which did not exist say, five to ten years ago in this country. It is there. It is a very big industry today. In fact, I am sorry for the Government because if you go to stop it you will stop the livelihood of several thousands of people. But this is all part of your open economy.

Now, I noticed, sir, that my good Friend, the Member for Gampaha quoted the Secretary to the Ministry of Justice, Mr. Amerasinghe, who says "society is being crushed under the weight of cirme". It is a very serious thing to say. Then there are statistics given–

"48 per cent of criminal suspects at large in society, a senior Deputy Inspector General, Mr. Sunderalingam told this paper. He admitted that the conviction record of the police had dropped over the years but claimed that lack of public co-operation and inability to retain witnesses due to delays in courts had contributed to it."

Sir, that is so. I know, Sir, of a Magistrate who publicly said that witnesses were not prepared to go and give evidence in an upcountry court through fear. Such a declaration to be made by a Magistrate in open court, Sir, is something very serious. It is, therefore, with this background I find "All the agencies in criminal justice system received annually only a meagre collective allocation of 1.87 per cent from the national budget". In fact, Sir, that is what has happened. I do not blame the police. I do not blame the law enforcement authorities, because many of them are finding it difficult to exist without having recourse to accepting some sort of illegal gratification. The Hon. Minister will agree with me that the salary paid to an ordinary policeman is insufficient. How is he going to live when the cost of living is rising rapidly ? Therefore, many of them are concerned with that aspect of life. So we find that under the open enconomy, under your system of budgetary allocations less and less is allocated to the police, to the administration of justice. Recently, I have been going often to the courts and I find that the courts are full of cobwebs. The Joint Magistrate's Court here in Colombo has no fans. You cannot sit in that place. There are cobwebs all over. Also, I notice that the stenographers are not so good as they used to be. You could see that many of them are running in time to catch the train to Galle or some other place. Why ? It is because they cannot make ends meet. Therefore, all these things are snowballing and contributing to the lack of justice that exist in the courts of our country.

Sir, despite all these things I am very happy to say that our judiciary is absolutely free of corruption. I think that is a thing that I must say as far as I know. But on the other hand, today many of the people in the legal profession do not like to take on appointments in the judicial service because they do not have the amenities, they do not get sufficient recompense for doing a proper job. So, today you have more and more younger lawyers who are less experienced coming in as judges. Therefore, contributing to the tendency for justice to be down-graded. Therefore, on behalf of the Sri Lanka Freedom Party, I would like to say that we are unable to support the proclamation, because it has in no way helped to end the slide away from law and order–sliding towards a system of semi-anarchy and sliding away from the rule of law. Therefore, from our side we would like the Government to realize the situation seriously and seriously ponder over the policies that are being followed. I wish to reiterate that today these problems can be tackled only by a Government which has the will to tackle these problems and such a government can only come as a result of an election. I feel that it is now time for an election to be held so that the voices of the people which have been stifled for such a long time, where you have not been able to obtain the opinion of the people except in a Referendum sometime ago which did not really.....–(*Interruption*) But you had the Referendum at a time when these problems were not there. These problems which are very serious are here now. I would therefore appeal to the Government and say that this is the opportune time to dissolve Parliament and go to the people and get their views. Thank you.

අ. භා.3.37

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)
(Mr. Ananda Dassanayake–Kotmale)

ගරු කථානායකතුමනි, හදිසි නීතිය මේ මාසය දක්වා දීර්ඝ කිරීම ගැන අපි පසුගිය මාසයේ දී විවාද කරන අවස්ථාවේ දී ගරු අගමැතිතුමා කිව්වා හැකිතාක් ඉක්මණින් එය ඉවත් කරනවාය කියා. මේක දැන් මාස නවයක් තිස්සේම නැවත නැවත කෙරීගෙන එනවා. හදිසි නීතිය අවශ්‍යයි කියනවා. ඇත්තවශයෙන්ම කියනවා නම් මේක එක විධියක පිළිකාවක් වෙලා තිබෙනවා. මේක ජාතියට හැදුණු පිළිකාවක් වෙලා තිබෙනවා. ඒ කියන්නෙ "කැන්සර්" එකක්. මේක අස්කරන්න බැරි කැන්සර් එකක් වෙලා තිබෙනවා.

හදිසි නීතියට ඉතාම බැරෑරුම් ලෙස පහර ගැසුවේ එක්සත් ජාතික පක්ෂයයි. පසුගිය ආණ්ඩු කාලයේදී මේක වැරදියි, හදිසි නීතිය උපයෝගී කරගෙන රටක් ආණ්ඩු කරන්න අවශ්‍ය නැහැ කියන මතය ඒ අය තුළ තිබුණා. මේ ආණ්ඩුව පිහිටුවන්නට පෙර ඒක මේ අය පිළිගත් සිද්ධාන්තයක් වෙලා තිබුණා. ඒ ගැන විවිධ විවේචන, උද්ඝෝෂණ රට පුරා කරගෙන ගියා. වේදිකාවලින් උද්ඝෝෂණ ගෙන ගියා. ඒ සියල්ලක්ම දැන් අමතක වෙලා තිබෙනවා. තමුන්නාන්සේලා පිළිගන්නට ඕනැ එද, ඒ ක්‍රියාත්මක කළ හදිසි නීතියත් අවශ්‍යව තිබුණු බව. මේ විධියට ආණ්ඩුවක් කරගෙන යන විට, ඇතිවන ත්‍රස්තවාදී ක්‍රියා මැඩපැවැත්වීමට සාමාන්‍යයෙන් පවතින නීතියෙන් නොහැකිය කියා තමුන්නාන්සේලා පිළිගන්නට ඕනැ. ඒ නිසා තමයි අද ත්‍රස්තවාදී ක්‍රියා මැඩපවත්වන්නට හදිසි නීතිය උපයෝගී කරගන්නේ. [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තමුන්නාන්සේලාට අවුරුදු හතෙත් නොවෙයි, සමහරවිට අවුරුදු දහතරකින්වත් ඒක කරන්න පුළුවන් වෙයිද කියන්න බැහැ. එයින් පෙනෙන්නේ ඒවා මර්ධනය කිරීමට ගන්නා වැඩපිළිවෙළ අසාර්ථකය කියන එකයි ; ඒකට අවශ්‍ය මහජන සහයෝගය ලැබෙන්නෙ නැහැ කියන එකයි. මහජන සහයෝගය ලබාගන්නට නම් රජය පෙන්වන්නට ඕනෑ ධාර්මික බව. වචනයෙන් නොවෙයි, නියම විධියට, ක්‍රියාවෙන්ම, අකුරටම පෙන්වන්නට ඕනෑ තමන් ධර්මිෂ්ටයි, කාටත් සාධාරණයි කියන එක. ඒක පෙන්වන්නේ නැත්නම්, අසාධාරණය රජ කරනවාය කියන එක පේනවා. ජනතාවට එසේ හැඟෙනවා නම් ඔවුන් පාලනය කරන්නට තමුන්නාන්සේලාට පුළුවන්වේය කියා මම නම් හිතන්නෙ නැහැ. ජනතාව පාලනය කරන්නට තමුන්නාන්සේලාට බැරි බව දැන් ඔප්පුවෙලා ඉවරයි.

විරුද්ධ පක්ෂය වශයෙන් පසුගිය කාලයේ දී අපි නැවත නැවතත් කරුණු පෙන්වා දුන්නා මේ ගැන. අපි පිළිගන්නවා නීතිය කෙරෙහි ජනතාවගේ අවනත භාවය තිබෙන්නේ මෙහෙමයි කියා. අද අපට බෙදුවා පොතක්:

"To Live in Dignity" Sri Lanka : Thirty-five years of the Universal Declaration of Human Rights – a Ministry of State publication.

මම කියවා බැලුවා ටිකක්. මේකේ හොඳ අදහස් ටිකක් තිබෙනවා:

"Laws, including constitutional laws, can be manipulated, or subverted. Laws are applied truly in the spirit of their creation only when society accepts, respects and, indeed, cherishes them. Such laws–vibrant and benign–reflect a societal consensus, and continue to influence that consensus."

මේකෙන් පෙනෙන්නෙ මොකක්ද? නීතිය ජනතාව පිළිගන්නට ඕනෑ. නීතිය ජනතාව පිළිගන්නෙ නැතිනම් කොපමණ නීති හැදුවත්, නීති ක්‍රියාත්මක කළත් ජනතාවගේ සිතුම් පැතුම් මර්ධනය කරන්න බැහැ.

අපි ඒක මුල සිටම කිව්වා. තමුන්නාන්සේලාට නීති හදන්නට පුළුවන්. තමුන්නාන්සේලා නීති හැදුවා. තමුන්නාන්සේලා " ටෙරරිස්ට් ඇක්ට් " කියලා එකක් හැදුවා. " ටයිගර් " පනත කියලා නැත්නම් කොටි පනත කියලා එකක් හැදුවා. ඒ සියළුම පනත් අද කුණු කූඩේට ගිහිල්ලා. ඒවායින් කිසිම වැඩක් නැහැ. අපි ඒක කිව්වා, තමුන්නාන්සේලාට. මේ පනත් හදලා කවදාවත් මේ මර්දන ව්‍යාපාරය ගෙන යන්නට බැහැ කියලා අපි කිව්වා. ඇයි ? ඒ ගැන මහජනයාගේ අවධානය යොමුවන්නේ නැහැ. ඊට හේතු බොහොමයක් තිබෙනවා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ තිබෙන විශාල බලය නැත්නම් බහුතර බලය නිසාම එක කාලයක් විරුද්ධ පක්ෂයට කථාකරන්නට බැරි තරමට හඬ ගැසී සිටියාය කියන එක පිළිගත යුතු සත්‍යයක්. තමුන්නාන්සේලා හැමදෙනාම කිව්වේ විරුද්ධ පක්ෂයක් නැතිවාට පිට ආණ්ඩුව කරන්නට පුළුවන්ය කියලයි. අපි විරුද්ධ පක්ෂයේ උපදෙස් ගන්නේ නැහැ කියලා කිව්වා. " තමුන්නාන්සේලාගේ අදහස් ඕනෑ නැහැ " කියලා මේ පාර්ලිමේන්තුවේදීම කිව්වා. වැදගත් අය කිව්වා " අපිට උපදෙස් දෙන්නට අවශ්‍ය නැහැ " කියලා. නමුත් ප්‍රජාතන්ත්‍රවාදී රටක, ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩු ක්‍රමයක් තිබෙන රටක, ජනතාව සහයෝගයෙන් ඉදිරියට යන රටක ඒක කියන්නට බැහැ. නමුත් එවැනි ලාමක ප්‍රකාශන පවා මේ ගරු සභාවට ආවා. වේදිකාවලත් කිව්වා. ප්‍රචාරක කටයුතු සඳහාත් කිව්වා. මෙන්න මේ සිද්ධීන් උඩ රටේ ආර්ථික අහේනියක් ආවා. ඒක කවුරුත් පිළිගන්නවා.

ගරු ජනාධිපතිතුමාත් අද උදේ කිව්වා ඒ විධියේ ආර්ථික අහේනියක් තිබෙනවාය කියා. ඒ වාගේම ගරු මුදල් ඇමතිතුමාත් දැන් අවුරුදු තුනක කාලයක සිට අවුරුදු පතාම ඇත්ත ඇති සැටියට කියනවා, ආර්ථික අහේනියක් තිබෙනවාය කියලා. රටේ ආර්ථික අහේනියක් ත්‍රස්තවාදී ක්‍රියාත් එන්ට එන්ටම වැඩිවෙනවාය කියන එක සිද්ධාන්තයක්. ආර්ථික අහේනිය ටික දෙනෙකුට හැර රටේ හැම පුද්ගලයෙකුටම බලපානවා. සුළු පිරිසක් පමණක් එයින් බේරිලා ඉන්නවා. ඒ බේරිලා ඉන්න අතලොස්ස ධනයෙන් ආඪ්‍ය උසස්ම පෙළේ අයයි. ඒ අයට ප්‍රශ්නයක් නැහැ.

රැකියා කරන හැම පුද්ගලයාම අද කථා කරන්නේ ජීවත් වන්නට ක්‍රමයක් නැහැ කියන එක ගැනයි. ජීවත් වන්නට ක්‍රමයක් හරිහැටි ඇති කරන්නට තමුන්නාන්සේලාගේ ආණ්ඩුව මේ නාස්තිය ගැන මෙතෙක් කල් සැලකිල්ලක් දක්වා නැහැ. නාස්තිය ගැන සැලකිල්ලක් දක්වන්නේ නැති වන විට රටේ ආර්ථිකය පීඩාවට පත්වෙනවාය කියන එක ගැන විරුද්ධ පාර්ශ්වය වෙනුවෙන් අපි මුල සිටම පැහැදිලිව කරුණු කිව්වා. මේ නාස්තිය ගැන වහාම ගන්නට ඕනෑ පියවර ගැන අපි කිව්වා. නමුත් ගත්තේ නැහැ. විරුද්ධ පාර්ශ්වයෙන් නාස්තියක් ගැන කරුණු ඉදිරිපත් කළාම ආණ්ඩු පාර්ශ්වයෙන් සමහර වෙලාවට එන්නේ තර්ජනයක් නැත්නම් ගර්ජනයක්. " ඔය විධියට කරන්නට එපා. ඕවා කරන්නේ ආණ්ඩුව කඩාකප්පල් කරන්නටයි " කියලා මුල සිටම අපිට තර්ජනය කළා. අපි නාස්තිය ගැන පෙන්වන විට ඒ නාස්තිය පෙන්නුම් කළ පුද්ගලයාට දඬුවම් දුන් අවස්ථා තිබෙනවා. නාස්තියක් ගැන, නැත්නම් යමෙක් යම්කිසි වරදක් කරනවාය කියලා පෙන්නුම් කළාම, දූෂණයක් කර තිබෙනවාය කියලා පෙන්නුම් කළාම සමහර වෙලාවට ඒ නාස්තිය ගැන අපට තොරතුරු දුන් පුද්ගලයා හොයාගෙන ගිහිල්ලා ඒ තොරතුරු දුන්නා කියලා දඬුවම් දෙනවා. ඒ විදියේ තත්ත්වයකට රජය වැටුණා. ඒ තත්ත්වයට රජය වැටටෙව්වේ මේ ගරු සභාවේ මන්ත්‍රීවරුන්ය කියලා මම ඒ දවස්වල කිව්වා. නියම විධියට ආණ්ඩුව ගෙන යන්නට උපදෙස් දුන්නා නම් ඇමති මණ්ඩලයෙන් හෝ ඊට වඩා උසස් තැනකින් හෝ හොරෙන් වැරැද්ද දුටු තැන ඒ වැරැද්ද හරිහැටි පෙන්වා දී ඒක හදන්නට උත්සාහ කළා නම් කවදාවත් මේ තත්ත්වයට වැටෙන්නේ නැහැ.

තමුන්නාන්සේලා ඊට ඉඩ දුන්නේ නැහැ. ඊට ඉඩ දුන්නේ නැත්තේ මේ නිසයි. තමුන්නාන්සේලාගේ තිබුණු නිදහස හකුළලා දැම්මා. නිදහස නැති කළා. පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට තිබෙන නිදහස නැති වුණා. මන්ත්‍රීවරුන් විවේචනය කරන්නට බැරි තත්ත්වයකට වැටුණා. රජය විවේචනය කරන්නට පුළුවන් වන්නට ඕනෑ. මන්ත්‍රීවරුන් රජය විවේචනය කරන්නේ නැත්නම් රජය හදන්නට බැහැ. එවැනි තත්ත්වයකට වැටුණා. අන්න ඒ නිසා තමයි මේ විධියේ දේවල් ඇති වුණේ.

රජය නොමග ගියා. රජය කිසිම විදියකින් හදන්නට බැරි තරමට අකීකරු අශ්වයෙක් වගේ වුනා. අකීකරු අශ්වයෙක් දුවන්නට පටන්ගත්තා. ඒ අකීකරු අශ්වයා අනෙක් පැත්තෙන් ගන්න කොට බූරුවෙක්. අකීකරු අශ්වයා ඊළඟට විග්‍රහ කරනකොට එන්නේ බූරුවෙක් හැටියටයි. ඇත්තවශයෙන්ම කියනවා නම් ආණ්ඩුව ඒ විධියේ මාර්ගයක ගමන් කළ නිසයි අද මේ තත්ත්වයට වැටී තිබෙන්නේ. පසුගිය කාලයේ දී අපි ඉදිරිපත් කළා කරුණු කීපයක්. එකක් තමයි නීතිය හරියට ක්‍රියාත්මක වෙනවා නම් නීතියට ජනතාවගේ අවනතභාවය ලැබෙන බව. අධිකරණය මගින් යුක්තිය ඉෂ්ට කරන්නට ඕනෑ. එයින් හැම දෙනාටම සාධාරණය ඉෂ්ට වෙන්නට ඕනෑ. හැම දෙනාටම සාධාරණය ඉෂ්ට වෙන්නට ඕනෑ කියන එකට හේතුව මම පෙන්වන්නම්. මේ රටේ පළමුවෙනි අගමැතිතුමා **"To Live in Dignity"** නමැති පොතේ **–A Ministry of State publication–** පළමුවෙනි පිටුවේ මෙහෙම සඳහන් කර තිබෙනවා.

"On that original Independence Day in 1948, Sri Lanka's first Prime Minister, Don Stephen Senanayake, said :

"We have learned to value the right of individual liberty, the right to the protection of person and property, to freedom of speech, to the free exercise of religion. We value the privilege of equality before the law, of trial by one's peers, of equality of opportunity to fulfil one's personality."

මෙය ඉතාමත් වැදගත් කියමනක්. ඇත්තවශයෙන්ම පළමුවෙනි අගමැතිතුමා වශයෙන් ප්‍රකාශ කළ ඒ වචන ටික ඉතාමත් වැදගත්. මේ පොත අද මා කියවන විට ලකුණු කළ තැනක් තමයි, ඒ. එයින් පෙනෙන්නේ මොකක් ද ? එතුමා සඳහන් කර තිබෙනවා, මිනිසුන්ගේ මූලික අයිතිවාසිකම් රකින්නට ඕනෑ බව. පුද්ගලයා වශයෙනුත්, ජාතියක් වශයෙනුත්, ජනතාවක් වශයෙනුත් එය රකින්නට ඕනෑ. ආගමික මත ඒ විධියෙන්ම ආරක්ෂා කරන්න ඕනෑ. ඒ ඒ ආගම් අදහන අයට නිදහසේ ඒ ඒ ආගම් අදහන්න ඉඩ දෙන්න ඕනෑ.

අධිකරණය ඉදිරියේ හැම එක්කෙනෙක්ම එක සමානයි. ලොකු කුඩා භේදයක්, තාන්න-මාන්න භේදයක් උසාවිය ඉදිරියේ නැහැ කියන එකත් එහි පැහැදිලි කර තිබෙනවා. ඒ විධියේ සාධාරණත්වයක් අවශ්‍යයි කියන එක 1948 දී එතුමා ප්‍රකාශ කර තිබෙනවා. නමුත් අද ඒ තත්ත්වය තිබෙනවාද කියන එකයි ප්‍රශ්නය. මෙය 1977 දී තමුන්නාන්සේලාට අපි පෙන්වා දුන්නා. එදා සිටි අගමැතිතුමා, දැන් සිටින ජනාධිපතිතුමායි. එදා අගමැතිතුමා ඉදිරිපිටම මම ඉල්ලීමක් කළා, "අගමැතිතුමනි, 1977 ඉලෙක්ෂන් එකෙන් පස්සේ ඇති වූ සිද්ධීන් ගැන විභාග කරන්න" කියා. එවිට, තුන් මාසයක් යන්න පෙර ඒ සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන්නට කොමිටියක් පත් කරන බවත් යම්කිසි වරදක් කර තිබෙනවා නම් ඒ අයට කොමිටිය මගින් දඬුවම් ලබා දෙන බවත්, ඒ වරද කළ අයගේ වස්තුවෙන් හරි වන්දි ගෙවීමක් කරන්න කටයුතු කරන බවත් එදා නම් එතුමා අවංකවම කිව්වා. ඒ අනුව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

කොමිටියක් පත් කළා. ඒ කොමිටිය මඟින් විභාග කර ගෙන ගියා. එසේ විභාග කර ගෙන යැම අතරමගදී නවත්වන්නට හේතුව මොකක්ද ? මා මෙය පුන-පුනා ඇහුවා. ඒ කොමිටියට මොකක්ද වුණේ ? ඒ කොමිටිය තිබෙන බවත්, ඒ කොමිටිය මඟින් විභාග කරගෙන යන බවත් අගමැතිතුමා රජය වෙනුවෙන් හතර වතාවක්, පස් වතාවක් ප්‍රකාශ කළා. නමුත් දැන් ඒ කොමිටියේ හඬවත් නැහැ.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
සිරිවර්ධන කොමිටිය.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඔව්, සිරිවර්ධන කොමිටිය. සිරිවර්ධන කොමිටියේ ඒ වාර්තාව හෙළිදරව් කළේත් නැහැ. ඒ කොමිටිය තියනව ද නැද්ද කියන එක දන්නේත් නැහැ. ඒ කොමිටිය මැරුණා ද කියන එක දන්නේත් නැහැ. කොමිටියට මොනවා කළා ද කියා දන්නේත් නැහැ. එය වැළලුවා ද දන්නෙත් නැහැ.

කථානායකතුමා
(சபாநாயகர் அவர்கள்)
(Mr. Speaker)

Order, please ! The Deputy Speaker will now take the Chair.

අනතුරුව කථානායකතුමා මූලාසනයෙන් ඉවත්වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [නෝමන් වෛද්‍යරත්න මහතා] මූලාසනාරූඪ විය.

அதன் பிறகு, சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று நீங்கவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [திரு. நோமன் வைத்ய ரத்ன] தலைமை வகித்தார்கள்.

Whereupon MR. SPEAKER *left the Chair, and* MR. DEPUTY SPEAKER [MR. NORMAN WAIDYARATNA] *took the Chair.*

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

නියෝජ්‍ය කථානායකතුමනි, මම කියාගෙන ආවේ—

සිරිල් මැතිව් මහතා (කර්මාන්ත හා විද්‍යා කටයුතු ඇමතිතුමා)
(திரு. சிறில் மத்திவ் — கைத்தொழில், விஞ்ஞான அலுவல்கள் அமைச்சர்)
(Mr. Cyril Mathew–Minister of Industries & Scientific Affairs)

1970 පශ්චාත් මැතිවරණ සිද්ධීන් පිළිබඳ කමිටු වාර්තාව කෝ ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම හිතන හැටියට, ඒකත් කර්මාන්ත අමාත්‍යාංශයේ සේප්පුවක දමලා තිබෙනවා. " ස්ටීල් කෝපරේෂන් " එක අයිති කර්මාන්ත අමාත්‍යාංශයටයි. ඒ " කෝපරේෂන් " එකේ සේප්පුවක ඒ ඔක්කෝම කොමිටි වාර්තා, කොමිසම් වාර්තා දමා තිබෙනවා.

1977 මැතිවරණයෙන් පස්සේ ඇති වුණු සිද්ධීන්වලදී ආණ්ඩුවේ දේශපාලන විරුද්ධවාදීන්ට, නොයෙකුත් විධියේ අතවරවලට මුහුණ පාන්න සිද්ධ වුණා. සමහර දෙනෙක් ඒ සිද්ධීන්වලදී මැරුම් කැවා. සමහර අයගේ ගෙවල් කැඩුවා. සමහර අය රක්ෂාවල් කළ තැන්වලින් එළවා දැම්මා. සමහර වැඩපොළවල්වල ගේට්ටු ළඟ—' ඒ අයට කෙළින්ම " තගස්ලා " කියන්න හොඳද මන්දා—මැරවර පිරිස් දැම්මා. ඒ අය තමන්ගේ දේශපාලන විරුද්ධවාදීන්ට ඒ වැඩපොළවලට ඇතුළු වන්න ඉඩ දුන්නේ නැහැ. ඒ හේතුව නිසා, රක්ෂාවට යන්න බැරි නිසා අර අය රක්ෂාවලින් අස් වුණා. ඒ විධියට රක්ෂා අහිමි වුණු අයට කෝ, විසඳුම් ?

ඒ නිසා අපි ආණ්ඩුවෙන් බොහොම බයාදු ලෙස ඉල්ලුවා, ඒවාට විසඳුම් ලබා දෙන්නය කියා. ඒ ප්‍රශ්නවලට විසඳුම් ලබා දුන්නේ නැත්නම් ඒ ප්‍රශ්න පැටව් ගසා කවදා හෝ මේ රටේ ලොකු කලබැගෑනියක් ඇති කරනවාය කියන එකත් අපි පෙන්වා දුන්නා.

ඒ වාගේම 1979 දීත් සිද්ධීන් වගයක් ඇති වුණා. ඒ සිද්ධීන් සම්බන්ධයෙන් මේ ආණ්ඩුව කොමිටි, කොමිසම් පත් කළා. ඒ එක කොමිටියකවත්, එක කොමිසමකවත් වාර්තාවක් ක්‍රියාත්මක වුණාද ? නැහැ.

අනෙක් අතට සන්සෝනි කොමිසමට මොකද, වුණේ ? උතුරු හා නැගෙනහිර පළාත්වල ඇති වුණු සිද්ධීන් සම්බන්ධයෙන් තමයි, ඒ කොමිසම පත් කෙරුණේ. ඇත්ත වශයෙන්ම ද්‍රවිඩ ජනතාවට පමණක් නොව ඒ අවස්ථාවේදී සිංහල හා මුස්ලිම් ජනතා කොටස්වලටත්, නොයෙකුත් අතවරවලට මුහුණ දෙන්න සිදු වුණා. ඒ ගොල්ලන්ගේ ගෙවල්-දොරවල් කඩා දැම්මා. ඒ කොහොම වුණත් සිංහල-දෙමළ දෙපිරිස අතර ඇති වුණු පොර බැදීම උඩ නොයෙකුත් හානි සිදු වුණා. ඒවා ගැන විභාග කරන්න යයි ඉල්ලා සිටියා. එම නිසා ඒවා ගැන විභාග කරන්න සන්සෝනි කොමිසම පත් කළා. ඒ කොමිසම අවුරුදු දෙකක් විතර ඒ පිළිබඳව විභාග කළා. ඒ සඳහා රුපියල් ලක්ෂ ගණන් වියදම් වුණා. ඒ කොමිසමේ වාර්තාවත් පිට වුණා. නමුත් ඒ වාර්තාව ක්‍රියාත්මක වුණේ නැහැ. ඒ වගේම, වරද කළ අයට දඬුවම් කෙරුණේත් නැහැ. කෝ, ' ජස්ටිස් ' ?

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
ජස්ටින්ද ? ජස්ටින් ගෙදර.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

කෝ, අධිකරණය ? කෝ, යුක්තිය ? ඇත්ත වශයෙන්ම යුක්තිය ඉෂ්ට වෙලා නැහැ. යුක්තිය ඉෂ්ට නොවන විට ත්‍රස්තවාදය ඔළුව උස්සනවා. තමන්ට සාධාරණය ඉෂ්ට නොවන විට තමයි, ඕනෑම කෙනෙක් ත්‍රස්තවාදය අතට ගන්නේ. [බාධා කිරීම්] **You keep quiet. Do not disturb me.**

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
ගිය මාසේ කී දේවල් දැනුත් කියනවා. [බාධා කිරීම්]

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

නියෝජ්‍ය කථානායකතුමනි, මම කියාගෙන ආවේ, තුන දෙනෙකුට අසාධාරණ සිදු වුණාය කියායි. ඒ අසාධාරණ සම්බන්ධයෙන් කොමිටි, කොමිසම් පත් කෙරුණා. නමුත් මෙතෙක් ඒ කොමිටි, කොමිසම් කිසි එකක වාර්තා ක්‍රියාත්මක කළේ නැහැ.

ඊළඟට පසුගිය අවුරුද්දේ කලබල ඇති වුණා. ඒවායේ ප්‍රතිඵල මොකක්ද ? ඇත්තවශයෙන්ම ඒ කලබලවලට මුහුණ පෑ ද්‍රවිඩ ජනතාව ගැන අප අනුකම්පා කරන්න ඕනෑ. මුලින්ම, ඉන්දියානු සම්භවය ඇති වතුකරයේ ද්‍රවිඩ ජනතාවට ගැහුවා ; නොයෙක් විධියේ හිරිහැර කළා. ඒ අයගේ ලැයිම් කැඩුවා. ඒ සිද්ධීන් ගැන පරීක්ෂණ පැවැත්වුණාද ? පැවැත්වුණු පරීක්ෂණවල අවසාන ප්‍රතිඵලය මොකක්ද ? ඒ අයට සාධාරණයක් ඉෂ්ට වුණාද ? වැරදි කළ අයට දඬුවම් දුන්නාද ? වැරදි කරන අයට දඬුවම් දෙන්නේ නැත්නම්, ඒ වැරදි වසා ගන්නවා නම් සාධාරණය ඉෂ්ට වන්නේ නැහැ. එහෙම නම් සිදු වන්නේ අසාධාරණයයි. සාධාරණයයි. සාධාරණයක් නැති රටක අසාධාරණය රජ කරනවා. සාධාරණය පලා යන විට එන්න-එන්නම අසාධාරණය රජ කරන බව අමුතුවෙන් කියන්නම ඕනෑ නැහැ. එවිට ජනතාව භය නැතිව වැරදි කරනවා.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
කෝ, 'ජස්ටිස්' ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඇත්තවශයෙන්ම කියනොත් "මිනිස්ටර් ඔෆ් ජස්ටිස්" නැහැ. ඒ කියන්නේ ජස්ටිස් නැහැ. එයා දුවනවා. 1983 දී ඇති වුණු සිද්ධිය තමයි ලංකාවේ වුණු භයානකම සිද්ධිය. ඊට හේතු රාශියක් තිබෙනවා. පිරිස් දෙකක් දෙ පැත්තක ඉඳගෙන සමහර දෙනෙක් ජාතිවාදය ගැන කතා කරනවා; සමහර දෙනෙක් ජාතිවාදී ලෙස ක්‍රියාත්මක වෙනවා. උතුරු නැගෙනහිර ජනතාව, මා හිතන හැටියට අවුරුදු හතක් අටක් පමණ කල් ජාතිවාදය නැත්නම් කොමියුනල් ඇක්ටිවිටිස් අතුව ගියා. ඒ අය "අපි එනම ද්‍රවිඩ ජනතාවක්. අපි වෙනමයි ඉන්නේ. අපේ වැඩ වෙනමයි ඕනෑ. අනෙක් අය එක්ක අපේ සම්බන්ධයක්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තැහැ" කියන මතය අනුව ගියා. රජය ඒ ගැන නිශ්ශබ්ද වුණා. සමහර තැන්වලදී රජය ඒවාට ඇත්තවශයෙන්ම ධෛර්යය දුන්නා. ඒවා හරිය කියන තැනට කටයුතු කලා. ඒ අය ඒ ප්‍රදේශවල කළ වැරදි වැඩ, ඒ අයගේ සම්මන්ත්‍රණ පැවැත්වීම්, විදේශවලින් නොයෙක් පුද්ගලයන් ගෙන්නා සම්මන්ත්‍රණ පැවැත්වීම්, සංවිධාන පිහිටුවීම්, විශේෂයෙන්ම රජයේ ඉඩම් බලහත්කාරයෙන් ඇල්ලීම යන මේවා ගැන රජය නිශ්ශබ්ද වුණා. ඒ අනුව ඒ උදවිය සම්පූර්ණ වැඩ පිළිවෙලක් අරගෙන ඒ උඩ ඒ අයට ඕනෑ කරන වාතාවරණයක් හදනතුරු රජය ඒ ගැන නිහඩවීම තමයි ඒ අයට ධෛර්ය දීමක් වුණේ.

අද බලන්න ඇති වී තිබෙන තත්ත්වය. රජයේ ඉඩම් බෙදිය යුත්තේ නියම විධියට ඉඩම් කච්චේරි තබා ඒවා මගිනුයි. මේ ප්‍රදේශවල සිටින පුද්ගලයන්ට පුළුවන්කමක් නැහැ රජයේ ඉඩම් බලහත්කාරයෙන් අල්ලා ගන්න. රජයේ ඉඩමක් එහෙම බලහත්කාරයෙන් ඇල්ලුවොත් එයා ඒ ඉඩමෙන් අස් කරනවා. ඒ සඳහා නීතිය පාස්කර තිබෙනවා. නමුත් උතුරු නැගෙනහිර පළාත්වල බලහත්කාරයෙන් අල්ලාගත් ඉඩම් තිබෙනවා. පසුගිය අවුරුදු හය හත තුළම ඒක කෙරුණා. ඒක දන්නවා හුගාක් දෙනා. ඒ අය රජයට තොරතුරු සැපයුවා. රජය නිහඩ වුණා. ඇයි? ඡන්දය ගන්න ඕනෑ නිසා. මේ ඡන්දය ගැනීම උඩ තමයි රටේ මේ තරම් කලබැගෑනියක් අද ඇති වී තිබෙන්නේ; මේ තරම් භයානක තත්ත්වයකට රට ඇවිත් තිබෙන්නේ. හැම දෙනාම කියන්නේ, අපි ඒ අයට විරුද්ධව වැඩ කරන්න ගියොත්, ඒ අය කරන වැරදි වැඩ නතර කරන්න ගියොත් අපට ඡන්ද ටික නැති වෙනවාය කියායි. මේක වැරදියි. ඔය විදියේ සිද්ධීන් නිසා තමයි මේ තරම් තත්ත්වයකට රට ඇවිත් තිබෙන්නේ. තමුන්නාන්සේලා තවමත් ඒ වැරදි එහෙමම කරනවා.

පසුගිය දවස්වල සිදුවුණු ගුරු පත්වීම් දීම ගැන බලන්න. ගුරුවරුන් බඳවා ගැනීම සඳහා එස්. එස්. සී. හා එච්. එස්. සී. සමත් වුණු අයට විභාගයකට එන්නය කියා, විභාග දෙපාර්තමේන්තුව විභාගයක් පැවැත්තුවා. සමත් වුණු අයට පත්වීම් දෙන්නය කිව්වා. නමුත් පසුව පත්තරවල එහෙම අපි පැහැදිලිව දැක්කා සමහර දේශපාලකයෝ ඒ සමත් වුණු අය හාරසියයකගේ පන්සියකගේ පමණ නම් කපා දමා පත්වීම් දුන්නේ නැති බව. දැන් අධ්‍යාපන දෙපාර්තමේන්තුවත් අධ්‍යාපන ඇමතිතුමාත් කියනවා, ඒවා කවුරු කලාදැයි දන්නේ නැත, ඒවා හරිගස්සනවාය කියා.

මේ විධියේ වැඩ කරන නිසා දැන් එග්සැමිනේෂන් ඩිපාර්ට්මන්ට් එක හරියට කළුකඩයක් වාගේ වෙලා. මොකද ? ප්‍රශ්නපත්‍ර පිට වෙනවා. ඒවාට ඕනෑ කරන උත්තර පත්තරත් පේව්මන්ට් එකේ විකුණනවා. [බාධා කිරීමක්] මම දන්නේ නැහැ කවුද දුන්නේ කියල. මට කියන්න බැහැ. එහෙම නම් තමුන්නාන්සේ ඒවා ඩිටෙක්ට් කරන්න. කොහෙන් විකුණනවද, මොනවා වුණාද මම දන්නෙ නැහැ. තමුන්නාන්සේ කියන්න. එග්සැමිනේෂන් ඩිපාර්ට්මන්ට් එක මේ තරම් තත්ත්වයකට බැස තිබෙනවා. ඩිවැලිව් වෙලා තිබෙනවා. රුපියල් විතරක් නොවෙයි ඩිවැලිව් කරලා තිබෙන්නේ. අධිකරණයත් ඩිවැලිව් කරලා. එග්සැමිනේෂන් ඩිපාර්ට්මන්ට් එකත් ඩිවැලිව් කර තිබෙනවා. උත්තර පත්තරත් ඩිවැලිව් කර තිබෙනවා. මේක හැම තැනකම තිබෙන "ඩිවැලුවේෂන්" එක. බාල්දු කිරීම. රුපියල පමණක් නොවෙයි හැම එකක්ම බාල්දු කරල. හැම තැනම ඒ තරමට ලිහිල් කර තිබෙනවා. විභාග දෙපාර්තමේන්තුවත් අර "ඕපන් මාකට්" එකට ගිහින්. විභාග දෙපාර්තමේන්තුවත් ප්‍රශ්න පත්‍රත් උත්තර පත්‍රත් විවෘත ආර්ථිකයට බැහැල.

මේ විධියේ තත්ත්වයකට වැටී තිබෙනවා, අධිකරණය පවා. සාධාරණය සහ යුක්තිය නැහැ. විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න පත්‍ර වෙළඳ පොළේ විකුණනවා නම් ඒක සල්ලිකාරයින්ට ගන්න පුළුවන් නම් ඒක අරගෙන විභාගවලට උත්තර දෙන්න පුළුවන් නම් සාමාන්‍ය මහජනතාව කල්පනා කරන්නේ කොහොමද ? දැන් විභාගවලට ඉඳල වැඩක් නැහැ. රුපියල් පනහකට නොවෙයි රුපියල් පන්සියයකට හරි ප්‍රශ්න පත්‍රය අරගෙන විභාගයෙන් සමර්ථ වෙන්න ඕනැය කිය කියා ඒ අයත් කල්පනා කරනවා. ඒ විධියේ තත්ත්වයට රට වැටී ගෙන යනවා.

1983 සිද්ධීන් සම්බන්ධවත් ඉතිහාසය ගැනත් ගරු ජනාධිපතිතුමා අද මෙතැන ප්‍රකාශයක් කලා. ඒ ගැන අපට වාදයක් දෙනවාය කිව්වා. ඒ දවසට ඒ සම්බන්ධව වාද කරන්නට අපි සූදානම්. නමුත් මා කියන්නේ මේකයි. 1983 ජූලි මාසයේදියි ඒ සිද්ධීන් ඇතිවුණේ. ඒවා ඇති වී දැන් හය මාසයකටත් වැඩි කාලයක් ගත වී තිබෙනවා. නමුත් අද දක්වා ඇයි ඒවා ගැන සොයන්න කොමිෂමක් පත් නොකළේ ? 1983 ජූලි 29 වැනිද ජනාධිපතිතුමා ටෙලිවිෂන් එකේ පෙනී සිටිමින් ප්‍රකාශයක් කලා, ඒ සම්බන්ධව වහාම පරීක්ෂණ පවත්වනවාය, කවුරු වුනත් කමක් නැහැ, වැරදි කර තිබෙනවා නම් ඒ අයට දඬුවම් දෙනවාය කියා. ටෙලිවිෂන් එක මගින් මෙන්ම ගුවන් විදුලියෙනුත් පත්‍ර මාර්ගයෙනුත් ජනාධිපතිතුමා ඒ ප්‍රකාශය කලා. නමුත් අද දක්වා එය වී නැහැ. මේ රටේ කවුරු මේ වැරදි කලාද කියා අපි දන්නේ නැහැ. සමහර විට විදේශීය රටකින් මිනිසුන් ඇවිත් මේ වැරදි කලාද කියාත් අපට හැගෙනවා. කවුරු කල කොල්ලෝප්පම් කලාද, මිනිසුන් මැරුවාද, ගෙවල් ගිනි තිබ්බාද, මංකොල්ල කෑවාද කියන එක කිසිම කෙනෙක් නොදන්නා තත්ත්වයක් තිබෙනවා.

එතකොට ඒ වැරදිවලට ලක් වූ පුද්ගලයන්—" වික්ටිම්ස් " ලා අද සුසුම් හෙළනවා. අපේ වස්තුව කොල්ලකෑවා, අපේ මිනිස්සු මැරුවා, මගේ පුරුෂයා මැරුවා, මගේ භාර්යාව මැරුවා, මගේ දරුවා මැරුවා, මගේ කාර් එකට ගිනි තිබ්බා, මගේ ගෙට ගිනි තිබ්බා, මේවා කල මිනිසුන් සොයා ඇයි ඒ අයට දඬුවම් නොදෙන්නේ යනුවෙන් ඒ අය තුළ අදෝනාවක් තිබෙනවා. ඒ අයත් මේ රටේ මහජනතාවගෙන් කොටසක්. මේ රටේ ජාතියේ කොටසක්. ඒ අයට කල අසාධාරණය සොයන්නේ නැත්නම් ඒවාට විසඳුම් දී අසාධාරණකම් කල අයට දඬුවම් දෙන්නේ නැත්නම් ත්‍රස්තවාදී ක්‍රියා වැඩි වෙනවාය කියන එක පුදුමයක් නොවෙයි. කොහොමද මේක විසඳන්නේ? තමන්ට යුක්තිය ඉෂ්ට වන්නේ නැත්නම් තමන්ට කළ වැරදිවලට වැරදිකරුවන්ට දඬුවම් පමුණුවන්න ක්‍රමයකුත් නැත්නම් ඒක රජය මගින් කරවා ගන්නට බැරි නම් ඊළඟට ඒ අය ගන්නේ යම් විධියක දරුණු වැඩ පිළිවෙළක්. ඒ නිසා තමයි එන්න එන්නම තත්ත්වය දරුණු වෙන්නේ.

1983 ජූලිවල තිබුණු තත්ත්වයට වඩා අද තත්ත්වය දරුණුයි. අද ත්‍රස්තවාදී ක්‍රියා දරුණුයි. දැන් එදාට වඩා වෙනස් විධියේ ත්‍රස්තවාදී ක්‍රියාවල යෙදෙන්නේ. ඒ අය සම්පූර්ණයෙන්ම මංකොල්ල වැඩවලට බැහැල ඉන්නවා. දැන් බලන්න බැංකු කීයක් කැඩුවාද ? හැම තැනම බැංකු කඩනවා. සමූපකාර සමිතිවල මුදල් හොරකම් කරනවා. මිනිසුන්ට බස් එකක නැගල යන්න බැහැ. කාර් එකක යන්න බැහැ. තුවක්කු දික් කරල කාර් එක උදුරා ගෙන යනවා. බස් එක උදුරා ගෙන යනවා. කිසිම බයක් සැකයක් චකිතයක් නැතිව එළිමහනෙම ත්‍රස්තවාදීන් බැංකුවලට පනිනවා. කොළඹ කොල්ලුපිටියෙත් මංකොල්ලයක් වුණා. එතකොට උතුරේ පමණක් නොවෙයි ත්‍රස්තවාදය ගෙන යන්නේ. දකුණේත් ත්‍රස්තවාදය ගෙන යනවා. දකුණේත් ත්‍රස්තවාදය ටිකෙන් ටික වැඩි වෙනවා. උතුරේ විතරක් නොවෙයි, දකුණෙත් තැන් තැන්වල මේ විධියේ දේවල් සිදු වෙනවා ඒ විධියේ සිද්ධියක් තලවාකැලෙත් වුණා. හදිසි නීතිය ඇති වෙන්න ඇති වෙන්න, හදිසි නීතිය ක්‍රියාත්මක වෙන්න, ක්‍රියාත්මක වෙන්න දකුණටත් ත්‍රස්තවාදය එනවා නම් ඒකට හේතුව උතුරු හා නැගෙනහිර සිද්ධීන් පමණක් නොවෙයි. මේකට හේතුව මිනිසුන්ට ජීවත් වීමට තිබෙන අපහසුවයි.

තමුන්නාන්සේලා පසුගිය අයවැය ලේඛනයෙන් මොකක්ද කලේ ? මහජනයාත්, පත්තර වලිනුත්, වෘත්තීය සමිති වලිනුත්, අනිකුත් සංවිධාන වලිනුත්, දේශපාලන පක්ෂවලින් හා සංවිධාන වලිනුත් රජයේ සේවකයන්ගේත් පෞද්ගලික අංශයේ අනිකුත් සේවකයන්ගේත් පඩි වැඩි කරන ලෙස හැම තැනකදීම කියා සිටියා. ජීවත් වෙන්න තිබෙන අපහසුව නිසා කීයකින් හෝ පඩි වැඩි කරයි කියා හැම කෙනෙක්ම බලාපොරොත්තු වුණා. පොල් ගෙඩිය රුපියල් හතරට, හතරයි ශත පනහට වැඩි වුනා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

රුපියල් හයයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒ අද. නමුත් අයවැය ලේඛනය ඉදිරිපත් කරන වෙලාවේ රුපියලට, එකයි විසිපහට තිබුණු පොල් ගෙඩිය රුපියල් හතරට, හතරයි පනහට නැංගා. ලාම්පු තෙල් මිල වැඩිවුනා. පොල් තෙල් මිල වැඩි වුනා. පෙට්‍රල් ගාස්තුව වැඩි වුනා. ගමන් ගාස්තු වැඩි වුනා. මුද්දර ගාස්තුව වැඩි වුනා. එයින් ජීවන වියදම වැඩි වුනා. ඒ වැඩි වෙන විට ජීවත් වෙන්නට තිබෙන අමාරුකම නිසා ජීවන බර අඩු කර ගැනීම පිණිස යම්කිසි විධියක දීමනාවක් පිළිබඳව රජය කල්පනා කරයි කියා ජනතාව බලාපොරොත්තු වුනා. නමුත් වුනේ මොකක්ද? දීමනාවක් දෙනවා වෙනුවට ලැබෙන පඩියෙනුත් සියයට එකක් කපන්නට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

පටන් ගත්තා. රුපියල් දහක් පඩි ලැබෙන කෙනෙකුගෙන් රුපියල් දහයක් කපනවා. රුපියල් දෙදහක් පඩි ලබන කෙනෙකුගෙන් රුපියල් විස්සක් කපනවා. රුපියල් දෙදහස් පන්සියයක් පඩි ලබන කෙනෙකුගෙන් රුපියල් විසි පහක් කපනවා. මෙන්න මේකයි කරපු වැඩේ. හරියටම ගහෙන් වැටුන මිනිහාට ගොනා ඇන්නා වගේ වැඩක් මේක. තවත් බරක් ඒ සේවකයන්ගේ පිටටම පැටෙව්වා. එතකොට ඒ සේවකයන් මේ මුදල් කොහෙන්ද හම්බ කරන්නේ ? මෙන්න මේ හේතුව නිසා අද කිසිම කන්තෝරුවකට ගිහින් වැඩක් කර ගන්නට බැරි තත්වයක් ඇති වී තිබෙනවා. සාධාරණව වැඩ කරන පුද්ගලයින් අතරින් පතර ඉන්නවා. මම නැහැයි කියන්නේ නැහැ. අද කන්තෝරුවකට ගිහින් හිඟ මුදලක්—" එරියර්ස් " එකක්—ලබා ගන්නට ගියොත් ඒකෙන් යම්කිසි කොටසක් කීප දෙනෙකුට පුද පූජා හැටියට දෙන්නට ඕනැ. නැත්නම් ඒක කර ගන්න බැහැ.

ඒ විධියේ තත්වයක් අද ඇති වී තිබෙන බව හැම කෙනෙක්ම වාගේ කියනවා. යම්කිසි දෙයකට ඉල්ලුම් පත්‍රයක් ලබා ගන්නට බැහැ. මේ තරම් තත්වයකට අද පරිපාලනය බාල්දු වී තිබෙනවා. මේවා හරිගස්සන්නට තමුන්නාන්සේලාට කරන්නට තිබෙන්නේ හදිසි නීතිය දීර්ඝ කරන එක නොවෙයි. රජය කාටත් සාධාරණව සලකන්නට ඕනැ. ප්‍රශ්ණ විසඳන්නට ඕනැ. 1977 ඉඳලාම යටපත් කළ ප්‍රශ්ණ විසඳීම සම්බන්ධයෙන් යම්කිසි තීරණයක් ගන්න ඕනැ. එහෙම තීරණයක් අරගෙන ඒ ප්‍රශ්ණ විසඳන්න ඕනැ. සාධාරණ විසඳුම් දෙන්න ඕනැ. අපි එද ඉඳලාම කිව්වේ කොයි පැත්තෙ කෙනෙක් වුණත් වැරදි කරලා තිබෙනවා නම් අල්ලා ගන්න කියන එකයි. එවැනි දේවල් සම්බන්ධයෙන් සාධාරණ විනිශ්චයක් දෙන්න. යම් කෙනෙක් වැරදිකරුවෙක් හැටියට උසාවියකදී ඔප්පු වෙනවානම් ඔහුට දිය යුතු නියම දඬුවම දෙනවා මිසක් ඊට වැඩි දඬුවමක් දෙන්න වුවමනා නැහැ. සාධාරණ විනිශ්චයක්, සාධාරණ දඬුවමක් දිය යුතුයි. එය රජයක තිබෙන වගකීමක්. රජයකට තිබෙන බලයක්. එය ක්‍රියාත්මක විය යුතුයි. වැරදිකරුවන්ට දඬුවම් දෙන එක නවත්වන්න කියා අපි කියන්නෙ නැහැ.

ඊළඟට හැම දෙනාටම එකාකාරව සලකනවාය කියන ප්‍රතිපත්තියක් ආණ්ඩුවට ඇත්තේ නැහැ. එද ඉඳලාම අපි මෙය කියනවා. රැකිරක්ෂා දෙන පිළිවෙල බැලුවොත් එය එක කොටසකට පමණක් සීමා වෙලා තිතබෙනවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

තව කොපමණ වේලා කතා කරන්න ගන්නවාද ?

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

තව මිනිත්තු පහලොවක් පමණ ගන්නවා.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

පුළුවන් තරම් අඩු කරන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඔව් ! පුළුවන් තරම් අඩු කරනවා. සමහරවිට මිනිත්තු පහකිනුත් ඉවර කරන්න පුළුවන්.

"ජොබ් බැන්ක්" කියා එකක් ඇති කළා. අපි ඒකට සම්පූර්ණයෙන්ම විරුද්ධ වුණා.

එච්. එම්. ඒ ලොකුබණ්ඩා මහතා (ගල්ගමුව)
(திரு. எச். எம். ஏ. லொக்குபண்டா — கல்கமுவ)
(Mr. H. M. A. Lokubandara-Galgamuwa)

හදිසි නීතිය ඒකට සම්බන්ධ වෙන්නේ නැහැ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ගල්ගමුවේ ගරු මන්ත්‍රීතුමා නිසා මම එතුමාට මොකුත් කියන්නේ නැහැ. මේවාත් හදිසි නීතියට උපයෝගී වුණ දේවල්. හදිසි නීතිය ඇති වුණේ "ඊක්වල් ට්‍රීට්මන්ට්" නැති නිසයි. රජයට සමාන සැලකිලි ඇත්තෙ නැහැ. මේ රජය එය මුල ඉඳලාම වුවමනාවෙන්ම මග හැරියා. රජයක් හැටියට බලාපොරොත්තු වුණේ එකම එක පක්ෂයක් නඩත්තු කිරීම පමණයි. අනිකුත් ජන කොටස් ලංකාවේ ඉන්න බව අමතක වුණා. ඒ නිසා තමයි මේ සිද්ධීන් පැන නැගුණේ. රැකියා සම්බන්ධයෙන් ඇති වී තිබෙන තත්ත්වය ගැන බලන්න. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ වේවා, එක්සත් ජාතික පක්ෂයේ වේවා, සමසමාජ පක්ෂයේ වේවා, කොමියුනිස්ට් පක්ෂයේ වේවා මේ රටෙ ජීවත් වන ඕනෑම පුද්ගලයෙක් යම්කිසි අධ්‍යාපනයක් ලබා ඉගෙනගෙන රැකියාවක් කරන්නට සුදුසුකම් ලබා තිබෙනවා නම්, රැකියාවක් කරන්නට ශක්තිය තිබෙනවා නම්, ඔහුට මේ රටේ හොඳින් ජීවත් වෙන්න නම් යම්කිසි රැකියාවක් අවශ්‍යයි. නැත්නම් ඉතින් නරක අතට හැරෙන්න ඕනැ. ත්‍රස්තවාදී කල්ලියට එකතු වෙන්න ඕනැ. ත්‍රස්තවාදියෙකු හැටියට ඉන්නවා නම් ඔහුට රැකියාවක් ඕනැ නැහැ. ඉගෙන ගත්ත කෙනෙකුට වුණත් ත්‍රස්තවාදී කල්ලියට යනවා නම් රැකියාවක් අවශ්‍ය නැහැ. ඒ විධියට වැඩි දෙනෙක් ත්‍රස්තවාදයට තල්ලු වෙනවා. ත්‍රස්තවාදී කල්ලියට එකතු වෙනවා.

රැකියා ලබා දීම තමන්ගේ පක්ෂයේ අයට පමණක් සීමා කර ගත්තා. 'ජොබ් බැන්ක්' එකක් හදගත්තා. මේ 'ජොබ් බැන්ක්' එක කොයි තරම් අසාධාරණද කියල මම කීප වතාවක්ම පෙන්නා දී තිබෙනවා. කීප වතාවක්ම මම ඒ ගැන මේ සභාවේදී කථා කළා. මේ විධියට කටයුතු කරන්න එපා, ඉදිරියේදී ඒවායේ විපාක ලැබෙන්න පුළුවන් කියා මම තමුන්නාන්සේලාට කියා තිබෙනවා. රැකියා බැංකුවලින් රැකියා ලබා දීම එක් පක්ෂයක උදවියට පමණක් සීමා කළා. ඒ ඒ මන්ත්‍රීවරුන්ගේ 'රෙකමන්ඩේෂන්' එක උඩයි රැකියා දුන්නේ. මෙහෙමත් විහිලුවක් තවත් තිබෙනවාද? ප්‍රසිද්ධියේම මේ විහිලුව කළා. හැංගි හොරා කරනවා නම් තව කමක් නැහැ. 'අපේ පක්ෂයේ අයට පමණයි' කියා ප්‍රසිද්ධියේම කියනවා. එය වැරදියි. ඒ වැරදි නිසා තමයි අද තමුන්නාන්සේලාට ගොඩ එන්න බැරි වී තිබෙන්නෙ.

මෙන්න මේ විධියට කළා නම් හරි කියා අපි කියනවා. තමුන්නාන්සේලාගේ පක්ෂයට—එක්සත් ජාතික පක්ෂයට—සියයට 80 යි. අනික් පක්ෂවලට—විරුද්ධ පක්ෂවලට—සියයට 20 යි. අන්න ඒ විධියට කළා නම් එතැන සාධාරණයක් තිබෙනවා. නමුත් එහෙම කළේ නැහැ. මෙතැනදී තුන් තේරුමෙන් තෝරලා බලනවා. 'ජොබ් බැන්ක්' එකේ පෝර්ම කොළ දෙන්නෙ කොහොමද? ඔහු එක්සත් ජාතික පක්ෂයේද? ඔහු එක්සත් ජාතික පක්ෂයට හොඳට වැඩ කර තිබෙනවාද? ඔහු හොඳ පාක්ෂිකයෙක්ද? අන්න ඒ විධියට බලා තමයි 'ජොබ් බැන්ක්' පෝර්ම කොළ බෙදුවෙ. එය වැරදියි. අන්න ඒ වැරදිවල විපාක තමයි දැන් ලැබෙන්නෙ. මේ ක්‍රමය නිසා රැකියාවක් ලබා ගන්න බැරි වුණු අය අද මොනවාද කරන්නෙ? ඔහුට ජීවත් වෙන්න ක්‍රමයක් නැත්නම් අන්තිමේදී නරක මාර්ගයක් වුණත් අරගන්නවා. එහි ප්‍රතිඵල හොඳ වුණත් නරක වුණත් කරන්න දෙයක් නැහැ. දැන් සිදු වී තිබෙන්නෙ එයයි. වැඩි දෙනෙක් ඒ තත්ත්වයට වැටෙනවා. දකුණේත් වෙන්නෙ ඒ ටිකමයි.

1971 කැරැල්ල මෙහෙයවන ලද පිරිසක් ත්‍රස්තවාදීන් හැටියට අල්ලා ගත්තා. ඒ අයට විරුද්ධව නඩු දමා ඒ උදවිය කළ වැඩේ වැරදියි කියා උසාවිය මගින් ඒ අයව හිරේට දැම්මා. මේ ආණ්ඩුව බලයට ආවාට පසුව එක පාරටම ඒ අය නිදහස් කළා. ඒ නිදහස් කිරීමට අපි විරුද්ධ වුණා. "ඔය වැඩේ කරන්න එපා, ඔය කරන වැඩේ විපාක තමුන්නාන්සේලාට ලැබෙයි" කියල අපි එද කිව්වා. දැන් ඒ උදවිය නිදැල්ලේ හැසිරෙනවා. ඒ මිනිසුන් දැන් පෙනෙන්නවත් නැහැ. පේන්න නැති වුණත් ත්‍රස්තවාදී ක්‍රියා කරන්න ඒ අයට පුළුවන්. ත්‍රස්තවාදියාට සමාජයේ හොඳ මුහුණක් පෙන්නා ගෙන ඉන්න පුළුවන්. නමුත් ඔහු හොරකම් කිරීම හෝ දරුණු ක්‍රියා කරන්නෙ කාටවත් පේන්න නොවෙයි. ඒවා කරන්නෙ ක්‍රමානුකූලවයි. ඒ විධියේ පුහුණුවක් ඔවුන්ට තිබෙනවා. අද මොකක්ද සිදුවෙලා තිබෙන්නෙ? අද ආණ්ඩුවට බේරෙන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. ඒ සියලුදෙනාම අද ත්‍රස්තවාදීන්ට එකතු වී ඉන්නවා. ඒ අයත් දැන් ත්‍රස්තවාදී කටයුතුවලට හවුල් වෙනවා. නීතියෙන් ඒ අයව නවත්වන්න පුළුවන්ද? බැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

රැකියා සම්බන්ධයෙන් මා නැවත වරක් මතක් කරන්න කැමතියි. මේ 'ජොබ් බෑන්ක්' එක නැත්නම් රැකියා බැංකුව අහෝසි කරන්න. සුදුසුකම් තිබෙනවා නම්—අර අධ්‍යාපන අමාත්‍යාංශය කළා වාගේ—දේශපාලනඥයින්ගේ ඇඟිලි ගැසීම් වලින් තොරව ඕනෑම කෙනෙකුට රක්ෂාවක් ලබා ගැනීමට අවස්ථාව සලසා දෙන්න. සුදුසුකම් උඩ රැකියා ලබා දෙනවා නම් අන්න අර 'රයිට් ටූ වර්ක්' කියන එක එනවා. වැඩ අයිතිය හැම දෙනාටම සාධාරණව බෙදෙනවා. අන්න ඒකයි ඕනෑ කරන්නෙ.

ඊළඟට ඉඩම් බෙදීම කෙරෙන්න ඕනෑත් ඒ විධියටයි. සාධාරණව ඉඩම් බෙදීම කරන්න ඕනෑ. ඉඩම් කච්චේරි පවත්වා ඉඩම් නැති අයට ඉඩම් බෙද දෙන්න ඕනෑ. ඒ ක්‍රමය සාධාරණයි. ඉඩම් කච්චේරි පැවැත්වීමේදී සුළු සුළු අක්‍රමිකතා සිද්ධ වෙන්න පුළුවන්. නමුත් යම්කිසි ක්‍රමයක් අනුවයි එය කෙරෙන්නෙ. සම්මුඛ පරීක්ෂණයක් පවත්වනවා. නිලධාරීන් කීප දෙනෙක් එනවා. ඒ නිලධාරීන් ඉදිරියේ තමන්ගේ තත්ත්වය පහැදිලි කරනවා. ඒ අනුව සුදුස්සන් තෝරා ඉඩම් බෙද දෙනවා. සමහර විට ලොතරැයි අදින්නත් සිදු වෙනවා. අන්න ඒ විධියට සාධාරණත්වයක් ඉටු කරනවාය කියා ආණ්ඩුවට පෙන්වන්න පුළුවන්කමක් තිබෙන්න ඕනෑ. අන්න ඒ විධියේ වැඩපිළිවෙලවල් අනුගමනය කරනවා නම් මේ ත්‍රස්තවාදී ක්‍රියා සහමුලින්ම නැති කර දමන්න පුළුවන්. එහෙම නැතිව 'ඉමජන්සි' එක තව අවුරුදු දහයකින් දීර්ඝ කළත් වැඩක් වෙන්නෙ නැහැ. හදිසි නීතිය දික් කරන්න, දික් කරන්න, නද නීති පනවන්න, පනවන්න පුද්ගලයන් තව තවත් දරදඬු වෙනවා. දරුණු ක්‍රියාවලට පෙලඹෙනවා. ඒ නිසා මේ තත්ත්වයට හදිසි නීතිය පිළියමක් නොවන බවයි අපි කියන්නෙ. එහෙම නැතිනම් කොහේටවත් යන්න බැරි විධියට, හෙල්ලෙන්නවත් දෙන්නෙ නැති වෙන්න, ඇඳිරි නීතිය පනවන්න. එනකොට කිසි කරදරයක් නැහැ. ඒ අයට දවල්වටත්, රැටවත් කොහේකටවත් යන්න බැහැ. හැබැයි කොහේටවත් යන්න විධියක් නැති නිසා, රජයට සිද්ධ වෙයි ඒ ප්‍රදේශවල අයට කන්න දේවල් ගෙදරවලටම ගිහින් දෙන්න. එච්චරයි කරන්නට තියෙන්නෙ.

නොයෙක් අන්දමේ වැරදි ක්‍රියා සිදු වෙනවා නම්, ඒසේ සිදු වන ප්‍රදේශවලට ඇඳිරි නීතිය හෝ පනවන්න. හදිසි නීතියත් ඒ අන්දමට පනවන්න පුළුවනි. ක්‍රියාත්මක කරන්න පුළුවනි. කෙසේ වුණත්, රජය ගෙන යන වැරදි ක්‍රියා මාර්ග වෙනස් කරන්නේ නැති නම්, නිවැරදි ක්‍රියා මාර්ග රජය අනුගමනය කරන්නේ නැති නම්, හදිසි නීති පැනවීමෙන් පමණක් ත්‍රස්තවාදය අතුගා දමන්නට පුළුවන් වෙනවාය කියා මම නම් කවදාවත් හිතන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම රට බෙදීම සඳහා ගන්නා ක්‍රියා මාර්ගවලදී, අපි එවැනි වැඩ පිළිවෙළට සම්පූර්ණයෙන්ම විරුද්ධ බවත්, වචනයකින්වත්, අකුරකින්වත් එවැනි දෙයකට අපි සහයෝගය දෙන්නේ නැති බවත්, ඒවාට කිසිසේත් උදව් දෙන්නේ නැති බවත්, අපි තරයේම ප්‍රකාශ කරන්න ඕනෑ. රට බෙදීමට විරුද්ධව රජය ගන්නා කවර ක්‍රියාමාර්ගයකට වුණත් අපි සහයෝගය දක්වනවා. එවැනි ක්‍රියා මර්දනය කරන්න ඕනෑ. කිසිම විධියකින් රට බෙදන්න කොයි කාටවත් ඉඩ දෙන්න බැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මහානායක හිමියන් විසින් කළ ප්‍රකාශයක් හැටියට වැරදි මතයක් එක්තරා පත්‍රයක පළ වී තිබුණා. පුරවැසිකම් නැති සියලු දෙනාටම පුරවැසිකම් දීමක් ගැන අදහසක් එහි පළ වී තිබුණා. මෙරට පුරවැසිකම් නැති ඉන්දියානු ද්‍රවිඩ ජනතාවට පුරවැසිකම් ලබා දෙනවාය කිව්වාම මෙවැනි ප්‍රකාශවලින් මේ රටේ කී දෙනෙක් ත්‍රස්තවාදීන් බවට හැරෙයිද? මෙය සාධාරණ කියමනක්ද? මොන මොන හේතු උඩද එවැනි දේවල් කියන්නෙ? මෙවැනි දේවල් කියන්නට පුළුවන් කාටද? ඇත්තවශයෙන්ම ඒ පිළිබඳව තීරණයක් කරන්න ඕනෑ මේ රටේ ජනතාවයි. ජනමත විචාරණයක් පවත්වා ජනතාවගේ කැමැත්ත විමසන්න ඕනෑ. පුරවැසිකම් නැති හැම දෙනාටම පුරවැසිකම් දිය යුතුය කියා යෝජනාවක් තිබෙනවා නම් ඊට ජනතාවගෙන් වැඩි දෙනෙක් කැමැත්ත පළ කළොත්, ඡන්දය දුන්නොත් ඒ අනුව ක්‍රියා කළාට වරදක් නැහැ. එහෙම නැතිනම් හැම දෙනාටම පුරවැසිකම් දෙන්න ඕනෑ යයි කීම කොයි තරම් භයානක කියමනක්ද ? මේවායින් නොවෙද රටේ ත්‍රස්තවාදී ක්‍රියා ඇති වෙන්නෙ?

ඒ පමණක් නොවෙයි, කොත්මලේ කොට්ඨාශයෙන් ඉවත් කරන ලද මිනිසුන් දහස් ගණනක් ඉන්නවා. ඒ අයට වන්නකින්වත් ඉඩම් කැබැල්ලක් ලබාගන්න දෙන්නෙ නැහැ. මෙයට සමහර පිරිසක් විරුද්ධයි. වන්දි ලබා ගත් අය තවමත් ඉන්නවා, ඉඩම් ලබා ගන්නට නැතුව. ලබා ගත් වන්දි මුදල් අවසන් වන තුරු ඒවායින් කකා ඉන්නවා. ඒ අයට තවමත් සාධාරණය ඉටු කර නැහැ. ඉඩම් කැබැල්ලක් ලබා දෙන්න කටයුතු කර නැහැ. ඒ අතරතුර ඉහළ මට්ටමින් දූත් සාකච්ඡා කරගෙන යනවා, හැම වත්තකම සිටින පුරවැසිකම් නැති හැම ද්‍රවිඩයකුටම අක්කර කාල බැගින් ලබා දෙන්නටය කියා. වෙනත් දවසක මේ ප්‍රශ්නය වෙනමම ගෙන විග්‍රහ කරන්නට මම බලාපොරොත්තු වෙනවා. මේවා ඇහෙන විට, මේ තොරතුරු පත්‍රවල පළ වන විට, මේ කාරණා ජනතාව දැනගන්නා විට, ජනතාවගෙන්, ජාති මමත්වයක් ඇති යම්කිසි පිරිසක් මේවායින් ඇවිස්සෙන්නේ නැද්ද ? මෙවැනි ක්‍රියා මාර්ග ගන්නා විට, එන්ට එන්ටම තව තවත් ත්‍රස්තවාදී ක්‍රියා ඇති වෙනවා නේද ?

හැම දෙනාම එකම අදහස නොවෙයි දරන්නේ. ජාති මාමකත්වය ඇති වුණාම සමහර විට වැඩි දෙනෙක් දරදඬු ක්‍රියාමාර්ග ගන්නට බැරිකමක් නැහැ. එම නිසා මේ වාගේ ලාමක ප්‍රකාශ නොකරන්නට, ලාමක වැඩ නොකරන්නට කල්පනාකාරී වෙන්න ඕනෑ. රජය හැම දෙයකටම වග කියන්න ඕනෑ. හැම දෙයක්ම බලා ගන්න ඕනෑ. ඒකට කරන්න දෙයක් නැහැ. රජය නිතරම මහජන මතය අනුව, හරි මාර්ගයේ ගමන් කරන්න ඕනෑ. මහජන මතය විමසන්න ඕනෑ අවස්ථාවලදී ජනමත විචාරණයක් තබන්න. මෙන්න මේ අදහසට කැමැත්ත ප්‍රකාශ කරන්න කියා ජනතාවට කියන්න පුළුවනි. ජනතාවගෙන් වැඩි දෙනෙකු පළ කරන මතය අනුව කිසිම භයක් නැතුව රජයට ක්‍රියා කරන්න පුළුවනි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි නැවතත් කොහොම හරි රට ගොඩනගන්න ඕනෑ. සාධාරණය ඉෂ්ට කරනවාය කියන හැඟීමක් ජනතාවට ඇති කරන්න ඕනෑ. ඒ වාගේම පුද්ගලයන්ගේ ආරක්ෂාව සලසන්න කටයුතු කරන්න ඕනෑ. ඇත්තවශයෙන්ම පුද්ගලයකුගේ ආරක්ෂාව තමයි රටේ ආරක්ෂාව කියන්නේ. එම නිසා හැම පුද්ගලයකුට ඇති අයිතිවාසිකම ගැන සුදුසු ලෙස සලකා බලා, ඒ හැම දෙනාටම සාධාරණය ඉෂ්ට වන අන්දමට කටයුතු කරන්න ඕනෑ. එක විභාගයෙන් සමත් වුණා නම් හැම දෙනාගේම උගත්කම එක සමානයි කියන එක පිළිගෙන ඉවරයි.

පසුගිය දිනක මහනුවර එක්තරා සිද්ධියක් සිදු වුණා. මැරවරයෙක් ප්‍රධාන මහේස්ත්‍රාත්තුමාගේ කාමරයට ගොස් ළමයෙක් පොලොවේ ගසනවාද මොකක්ද එකක් කියා ඔහු බියවද්ද ඇපදීමේ නියෝගයක් ලබා ගත්තා. ඒ ලිපිය අරගෙන බන්ධනාගාරයට ගොස් සිරභාරයේ සිටි තැනැත්තා එළියට ගත්තා. ඒ පුද්ගලයා සිරභාරයට අරගෙන තිබෙනවා. ඔහු තවමත් රිමාන්ඩ් භාරයේ සිටිනවා.

ඔන්න ඔය විධියේ සිද්ධීන් අද සිදු වෙනවා. පානදුරේ මහේස්ත්‍රාත් වරයෙකුටත් ගහන්නට ගියා. මෙහි ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර වරුන්ගේ බංගලා ඉදිරිපිට පෙළපාළි ගියා. ඒ සිද්ධිය සම්බන්ධයෙන් එක් පුද්ගලයෙක් ප්‍රකාශයකුත් කළා. "මම තමයි එය කළේ. වගකීම මම භාර ගන්නවා." කියා. ඔහුටවත් දඬුවමක් දී නැහැ. එහෙම නම් මොකක්ද මෙහි තේරුම ? මෙහෙම ගියොත් ඉදිරියේදී ඇමතිවරුන්ට හා මන්ත්‍රීවරුන්ට ගහන්න එන විට අපට දුවන්න තැනක් නැති වේවි. මුහුදේ නැව් ටිකක්වත් නවත්වා තැබුවොත් හොඳයි. වෙන නම් කරන්නට දෙයක් නැහැ. මේ රටේ ඉඳලා නම් බේරුමක් නැති වෙනවා. එවැනි තත්ත්වයකට මේ රට පත් වී ගෙන යනවා. හදිසි නීතිය පමණක් උපයෝගී කරගෙන බැහැ. වැරදි කරන්නන්ට දඬුවම් දීමේ ක්‍රියා පටිපාටිය අනුව පසුගිය කාලයේ වැරදි කළ අයටත් දඬුවම් දෙන්නට පියවරක් ගත යුතුයි. ඒ අන්දමට සාධාරණය ඉටු වෙනවා කියන එක මිනිසුන්ට වැටහෙන විට ත්‍රස්තවාදී ක්‍රියා කරන්නට අවශ්‍යතාවයක් ඇති වන්නේ නැහැ. ඒ නිසා මෙවර හදිසි නීතිය දික් කිරීමෙන් ප්‍රයෝජනයක් නැති නිසා අපි මෙයට විරුද්ධ වෙනවා.

අ. භා. 4.25

ලක්ෂ්මන් ජයකොඩි මහතා (අත්තනගල්ල)
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி — அத்தனகல்ல)
(Mr. Lakshman Jayakody-Attanagalla)

Mr. Deputy Speaker, I think my hon. Friend from Matugama, (Mr. Anil Moonesinghe), has explained that the Sri Lanka Freedom Party will vote against the extension of the Emergency and, I think, he has given very valid reasons in his speech.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

As for me, Sir, I have been opposing this as a person who was in a government that had to face prolonged Emergencies which lasted for many months and perhaps years at a time when, for the first time in this country, we had to face terrorist activity very much unlike the one that we had to face today.

However, the Hon. Minister who introduced the Resolution, in his normal manner only quoted incidents. He said that there are highway robberies and gang robberies taking place, and he detailed the areas in which you find gang robberies and highway robberies. Then he said that there were two cases of murder, cases of waylaying of vehicles and also robberies of jewellery from banks and cash from people. But I am very sorry, Sir, the Government has not yet submitted to us any intelligence as to who these people are and what motives there are to obtain these monies and jewellery, and this has been something which I feel that the Government has not looked into.

This is why I say, Sir, that sometime ago I was very critical of the National Security Council. I was extremely critical of it because the National Security Council had not, through the Council or through the Hon. Minister or through the Hon. Prime Minister or through the Minister of Parliamentary Affairs, submit to this House a detailed statement, a detailed account, a detailed analysis as to what type of people there are for us to ascertain whether these are acts of terrorists or not. We know that once you get a flow of terrorists in this country, immediately after that follow the gang robbers, the highway robbers, the bandits. These are the first people who get activated. You cannot say that the July outburst would have been a terrorist activity–that particular outburst involving thirteen soldiers.

Then, subsequently, we found the entire ethnic community of the Sinhala people going against this type of activity and the Tamil population of this country, other than in Jaffna and in Batticaloa, had to suffer immense losses.

So therefore, Sir, my first charge is that it is up to the Government to explain to us now and say from whom you get this threat. Are they Tamil insurgents ? Are they terrorists ? And have these insurgents joined up now with the Sinhala insurgents about which the Government said that at one stage they had a suspicion, or are they just highway robbers ? This type of activity is taking place in the whole island, it is happening in Habarana, in the Puttalam area and, if you come down, it is happening in the Nikaweratiya area also. It is also happening in Nuwara Eliya, in Talawakelle and in various areas in Moneragala. So you cannot say, Sir, that all this type of thing is terrorism. We always think in terms terrorists the people who attacked the thirteen soldiers in Jaffna. Even persons wearing these military uniforms in various shades of colour or just in mufti they think that they are also "Tigers".

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! The Sitting is suspended till 5 p.m.

රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත් හිටුවන ලදින්, අ. භා. 5 ට නැවත පවත්වන ලදී.

அதன்படி அமர்வு பி. ப. 5 மணிவரை இடை நிறுத்தப்பட்டு, மீண்டும் ஆரம்பமாயிற்று.

Sitting accordingly suspended till 5 p.m. and then resumed.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I was on the point at which I was asking the Government to let us know more details about these attacks, whether they are from terrorist groups or whether they are from gang robbers, bandits and so on. It is mainly because, Sir, in the speech of the Minister he also mentioned to us that they had found some posters threatening army officers or army servicemen. Now this I grant could have been something to do with terrorism. One has also to look into another aspect of it : whether there is inter-service rivalry, because we know what happened sometime ago in Trincomalee. There was almost a mutiny whereby the Police and the Navy went at each other on a frivolous matter. Then he also said that they found foreign weapons. We would like to know or to be given an indication ; I am not asking for anything secret or anything that is classified, but if there is something that is unclassified that could be given out. Have you done any research on this ? Have you found out any intelligence on this ? Probably you will say, we have no intelligence and so on and so forth. But anyway, Sir, those who are in the operation itself are not quite clear as to what is happening with the terrorists. Now he says, there are subversive groups. With all this we have had these provisions and when we go through these provisions we find that none of these provisions are applicable to the North and to the East. These provisions are not enforced there. They are enforced only in the Sinhala areas. So are you hoping to keep the Sinhala area under control every time and allowing Jaffna or the Northern or Eastern areas to have a free operation there ? This is what happening. If the problem is in Jaffna, if the problem is in the North and East, then operate these laws there. Therefore, Sir, I feel that the Government is not playing fair by allowing the country to be governed under the Emergency right throughout. I ask him, at least for one month have a trial under normal law in the Sinhala areas. Have a trial and see whether you are going to have excessive cases of gang robberies, murders, etc. Why do you not try that ? Six months have passed !

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I can recollect during the time when we were in the Government, we relaxed the Emergency in certain areas just to find out whether we could relax it in the other areas. In certain areas, certain pockets in the country it was relaxed and we found that we could do it. I must say that His Excellency the President also came once – there was a Committee – and he himself recommended certain laws to be deleted from the Emergency and we agreed.

Therefore, I would like the Hon. Minister to reconsider these laws and have a trial in the southern areas with the normal law. If you feel that there is going to be trouble in the North – I myself feel that there will be trouble – have a trial only in the southern area.

In the morning we had a very exclusive history lesson from His Excellency the President. I do not want to deal with that. Although he made certain references which I felt should be corrected historically, it is not the time for me to do so but the time will come when we have to do so. But, anyway, we are trying our level best to get rid of these Emergency laws mainly through an organization where this All Party Conference is being held. Now that is forum where the Government thinks that these Emergency laws could be taken out through that Conference. To my mind, Sir, I find that the Conference – we are not a Party that is attending that Conference, we withdrew from that Conference – is more adjourned than in session now. Therefore, I do not know whether that Conference will be of much use ; whether it is going to be adjourned for another one month or so and it is not in session.

I do not have anything much to say. But, I want to correct certain wrongs that have been made especially with regard to certain news items that have appeared in the press sometime ago about what happened to the Mahanayake of Malwatte. This appeared in almost all the papers, especially in the 'Sun' and also in the 'Divaina'. One day when I was going through the Divaina' I just saw this headline: "මම එසේ නොකීවෙමි–මල්වතු මහ නාහිමි" This really caught my eye because I did not read the previous paper. Immediately I checked up as to what really had been said at the Conference. In the Conference it had been said :

"සියලූ ඉන්දිය ජාතිකයනට පුරවැසි බව ලබා දිය යුතුයි–මල්වතු මහ නාහිමියන්ගේ ඉල්ලීමක්"

1984 පෙබරවාරි 8 වැනි දින "දිවයින" පත්‍රයේ යි මෙසේ පළවෙන්නේ.

මම මේක කියවන්න කැමතිවෙන්නෙ මොකක්වත් නිසා නොවෙයි. මේ වකවානුවේදී ප්‍රවෘත්ති පත්‍රවලින් ගෙනයන්නාවූ ප්‍රවෘත්ති ගැන අපි ටිකක් ප්‍රවේශම්වෙන්නට ඕනෑ නිසයි. විශේෂයෙන් ඇවිස්සෙන යම් දෙයක් ඇවිස්සෙනවා නම් ඇවිස්සෙන්නෙ මේවායින් තමයි. අපි ඒ ගැන මදක් කල්පනා කරන්නට ඕනෑ.

"ගයිරික පේරුසිංහ විසිනි"

"මෙරට ජීවත්වන රටක් නොමැති සියලුම ඉන්දිය ජාතිකයිනට ශ්‍රී ලංකාවේ පුරවැසිභාවය ලබාදිය යුතුව ඇතැයි සිරිමල්වත්තේ ආනන්දභිධාන මල්වතු පාර්ශ්වයේ මහානායක හිමියන් වටමේස සාකච්ඡාවේදී රජයෙන් ඉල්ලා සිටි බව වෙළඳ හා නාවික කටයුතු ඇමති ලලිත් ඇතුලත්මුදලි මහතා ප්‍රවෘත්ති පත්‍ර නියෝජිතවරුන් අමතා පෙරේද පැවසීය".

"සමුළුව ආරම්භ කරමින් මල්වතු මහා නාහිමියන් සිය අදහස් ප්‍රකාශ කර සිටි බව සඳහන් කළ ඇතුලත්මුදලි මහතා සමුළුවට සහභාගීවන්නට මල්වතු නාහිමියන් කැමැත්ත පළ කර තිබුණු නිසා උන්වහන්සේටද වටමේසය සඳහා ආරාධනා කළ බව ඇතුලත්මුදලි මහතා පැවසීය".

දැන් මේක කියා තිබෙන්නේ වෙන කවුරුවත් නොවෙයි. "ඇතුලත්මුදලි මහතා කිව්වා" කියලයි සඳහන්ව තිබෙන්නෙ.

"සමුළුව අමතා කථා කළ මල්වතු මහා නාහිමියෝ මෙසේද ප්‍රකාශ කර ඇත. ..... ලංකාවේ ඕනෑම තැනක හිරිහැර කිරීම්වලින් තොරව ජීවත්වීමේ අයිතියක් තිබිය යුතුය. මේ රටේ ජීවත්වන රටක් නොමැති සෑම ඉන්දිය ජාතිකයකුටම මේ රටේ පුරවැසිභාවය ලබාදිය යුතුව ඇත. එමෙන්ම සංඝයා වහන්සේලාගේ අවවාද අනුශාසනා වලටද රජය අවධානය යොමු කළ යුතුය."

දැන් මේ විධියට එද පත්‍රයේ දිගටම කියාගෙන ගියා. ඊට පසුවද 1984.02.10 දින "දිවයින" පත්‍රයේ පළවී තිබෙනවා: මල්වත්තේ නාහිමිපාණන්වහන්සේ මෙහෙම කිව්වා කියා.

"මම එසේ නොකීවෙමි–මල්වතු මහ නාහිමි"

"මේ රටේ ජීවත්වන සියලූ ඉන්දිය ජාතිකයිනට මෙරට පුරවැසිභාවය ලබා දිය යුතු යැයි තමන්වහන්සේ වටමේස සාකච්ඡාවේදී ප්‍රකාශ කර තිබෙන බවට කර තිබෙන ප්‍රකාශය අසත්‍යයක් යයි සිරිමල්වත්තේ ආනන්දභිධාන මල්වතු පාර්ශ්වයේ මහා නායක හිමියෝ "දිවයිනට" පැවසූහ.

තමන්වහන්සේ වටමේසයේදී ප්‍රකාශ කර සිටියේ සුදුසුකම් ඇති අයට මෙරට පුරවැසිභාවය ලබා දිය යුතු ලෙස පමණකැයිද"–

සුදුසුකම් ඇති අයට අද තිබෙන නීතිය යටතේ අයිතිය ලබා දී ඉවරයි. මේ සුදුසුකම් නැති උදවිය ගැනයි බලන්නට යන්නෙ.

"ඉන්දියානු ජාතිකයන් යන නම තමන්වහන්සේ භාවිතා කළේ නැතැයිද මහා නාහිමියෝ ප්‍රකාශ කළහ."

"ඉන්දියානු ජාතිකයන්" කියාවත් කිව්වේ නැතිලූ.

"මෙහි සත්‍ය අසත්‍යතාවය පරීක්ෂාකර බැලීමට අවශ්‍ය නම් වටමේස සාකච්ඡාවේ කථා ඇතුළත් ටේප් පටිය පරීක්ෂා කර බලන ලෙස නමා ඉල්ලා සිටින්නේ යැයිද උන්වහන්සේ පැවසූහ."

බලන්න, කොයිතරම් දුරට මේ ප්‍රශ්නය ගිහිල්ලා තිබෙනවාද කියා ? මෙතැන මහා නායක ස්වාමීන්වහන්සේටත් අවිශ්වාසයක් ඇතිවෙලා තිබෙනවා මේ ප්‍රකාශන සම්බන්ධව. ඒ නිසා අපි මදක් කල්පනා කරන්නට ඕනෑ. ඉස්සරවෙලත් මේ වාගේ ප්‍රකාශයක් ඉන්දියාවේ "ලෝක්" සභාවේ නරසිංහ රාඕ මහත්මයා කර තිබුණා. මම ඒ ගැන මේ ගරු සභාවේ දී ප්‍රශ්න කළා අපේ වේරපිටිය ඇමතිතුමාගෙන්. එතුමා කිව්වා, එවැනි අදහසක් නැත කියා. ඉතින් එමනිසා මේ අසාධාරණ ප්‍රවෘත්තියක්. මෙහි සත්‍යාසත්‍යභාවය අපි දැනගන්නට ඕනෑ. එක අතකින් බැලූවාම මේ රටේ ජනතාවට ඇතිවන හැඟීම නම් පුරවැසිකම නැති උදවියට මොකක්හරි වංක ක්‍රමයකට නැවත වාරයක් පුරවැසිභාවය දීමේ අවස්ථාවක් ලබා ගැනීමට මේ වටමේස සාකච්ඡාව පාවිච්චි කරනවාද නැද්ද කියන සැකයයි. අන්න එමනිසා, කරුණාකරලා අවිශ්වාස ප්‍රකාශන, විශ්වාසයක් තැබිය නොහැකි අදහස් පළවීම නැති කරන්නට ඕනෑ. මේවා ජනතාව අතරට ගියාම, සිංහලයින් තුළ කැලඹීමක් ඇති කරන්න යම් අදහස් ටිකක් තවමත් රටේ තිබෙනවා නම් ඒවාටත් මේවා උපකාරී වන බව අපි හොඳින් හිතේ තබාගන්නට ඕනෑ. අන්න ඒ නිසා මම බොහෝම සන්තෝෂ වෙනවා මගේ මිත්‍ර ඇමතිතුමා මේ ස්ථානයේ සිටීම ගැන. ඊට අදාළ ඇමතිතුමන්ලා. විශේෂයෙන්ම ඒ ප්‍රකාශය කර තිබෙන ඇමතිතුමා ඒ වැරැද්ද නැති කර ලීමට කටයුතු කරයි කියා මම විශ්වාස කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

මේ පත්‍රවල තවත් කාරණයක් පළ කර තිබෙනවා. ඒකත් කුපිත කරවන දෙයක්:

"ලංකාවේ හිටපු මන්ත්‍රීවරුන්ට මද්‍රාසියෙන් ගෙවල්. වවුනියාවේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ටී. සිවසිදම්පරම් මහතාට හා ත්‍රිකුණාමලේ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. සම්බන්දන් මහතාට තමිල්නාඩු රජය මගින් මද්‍රාසි නගරයෙන් නිවෙස් දෙකක් ලබා දී ඇත. රජයට අයත් මෙම නිවාස දෙකේ යතුරු ටී. සිවසිදම්පරම් මහතාටත් ආර්. සම්බන්දන් මහත්මියටත් මද්‍රාසි නිවාස භාර නිලධාරියෙකු විසින් බාර දීම පසුගිය ද සිදු කෙරිණි."

Sir, subsequently I saw in a press statement that Mr. Sampanthan had said that he would not accept these houses. It is true that these houses have been given by the Tamil Nadu Government. I must say that the hon. ex-Member for Trincomalee had subsequently in a message to the press said that he is not going to own these houses and it will be on a temporary basis, but yet the fact remains that once you get involved in this type of thing you automatically develop extra-territorial loyalties. Now these are factors that the Government must accept. If you permit any person in this country to run away and find refuge or a home elsewhere, one must accept the position from that point onwards that that particular person has dual loyalties. Now this is something very serious, and I would be most reluctantly compelled to ask the Government to write to these gentlemen who are nationals of this country to refrain themselves and to be cautious not to accept such gifts. Because it is a very serious matter: they are members of a round table conference. They have come here to confer about themselves and misrepresentations can be made, misgivings can arise, differences of opinion can arise, the Sinhalese people may think subsequently that they are not some of their own. Therefore, I think it is best that the Government seeks to redress the position that way.

Sir, I would also like to bring to your notice a matter which has arisen in Trincomalee and I think the hon. Member for Maharagama as well as the hon. Leader of the Opposition were very careful in referring to it. I must congratulate both of them for bringing out the truth of the matter namely, the encroachment of State land by people of Indian origin and also other settlers who should not be settled there. I think the Government has put the Lnd Development Ordinance into operation coupled with the Emergency law that we passed regarding State land and stateless people. But this has been operated in areas where people have been given land as far back as 1971. I want to take up their case this time.

I got a letter from P. W. Hemalankara Thero, Pancha Maha Vihare, Poonani. This place Poonani is on the border of the Polonnaruwa–Eastern Province area. I could recollect in 1975 when there was a problem we established a police station there and we had a full police station by 1977. I do not know whether it is still there. In 1977 when we gave up Government, that police station was there. When did that police station close up? That is one question I would like to know.–(*Interruption*). Yes, a police post–a police presence was there. A police post was there but it vanished. When was it closed down? I did not check it up. I would like to know from the Deputy Minister or the Hon. Minister the reason why it was closed down.

We put up that police post for two reasons. One was to see that no illegal settlers came and settled there, to prevent their settlement. The second reason was to look after the legal settlers. The person who did that job was none other than Mr. Bradman Weerakoon who is now the Secretary to the Hon. Prime Minister and was then the Government Agent of the district. He settled the people.

Sir, I have a letter with me. It is really a copy of a letter sent to the leader of our party, Madam Sirimavo Bandaranaike. She gave it to me. It is a copy of a letter which was sent to Mr. Bradman Weerakoon. I would like to read it because it shows that the army and the navy did not only take away the stateless people or the people who went and occupied State lands illegally but also the people who were legally settled there since 1951. This is the letter that was sent to Mr. Bradman Weerakoon.

"පී. ඩබ්ලිව්. හේමාලංකාර හිමි,
පංච මහ විහාරය,
පූනාන. 1984.01.26.

ගරු බ්‍රැඩ්මන් වීරකෝන් මැතිතුමනි,

ගෞරවයෙනි,

පොලොන්නරුව දිස්ත්‍රික්කයේ යාබද දිස්ත්‍රික්කය වන මඩකලපුව දිස්ත්‍රික්කයට අයත් පූනාන හි 1971.05.05 ද, ඔබතුමාණන්ගේ අනුදැනුම ඇතිව, පොලොන්නරුව දිස්ත්‍රික් ඉඩම් නිලධාරීතුමා හා තමන්කඩුව ප්‍රාදේශීය උප දිසාපතිතුමා විසින් මා ඉහත කී ස්ථානයේ රඳවනු ලැබිය. මෙම පන්සල අවට ඇත්තේ සිංහල පවුල් දෙකකි.

ඔබ තුමාණන් විසින් දුන් ඉලුක්වෙට්ටෙයි, කොරහනලෙයි, වෙට්ටෙයි, පූනාතිකුලම් හා කරඩ්ටරිච්චිකුලම් යන කොටස් හතරේ පදිංචි වූ සිංහල පවුල් යුද හමුදාව විසින් එළවා දමා ඇත. ගෙවල් ගිනි තබා ඇත. ගොවිතැන් විනාශ වීම ඇතුළුව සම්පූර්ණ අලාභය රුපියල් කෝටි 05 ක් පමණ ඇත. මෙය මහත් අසාධාරණයකි.

එසේ වුවත් ඉන්දියාවෙන් එන ද්‍රවිඩ අයටත් මෙම කොටසේ පදිංචි අතිකුත් ද්‍රවිඩ අයටත් කිසිම අවහිරයක් නැත. රජයෙන්ද සෑම ආධාරයක්ම ලැබෙයි. මෙසේ කිරීමට නියෝග දුන්නේ කවුදැයි නොදනිමි.

ආගමේ හා ජාතියේ නාමයෙන් මෙම ප්‍රදේශයේ සිංහල බෞද්ධයින් පදිංචි කරවන මෙන් ජනාධිපතිතුමාගෙන් ඉල්ලුවෙමි. මේ ගැන ඉඩම් අමාත්‍යතුමාණන්ටත් දන්වූ අතර, මඩකලපුව දිසාපතිතුමාගෙන් විමසන ලෙස දන්වා යවා ඇතත් කිසිම සහනයක් සැලසී නැත.

සිංහලුන්ට අයත් වූ ඉරණම ගැන මම දුක් වෙමි. ඉතාමත් අසහනකාරී තත්ත්වයෙන් මම පසුවෙමි, ඔබතුමාට තෙරුවන් සරණ පතමි.

මෙයට,

(අත්සන)

පිටපත්:

1. හිටපු අග්‍රාමාත්‍යතුමිය
2. පොලොන්නරුව දිසා ඇමතිතුමා
3. අතිගරු ජනාධිපතිතුමා.

"ගරු මැතිණියනි, මෙම ලිපිය බ්‍රැඩ්මන් වීරකෝන් මැතිතුමාට යොමු කරවන්නේ තම් කෘතඥ වෙමි."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

කොයිතරම් සාධාරණ ලෙස 1971 දී නීත්‍යානුකූලව පදිංචි කරනු ලැබූ කෙනෙක්ද? කා විසින්වත් නොවෙයි. මඩකලපුවේ දිසාපතිතුමා විසින්. අවංකව කියනවා නම් මේ රටේ සිටින මහ ජාතිය මේ වාගේ හේතූන් උඩ විශාල බියකින් සිටින්නෙ. තමුන්නාන්සේලාට මම පෙන්වා දෙන්න යන්නේ නැහැ මොන මොනවද වටමේස සාකච්ඡාවෙදී එක්සත් ජාතික පක්ෂයත්, ත්‍රෛනිකායික මහ සංඝ සභාවත්, සමස්ත ලංකා මුස්ලිම් සංගමයත්, අතිගරු මඩිහේ පඤ්ඤාසීහ මහනායක ස්වාමීන් වහන්සේත්, ශ්‍රී ලංකා බෞද්ධ මහ සම්මේලනයත්, කතෝලික සංගමයත් ඉදිරිපත් කර තිබෙන යෝජනා කියා. ඒ මොකද, අපි මේ ස්ථානයේදී එසේ නොකියනවාය කියා පොරොන්දුවක් දී තිබෙන නිසයි. නමුත් මම අවංකව කියන්න කැමතියි ඒ යෝජනා දෙස බැලුවොත්—සිංහල සංවිධානවල යෝජනා දෙස බැලුවොත්—

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Why refer to it at all ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

ඒ යෝජනා ගැන මම කියන්නේ නැහැ. නමුත් මේ ප්‍රශ්නයට අදාළ වෙනවා—

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා (සෞඛ්‍ය ඇමතිතුමා)
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து — சுகாதார அமைச்சர்)
(Dr. Ranjith Atapattu Minister of Health)

ඊට වැඩිය තරකයි නෙ ඔහොම කියන එක.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

කට පියාගෙන ඉන්නද කියන්නෙ?

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

නොකියන්න කියලයි කියන්නෙ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

එහෙම නම් මම වෙන වෙන දේවල් කියන්නම්. එහෙම නම් තව පැයක් මට ගන්නවෙනවා නොකියා කියන්නය කියන නිසා ඒ සඳහා ටිකක් කල්පනා කරන්න ඕනෑ. එහෙම නැත්නම් අකුරු අත් හැරලා මැදින් කියන්න ඕනෑ.

වෛද්‍යාචාර්ය රංජිත් අතපත්තු මහතා
(டாக்டர் ரஞ்ஜித் அத்தபத்து)
(Dr. Ranjith Atapattu)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි යමක් කියනවා නම් කෙළින් කියන්න ඕනෑ, වක්‍රයෙන් කියන්න ඕනෑ නැහැ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

නැහැ නැහැ. අපට වක්‍ර විධියට කියන්න වී තිබෙන්නේ. අද අපි මේ මොහොතේ එහි නැති වුණත් අපි පොරොන්දුවක් දී තිබෙන නිසයි. ඒ පොරොන්දුව ඉටු කරන්න තිබෙන නිසයි. කියන්න අවස්ථාව ආවාම ඒ අවස්ථාවල අපි කියන්නම්. හැබැයි. අසාධාරණ විධියට අපේ කටවල් පාවිච්චි කරන්නෙ නැති බව අපි පැහැදිලිවම කියන්න ඕනෑ.

ඔය ත්‍රිකුණාමලේ ප්‍රදේශයේ දී තිබෙන ඉඩම් දෙස බැලුවොත් තමුන්නාන්සේලාට වැටහේවී එහි තිබෙන තත්ත්වය ගැන. මේ ළඟදී "මිට්සුයි සිමෙන්ට්" කියා රූපවාහිනී ප්‍රචාරක වැඩ සටහනක් මම දැක්කා.

There was a telecast that appeared on T. V. about Mitsui Cement. Originally I thought it was something that was completed, that Mitsui Cement had established themselves and that they are producing cement out of clinker, but at the end I found that it was not for the sale of cement, but for the sale of shares of the company. So I delved into this to find out who were the shareholders. Mind you, this is in Cod-Bay on a block of land in Trincomalee just round the corner ; as everyone knows Cod-Bay is next to China-Bay.

The prospectus says :

"The primary object of the company is to set up an industry for the manufacture of cement from imported clinker. The factory for this purpose is being constructed at Cod-Bay, Trincomalee. Crown land to the extent of approximately 17.6 hectares at Cod-Bay"–

which is about 44 acres–

"Trincomalee, has been handed over by the Government and the formal lease is to be executed shortly."

It is not yet given. The lease has not been paid for.

I just looked into the collaborators of this company and found the following names :

Acme Investments Ltd ; has experience in promoting and establishing a number of joint venture projects in Sri Lanka. Then St. Anthony's Consolidated Ltd., a leading company in Sri Lanka and has over a period of years acquired vast experience and expertise in the hardware and building materials trade and has also established a wide marketing and sales organization. Mitsui Mining Co. Ltd., of Japan, a very large organization engaged in mining and exploitation of mineral resources and is engaged in the manufacture of cement in a substantial way, and Shigyo Co., Ltd., of Japan has considerable experience in joint venture projects outside Japan and is able to provide management skills.

I looked into the directorate of this company. When I looked into the directorate of this company I found that there is not even a single Batticaloa Tamil in it. At least if there was a Batticaloa Tamil in its directorate, I can understand. If there was a Jaffna Tamil even I can understand. Who are the directors of this company ?

Arulanandam Yesuvadian Samuel Gnanam of No. 31, Collingwood Place, Colombo 6, company director ; Iwaku Kato of 5-19-38, Yawata Ichikawa-Shi, company director ; Shigenobu Asano of No. 6, Flower Terrace, Colombo 3, businessman ; Simon Rajaseelan Gnanam of No. 31, Collingwood Place, Colombo 6, company director ; Mariapillai Radhakrishnan of No. 337, Galle Road, Colombo, Attorney-at-Law ; Christopher James Edward Anthonisz of No. 18, Esther Avenue, Colombo 5, Banker ; Kuppuswamy Thilayanathan of No. 57, Vivekananda Road, Colombo 6, Businessman ; and Seigo Takahashi of

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ලක්ෂ්මන් ජයකොඩි මහතා]

3-33-17, Honamanuma, Suginami-Ku, Tokyo 167, Japan, company director. These are the people who got this land. Did the Minister of Lands and Land Development know that this land was being given? I would like to know from him why this land was given at least without taking lease money. This is a very serious matter, Sir, because we the Sri Lankans are to be evicted, we have to face all the threats, while the multi-nationals, when they come here and ask for land, are just given the land overnight. In our case we had to pay all the money or had to face the threat of expulsion from this area. What I want to show is this. We use the armed services under the emergency to get rid of the Sinhala peasants who have been given land under authority, under a particular Ordinance. They are people who have been enjoying these lands for the last 12 years and they are being kicked out while people of this type are given land, 40 to 50 acres, from areas like Cod Bay and China Bay, which we think are security areas. Now, these are 100 per cent security areas, the area right round Koddiaru Bay, starting from the place where you get the navy, right up to Muttur. The area around China Bay, Cod Bay, Kinniya, Upparu, Gange and Muttur and then coming down to Pannichchankerni, Verugal right up to Kalkudah, is a 100 per cent security area. We never permitted any foreigners in that area at that time because we knew the importance and the value of the area. But here these are the people to whom land is being given. I can understand it if the land has been given on the basis of a lease, but there has been no lease. They have built up the area and I am told that they have completed 50 per cent of it. I would like to ask the Deputy Minister why it was done.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ මෑතකදී හමුදාවේ සිටි සමහර උදවිය කිසිම හේතුවක් නැතිව ගෙදර යවා තිබෙනවා. මම මේ ගැන පරීක්ෂා කර බැලුවා. යම් කෙනෙක් ගෙදර යවන්න මොකක් හෝ හේතුවක් තිබෙන්නට ඕනෑ. නාවික හමුදාවේ අවුරුදු 12, 13, 15, සේවයේ යෙදී සිටි උදවිය උන්හිටි ගමන්ම ගෙදර යවා තිබෙනවා. මේ විධියට ගෙදර යවන්න හේතු යනාදිය ගැන මම හුඟක් සොයා බැලුවා. නමුත්, කාටවත් උත්තර දෙන්නට පුළුවන් තත්ත්වයකට කිසිවෙක් ගෙදර යවා නැති බවයි, පෙනුණේ. මම එක කාරණයක් දන්නවා. අද සිටින හමුදාපතිතුමන්ලා ඉතාමත් හොඳ උදවියයි. ඒ අය බොහොම ප්‍රවේශම් වෙනවා, යම් කෙනෙක් ගෙදර යවන්න සිද්ධ වෙනවා නම්, ඒ අය යම් කෙනෙක් ගෙදර යවන්නෙ කුමක් හෝ සාධාරණ හේතුවක් උඩ බව මට හොඳින්ම කියන්න පුළුවන්. නැත්නම් හමුදාපතිතුමන්ලාට ඔය ප්‍රශ්නවලට උත්තර දෙන්නට සිද්ධ වෙනවා. නමුත් අර අන්දමට කටයුතු කරන්නේ ඉහළින් එන නියෝග නිසාය කියලයි කියන්නේ.

මම අහන්න කැමතියි, මෙන්න මේ කාරණය ගැන. පණිවුඩ ආකෘති පත්‍ර අංක 61 මගින් නාවික හමුදාවේ 5 දෙනෙක් ගෙදර යවා තිබෙනවා. ජේ. එම්. එම්. අතපත්තු, බී. එම්. එස්. අබේරත්න, එච්. පී. කරුණාරත්න, එච්. ආර්. ජී. චන්ද්‍රසිරි සහ එච්. ජී. රංජිත් යන අයයි ගෙදර යවා තිබෙන්නේ. 1950 නැවියන් බඳවා ගැනීමේ හා සේවා රෙගුලාසි අංක 15 (1) යටතේ "ඔබගේ සේවය තවදුරටත් අවශ්‍ය නොවේ." කියා සඳහන් කර තිබෙනවා. හේතුවක් නැහැ. විභාගයක් නැහැ. පරීක්ෂණයක් නැහැ. 1983 නොවැම්බර් මස 9 වන දින සිට මේ ගෙදර යවා තිබෙන උදවියගෙන් සමහරු අවුරුදු 12, 15 නාවික හමුදාවේ සේවය කර තිබෙනවා. මේ පස් දෙනා එකම තැන සිටි අයත් නොවෙයි. නැන් තැන්වල සිටි අයයි. එක්කෙනෙක් සේවය කර තිබෙන්නේ ගැමුණු බලකායේ. දෙවන එක්කෙනා සහ තුන්වන එක්කෙනා ඉඳල තියෙන්නෙ තිස්ස. හතරවන එක්කෙනා පී. 432 සිටි බව කියලා තිබෙනවා. මම හිතන්නේ බෝට්ටුවක් හෝ නැවක් වන්නට ඇති. පස්වන එක්කෙනා එළාර නැවේ.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please! I understand that there has been an agreement that the vote shall be taken at 8 p.m. So you can adjust your time accordingly.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I will finish. I have almost finished. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නියෝජ්‍ය ඇමතිතුමාගෙන් මම අහන්න කැමතියි, මේ අය ගෙදර යැව්වේ ඇයි කියලා. මේ නිලධාරීන්, මෙවැනි වකවානුවලදී එළියට දැමීමෙන් සැහෙන භයානක තත්ත්වයක් ඇති වී තිබෙනවා. එවැනි නිලධාරියෙක් යම් වැරැද්දක් කර තිබෙනවා නම් ඒ සඳහා චෝදනා පත්‍ර ඉදිරිපත් කර ඒ නිලධාරියාගේ වරදට දඬුවම් කරන්න ඕනෑ. නමුත් කිසිම චෝදනාවක් නැතිව 'උඹ ගෙදර පලයන්' කී හැටියේ ඒ මනුෂ්‍යයා ගෙදර යන්නේ බොහොම හිතේ කැක්කුමකින්, ආණ්ඩු විරෝධී හැඟීමකින්. අන්න එම නිසා අපි කල්පනා කරන්නට ඕනෑ ඒ ගැන. අන්න ඒ නිසා එවැන්නෙක් ගෙදර යවන්න ඇති හේතුව දෙන්නට ඕනෑ. හේතුවක් නොදී නම් කවදාවත් කිසිවෙක් ගෙදර යවන්නට එපා. [බාධා කිරීම්] මම බොහොම ස්තුතිවන්ත වෙනවා එතුමාට. මේ ගැන ජනාධිපතිතුමාටත් දන්වා යවා තිබෙනවා. [බාධා කිරීම්] නමුත්නාත්සේ රපෝර්තුවක් ගැන කියනවා. මම දන්නවානෙ සාමාන්‍යයෙන් ඒවාට වන දේ. මම රපෝර්තු ගණනාවක් යවා තිබෙනවා. සමහර ඒවාට උත්තර එන්නේ නැති වගත් මම දන්නවා. අඩු ගණනේ මේ අය ගෙදර යැවීමේදී "මේ අය ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයෝය" එහෙම නැත්නම් "මේ අය කෙරෙහි විශ්වාසයක් නැත" කියලාවත් කියන්න. එහෙමවත් කියනවා නම් ඒකත් එකක්.

ටී. බී. වේරපිටිය මහතා (ඇමතිතුමා සහ නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා)
(திரு. ரீ. பி. வேரப்பிற்றிய — அமைச்சரும் பாதுகாப்புப் பிரதி அமைச்சரும்)
(Mr. T. B. Werapitiya-Minister and Deputy Minister of Defence)

කරුණු දන්නේ නැතිවයි, කථා කරන්නේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

මම මේ ගැන කියන්නේ වෙන කිසි දෙයක් නිසා නොවෙයි. ඉහළින් නියෝග යනවා. ඒ කියන්නේ, අමාත්‍යංශයෙන් නියෝග යනවා. "සිකියුරිටි කවුන්සිල්" එකෙන් නියෝග යනවා. කවුරුහරි ගිහිල්ලා සමහර උදවියට කේලමක් කිව්වොත්, ඒ අයට නියෝග යනවා.

ටී. බී. වේරපිටිය මහතා
(திரு. ரீ. பி. வேரப்பிற்றிய)
(Mr. T. B. Werapitiya)

That is not true.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

"නොට් ට්‍රූ" කියල කිව්වට මම දන්නවානෙ යන විධිය. එමනිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ගැන පරීක්ෂා කර බලා සාධාරණයක් කරන්නටය කියා ගරු නියෝජ්‍ය ඇමතිතුමාට මේ ලියුම ඉදිරිපත් කරන්නට කැමතියි.

අවසාන වශයෙන් මේ ප්‍රදේශයේ ඉන්න ද්‍රවිඩ ජනතාව සැහෙන හිතේ කැක්කුමකින් සැහෙන බියකින් ජීවත් වන උදවිය බව ටිකක් හිතේ තියාගන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

I am referring especially to the Tamil-speaking people who are living in the Sinhala areas. Sir, I say this because they have, after we passed the Sixth Amendment to the Constitution, actually eschewed separatism and become part and parcel of a unitary state. They are for a unitary state, and they want a guarantee that they can work and live without any fear in this part of the country. Now, this is very important because I notice that most of the Tamil people in Colombo are not leaving for the North–I do not mind their going to the North–but they are leaving the country. Why? Because they have no place in the North and no place in Colombo where they can live safely. They live in fear, and that fear must be eradicated.

Secondly, we must take immediate steps to pay them the money, even though we are rather frightened to give out the money that we have at the moment through the insurance companies. We have very little money I believe. I hear that the Treasury is their only salvation, because the banks are not prepared to give money to the insurance companies. I think money should be given to the insurance companies so that they can give out the money for the immediate repair of the buildings that have been destroyed. The money due to them should be given as fast as possible.

Thirdly, Sir, there should be a concerted effort to get the services into our confidence. From the incident that I mentioned with regard to Atapattu we can see that we are not working towards the goal of getting back that confidence of the services. This obviously tends to reduce the morale of the services. I am only referring to this part of the country. I am not talking of the North and the East because the situation is quite different there.

At least there should be proper understanding between the services and the public. I am sorry to say, Sir, that still that confidence is not there. When I say " the public " I do not mean only the Sinhalese ; I mean also the other people in this area. It is only with that confidence that we can get some intelligence, information of what is happening in the other camp. The answer we get to the questions that we always ask, namely, what is the reason for all this mayham and destruction, why is it that we cannot get closer, or why can we not stop this type of destruction that takes place is " We do not get enough intelligence, information ". The reason for this is because there is a disparity, there is no closeness between the services and the people. The only way that the Government can mend this position is to have better understanding between the people and the services.

නියෝජ්‍ය කථානායකතුමා
(பிரதிச் சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

Order, please ! The hon. Member for Kalawana can follow the Hon. Minister of Rural Development who has asked for only five minutes.

සරත් මුත්තෙට්ටුවේගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Very well, Sir. I am always ready to follow her !

විමලා කන්නන්ගර මහත්මිය (ග්‍රාම සංවර්ධනය පිළිබඳ ඇමතිතුමිය)
(திருமதி விமலா கன்னங்கர — கிராம அபிவிருத்தி அமைச்சர்)
(Mrs. Wimala Kannangara–Minister of Rural Development)

Mr. Deputy Speaker, I thank you for giving me these few minutes and especially my Oppisition Colleague, the hon. member for Kalawana, for allocating a few minutes to me.

I want to stress the idea that in the North and the East women are badly affected due to banks being robbed. Not only their cash but their jewellery, which is very dear to them, has been removed. My Colleagues in the Opposition objected to the extension of the Emergency. What do you think will happen if this Emergency is removed altogether. Will any woman or child be able to go on the road wearing anything called gold or jewellery ?

In the North and the East, jewellery is a great treasure. I cannot understand these terrorists, who are children of mothers. Before a child is born its father puts round the mother's neck a valuable treasure called the thalikodi, which is never removed till death separates them. Unless she becomes a widow it is never removed.

This tragedy happens due to two causes. Firstly, women who fear that their jewellery will be robbed if kept in the house keep it in the bank as a safety measure. Agriculture and rural development go together. That is why I got up as Minister of Rural Development to show our opposition and concern over the bullying of the entire womanhood of our country by taking what is dear and close to them whether they are Buddhists, Hindus or Mulims. The second reason is that during the farming season people who are engaged in agriculture especially go to the agricultural banks or the nearest bank and pawn their gold. Now all this pawned jewellery has disappeared. To add to that calamity, in the North and the East we are faced with one of the worst floods in history. It is worse than the cyclone. During the cyclone 75,000 men and women of the rural development societies volunteered to clear and rehabilitate their areas. Today the people who have lost their jewellery have no gold or jewellery to pawn for the Yala season. They ploughed the paddy fields, and they were expecting to get some return from their paddy. They have taken fertilizer loans ;

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[විමලා කන්නන්ගර මහත්මිය]

they have hired tractors and hired labour. Now they have lost their jewellery as well after spending their energy to get some money from these paddy fields.

Therefore we call upon the entire Opposition to be united in an hour of trial like this. Unity is essential. We must put a halt to the criminal wastage of our resources. They are robbing our wealth day and night. Every month we are extending the Emergency, but we find there are loopholes and lapses. Please, give us proper advice! Every country in the world should come to our aid and not make excuses about the July communal crisis. This has happened even before July. Therefore, let us be united to revive our economy. We have lost 30 million bushels of paddy in the North and the East, and with the losses in other agricultural areas it will be nearly 60 million. The Social Services Department has already doled out about Rs. 20 million, and daily we are eating into our resources. Therefore, we call upon world food agencies and the Food and Agricultural Organization. There is nothing in this world called muddy paddy. Throughout the world when a disaster occurs like this the farmer is compensated. It is a national crisis. It is the people who are losing the 60 million. Therefore we call upon every person, irrespective of their party politics, to be united, as an agricultural country, to fight these terrorists and see that they are wiped out for good, or controlled, within a few months.

Thank you.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා (කලවාන)
(திரு. சரத் முத்தெட்டுவெகம — கலவான)
(Mr. Sarath Muttetuwegama-Kalawana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වතාවේ, මේ මාසයේ, අපි හදිසි නීතිය දීර්ඝ කිරීමේ විවාදය පවත්වනවිට කොයි තරම් අස්වාභාවික තත්ත්වයක් අපේ රටේ ඇති වී තිබෙනවාද කියන එක දැන් රටේ සිදුවන දේවලින් අපට බොහොම පැහැදිලි වෙනවා. කවදාවත් නොවහින කාලයකට, කවදාවත් ගලන්නේ නැති පළාත්වලට මහා ධාරානිපාත වර්ෂාවල් ඇතිවෙලා විශාල ජල ගැලීම් පවා සිදු වී තිබෙන බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

වතුර පිරිල.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

ඔව් සමහරවිට ඒ ගැන සතුටුවෙනවා ඇති. සාමකාමීව පාරේ යන අලි පවා කුලප්පුවෙලා මිනිසුන් මරාගෙන, වාහන පෙරළාගෙන දිව්වා. පොඩි හාමුදුරුවෝ සිටියේ නැත්නම් තවත් කලබල කරනවා. යාන්තම් පොඩි හාමුදුරුවෝ "සබ්බ පාපස්ස අකරණං" කිව්වාම අලියා පැලියගොඩ පොලිසියට භාර වෙලා තියෙනවා.

අපේ ග්‍රාම සංවර්ධනය පිළිබඳ ගරු ඇමතිතුමිය දැන් කිව්වා සිදු වී තිබෙන කරදරය ගැන. වී අස්වැන්නෙන් ලබා ගන්න තිබුණු කෝටි ගණනක වී ප්‍රමාණයක් අපට නැති වී තිබෙනවා. බැංකුවල තිබුණු රිදී රත්තන් ආභරණ සියල්ලම පැහැරගෙන ගොස් තිබෙනවා. මෙය උතුරු නැගෙනහිර පළාත්වලට පමණක් බලපාන ප්‍රශ්නයක් නොවෙයි. ඒ භාණ්ඩ සඳහා රක්ෂණ මුදල් ගෙවනවිට අපි හැමෝටම ඒ මුදල් ගෙවන්න සිදුවෙනවා. ඒ අනුව අපට පාන් මිල වැඩි වෙනවා, සීනි මිල වැඩි වෙනවා, පිටි මිල වැඩිවෙනවා. ඒවායේ මිල වැඩි කරලා තමයි, බැංකුවලින් කඩා ගත්තා දේවලට රක්ෂණ මුදල් ගෙවන්න සිදුවෙන්නේ. ඒ නිසා මෙය බරපතල තත්ත්වයක්. මා මේ රජයට චෝදනා මුඛයෙන් කියා සිටින්නේ, මේ හදිසි නීතිය පනවා තිබෙන්නේ, මේ හදිසි නීතිය දීර්ඝ කරන්නේ, රටේ සාමය රකින්න නොවන බවයි. ආණ්ඩුව අද තමන් වෙත ලබාගෙන තිබෙන බලතල ගැන බැලුවොත් කිසිම හදිසි නීතියක් අවශ්‍ය නැහැ. රට පාලනය කරන්න. ත්‍රස්තවාදය වැලැක්වීමේ පනතක් සම්මත කරගෙන තිබෙනවා. ඒ යටතේ මිනිසුන් සිරභාරයට ගන්න පුළුවන්. දහඅට මාසයක් ඒ මිනිසුන් උසාවියකට පමුණුවන්නේ නැතිව තියා ගන්න පුළුවන්. ඒ නීතිය අද සාමාන්‍ය නීති පොතට ඇතුළත් වී තිබෙනවා. එහෙනම් මොනවටද, තවත් හදිසි නීතියක් ?

මැතිවරණ කල්දමන්න පනතක් අද සම්මත කරන්න බලාපොරොත්තු වෙනවා. ජනාධිපතිතුමාට හිතුමතයට මැතිවරණ කල්දමන්න වෙනම නීතියක් අද සම්මත කරන්න හදනවා. එහෙනම් මොනවටද හදිසි නීතියක් ? තමුන්නාන්සේලාට තඹ දොයිතුවක විශ්වාසයක් නැතිවීම මෙම හදිසි නීතිය පැනවීමට එක් හේතුවක්. පසුගිය වතාවේ කළුතරදී නිදහස් උත්සවය පැවැත්වූ අවස්ථාවේදී මොකක්ද වුණේ කියා මා ගරු ඇමතිතුමාගෙන් අහනවා. ඒ සොල්දාදුවන්ට තුවක්කු දෙන්න සිදු වුණේ, තුවක්කුවල 'බෝල්ට්' එක ගලවලායි. තමන්ගේ හමුදාවෙත් තමන්ගේ සොල්දාදුවන්ට දුන් තුවක්කු ආණ්ඩුවේ උදවියට විරුද්ධව පාවිච්චි කරයි කියන බියෙන් ඒ තුවක්කුවලින් වෙඩි තියන්න බැරි විධියටයි ඒ තුවක්කු සොල්දාදුවන්ගේ අතට දුන්නේ.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

අදත් එහෙමයි.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

මා දන්නේ නැහැ අද කොහොමද කියා. තමුන්නාන්සේලාට හමුදාව ගැන විශ්වාසයක් නැහැ. ත්‍රිවිධ හමුදාව ගැන විශ්වාසයක් නැහැ. අපට ලැබුණු ආරංචි අනුව පසුගිය ජූලි මාසයේ කලබලවලට පසුව ස්ථිර වශයෙන් විදේශීය හමුදාවල් ගෙන්වා ගැනීම පිළිබඳව තමුන්නාන්සේලාගේ කථාබස් තිබුණා. නමුත් මා දන්නේ නැහැ, දැන් තත්ත්වය මොකක්ද කියන්න. අද ආණ්ඩුවට සිදු වී තිබෙන දේ බලන්න ! ආණ්ඩුව නිකම් මහ පාර වගේ. අද මහා මාර්ගවල තත්ත්වයට ආණ්ඩුව වැටිලා. මහාමාර්ගයක ගියොත් එක වළක වැටිලා එළියට එනවිට තව වළකට වැටෙනවා.

ආණ්ඩුවත් ඒ වගේ තමයි. මොකක්ද, ආණ්ඩුවේ අද තත්ත්වය ? ආණ්ඩුවේ, කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීමට මොකක්ද, අද සිදු වී තිබෙන්නේ ? අගමැතිතුමා රැස්වීමක් - රැස්වීමක් පාසා ගිහින් කියනවා, පක්ෂ ක්‍රමය නැති කරමු ' කියා. එක අතකින් මමත් එකඟයි, ඒ අදහසට. නමුත් පක්ෂ ක්‍රමය නැති කරන්න ඉස්සෙල්ලා පන්ති නැති කරන්න ඕනෑ. පන්ති විරහිත සමාජයකින් තමයි, පක්ෂ නැති කරන්න පුළුවන් වන්නේ. ඒ මොකද, යම්කිසි සමාජ පන්තිවල ඉල්ලීම් තමයි, ඒ ඒ පක්ෂ පිළිබිඹු කරන්නේ. නමුත් මම කියන්න යන්නේ ඒ ගැන නොවෙයි.

ඒ විධියට අගමැතිතුමා තමා යන රැස්වීමක් - රැස්වීමක් ගානේ කියනවා, පක්ෂ ක්‍රමය නැති කරමු ' කියා. නමුත් ජනාධිපතිතුමා කියනවා, විරුද්ධ පක්ෂත් තිබෙන්න ඕනෑය කියා. එතුමා මහපොළ උත්සවයේදී එසේ කීවා. තව කොහේදීදත් එතුමා එහෙම කීවා. කෝ, කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීම ?

අනෙක් පැත්තෙන් බලන්න, අපේ මුදල් ඇමතිතුමාගේ තත්ත්වය ! එතුමා ආණ්ඩුවේ යම් - යම් ඇමතිවරුන් සහ අමාත්‍යාංශ බොහොම තදින් විවේචනය කරනවා. මම කියන්නේ ඒ විවේචනවල සාධාරණත්වය හෝ අසාධාරණත්වය ගැන නොවෙයි. එය තීන්දු කිරීම මට අයිති දෙයක් නොවෙයි. නමුත් ඇමතිවරුන්ගේ ප්‍රකාශන තුළින් ප්‍රදර්ශනය වන දේවල් ගැන කථා නොකර බැහැ. අසුවල් - අසුවල් අමාත්‍යාංශ, අසුවල් - අසුවල් සංස්ථා මුදල් නාස්ති කරනවා, මුදල් කාබාසිනියා කරනවා, වුවමනා නැති විධියට වියදම් කරනවා, අපේ රටේ තත්ත්වය ඒකයි ' කියා මුදල් ඇමතිතුමා කියනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගිය බදදට කලින් බදද කැබිනට් මණ්ඩලයේදී ඇති වුණු තත්ත්වය මේ ඇමතිතුමන්ලා දන්නවා. ඇමතිතුමන්ලා දෙදෙනෙක් — මුදල් ඇමතිතුමා සහ වෙළෙඳ ඇමතිතුමාත් — ඒ කැබිනට් රැස්වීමේදී බොහොම තදින් එකිනෙකාට පහර ගැහුවා. කෝ, තමුන්නාන්සේලාගේ සාමූහික වගකීම ? දැන් මුළු ලෝකයම දන්නවා, අපේ කැබිනට් මණ්ඩලය තුළ සාමූහික වගකීමක් නැති බව. ඒකයි මම කිව්වේ, අපේ ආණ්ඩුවත් අද මහ පාරේ තත්ත්වයට වැටිලාය කියා. මහ පාරේ හැම තැනම වළවල්. ඒ වගෙයි, අද ආණ්ඩුවත්.

මම ගියවර හදිසි නීතිය පිළිබඳ විවාදයේදී " Illustrated Weekly of India " නමැති ඉන්දියානු සඟරාවකින් උධෘත ඉදිරිපත් කරමින් පෙන්වා දුන්නා, පසුගිය ජූලි කලබල සම්බන්ධයෙන් එක අවුරුද්දේම දෙසැම්බර් මාසයේදී මේ ආණ්ඩුවේ කැබිනට් ඇමතිවරුන් තුන් දෙනෙක් තුන් ආකාරයක හේතු ඉදිරිපත් කර තිබුණු හැටි. මේ වගේ දේවල් නිසා දැන් මේ රටට පමණක් නොවෙයි මුළු ලෝකයටමත් පෙනෙනවා, මේ ආණ්ඩු දහ - දෙලොස් අතකට බෙදී තිබෙනවාය කියා. කැබිනට් මණ්ඩලය තුළ, ආණ්ඩුව තුළ දැන් ලොකු පොරයක් තිබෙනවා. ඒ බව නොයෙකුත් සිද්ධිවලින් ප්‍රදර්ශනය වෙනවා.

ඊළඟට පෙන්වන්න කැමැතියි. මෑතකදී කම්කරු ඇමතිතුමා කර තිබෙන ප්‍රකාශයක්. මම කැමති නැහැ, පෞද්ගලික කරුණු ඉදිරිපත් කරන්න. නමුත් මම උත්සාහ කරන්නේ ආණ්ඩුව තුළ, කැබිනට් මණ්ඩලය තුළ අද තිබෙන තත්ත්වය පැහැදිලි කරන්නයි. කම්කරු ඇමතිතුමා කියා තිබෙනවා, ' මගේ අමාත්‍යාංශය යටතේ තිබෙන එක්තරා කාර්යයක්, — ඒ කියන්නේ, බටහිර ආසියාවට සේවකයන් යැවීමේ කාර්යය — මේ ඊයේ - පෙරේද ආ නාම්බෙක් මගෙන් උදුරා ගන්න හදනවා ' ය කියා. ඒ, ඇමතිතුමෙක්, තවත් ඇමතිතුමෙක් ගැන කළ ප්‍රකාශයක්. මේ ආණ්ඩුවේ ඇමතිවරුම මේ විධියේ ප්‍රකාශ කරන අතර තමුන්නාන්සේලා කියන්නේ, අපටද, මේ ආණ්ඩුව කෙරෙහි විශ්වාසය තබන්නය, මේ ආණ්ඩුවට ගරු කරන්නය, මේ ආණ්ඩුව කරන - කියන දේවල් පිළිපදින්නය ' කියා ? කොහොමද, තමුන්නාන්සේලා අපට එහෙම කියන්නේ ?

ඒකයි මම කියන්නේ, මේ හදිසි නීතිය තමුන්නාන්සේලා උපයෝගී කර ගන්නේ බොහොම භයානක ගමනක් යන්නය කියා. තමුන්නාන්සේලාගේ ආණ්ඩුවේ සාමූහික වගකීම කැඩිලා. මම පසුව කියන්නම්, ඒ පිළිබඳ වෙනත් යම් - යම් ප්‍රවණතාත්. තමුන්නාන්සේලා මේ හදිසි නීතිය උපයෝගී කර ගන්නේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රම - ක්‍රමයෙන් වළලා දමා ආඥාදායක ආණ්ඩුවක් පිහිටුවීමටයි. මම කෙළින්ම ඒ චෝදනාව කරනවා. ආසියානු කලාපයේ වෙනත් රටවල මිලිටරි ආණ්ඩු ඇති වුණා වගේම ලංකාවේත් මිලිටරි ආණ්ඩුවක් ඇති වීමේ සෙවනැල්ල අද වැටී තිබෙනවා. ඒකයි, අද තිබෙන භයානකකම. හමුදාවේ තුවක්කුවල ' බෝල්ට් ' එක ගැලෙව්වාට ඒක නවත්වන්න බැහැ. ඒක කොහෙත් ඒවිදැයි කියන්න බැහැ. ඒකයි, අද මේ රටේ තිබෙන තත්ත්වය. හමුදා ආණ්ඩු ඇති වන්න අවශ්‍ය වන එක පසුබිමක් තමයි, ආණ්ඩුව කෙරෙහි මිනිසුන් කලකිරීම. පවත්නා ආණ්ඩුව කෙරෙහි මිනිසුන් තුළ කීකරු භාවයක් නැති වීම, ආණ්ඩුව කියන දේවල් පිළිගන්න මිනිසුන් සූදානම් නැති තත්ත්වයක් ඇති වීම තමයි, මිලිටරි ආණ්ඩුවක මුල් බීජය කියන එක අප මතක තබා ගන්න ඕනෑ. අන්න ඒ නිසයි අපි තමුන්නාන්සේලාට කියන්නේ, ස්ථිර වශයෙන්ම හමුදා ආණ්ඩුවකට මඟ පාදන තත්ත්වයක් තමයි, අද ඇති වී තිබෙන්නේ කියා.

අද නීතියට සහ සාමයට සිදු වී තිබෙන දේ තමුන්නාන්සේලා දන්නවා. කොත්මලේ ගරු මන්ත්‍රීතුමා (ආනන්ද දසනායක මහතා) බොහොම ලක්ෂණට කිව්වා විභාගයක් පවත්වන්නට ගියාම ඇති වන තත්ත්වය ගැන. අද දහස් ගණන් ලක්ෂ ගණන් ශිෂ්‍යයින් විභාගවලට පෙනී සිටිනවා. එක ළමයෙකුටවත් විශ්වාසයක් තිබෙනවාද ඔවුන් පෙනී සිටින විභාගය සාධාරණව පවත්වයි කියා ? අල්ලපු මේසයේ සිටින ළමයා ප්‍රශ්න පත්‍රය සල්ලිවලට අරගෙනද කියා අනික් ළමයාට සැකයි. උත්තර පත්‍රවලට ලකුණු දෙන ක්‍රමය ගැනත් සැකයි. මේක මොන අපරාධයක්ද ? ඒ ගරු මන්ත්‍රීතුමා කිව්වා වගේ විභාගයත් විවෘත වෙළඳපොළට වාණිජ භාණ්ඩයක් වෙලා. බොහොම අමාරුවෙන් පාඩම් කර දෙමව්පියන්ගේ මුදල් වියදම් කර විභාගයට යන ළමයාට ඒක ගැනත් විශ්වාසයක් නැත්නම් මොන විධියේ තත්ත්වයක්ද අපේ රටේ ඇති වී තිබෙන්නේ ?

මම කලින් දවසක් පෙන්වා දුන් පරිදි ලොකු පොහොසත් උදවියට නම් රුපියල් හය දහක් ගෙවා "ඉන්ටර්නැෂනල් ස්කූල්" එකට යන්නට පුළුවන්. ඒ අයට පුළුවන් ඉංග්‍රීසියෙන් ඉගෙනගෙන ඉංග්‍රීසි "ඕ ලෙවෙල්" එකට හා ඉංග්‍රීසි "ඒ ලෙවෙල්" එකට පෙනී සිටින්නට. එහෙත් මේ රටේ සිටින අනික් ලක්ෂ සංඛ්‍යාත ශිෂ්‍යයින්ට විභාග දෙපාර්තමේන්තුවේ විභාගවලට පෙනී සිටින්නට සිදු වී තිබෙන්නේ. ඒ විභාගවලින් සමත් වෙන්න ඕනෑ. විශ්ව විද්‍යාලයට යන්නට නම් ඒත් උසස් පෙළ විභාගයට යන්නට ඕනෑ. නමුත් ප්‍රශ්න පත්‍රය වෙළඳාමට තිබෙනවා නම් එමෙන්ම උත්තර පත්‍ර ලකුණු කිරීම ගැන විශ්වාසයක් නැත්නම් උත්තර පත්‍ර ටික සල්ලිවලට ගන්නට තිබෙනවා නම් ඒ ගැනත් විශ්වාසයක් නැත්නම් එහෙනම් අපේ රටේ තත්ත්වය මොකක්ද ?

පසුගිය ඉරිද "වීක් එන්ඩ්" පත්‍රයේ ඒ අයගේ "ඉන්සයිට් ටීම්" එකෙන් ප්‍රවෘත්ති වගයක් පළ කර තිබුණා අපරාධ ගැන හා යුක්තිය පසිඳලීම ගැන. ඒ දෙකෙන් යම්-යම් කරුණු බොහෝම පැහැදිලිව පෙන්නුම් කර තිබෙනවා. අද මොකක්ද තත්ත්වය ? මම අහනවා ඇමතිතුමාගෙන්. මත්ද්‍රව්‍ය ව්‍යාපාරය අද ලංකාවේ කොපමණ දුරට පැතිරී තිබෙනවාද යන වග තමුන්නාන්සේ දන්නවා. මත්ද්‍රව්‍ය ව්‍යාපාරය අද ලංකාව පුරාම ප්‍රචලිත වී තිබෙනවා. ඒකට එක් හේතුවක් තමයි—මම කියන්නේ නැහැ ඒක සම්පූර්ණම හේතුව කියා—නිදහස් විවෘත ආර්ථිකය. කිසිම පාලනයක් නැත්නම්, රේගුවේ පාලනයක් හරියට නැත්නම්, තොටුපොළවල පාලනයක් හරියට නැත්නම්, සල්ලි දී ඕනෑම දෙයක් කරන්නට පුළුවන් නම්—ඔය අහු වෙන සොච්චන්කාරයෝ වාගේ නොවෙයි—මත්ද්‍රව්‍ය විශාල වශයෙන් ගේන මිනිසුන්ට කිසිම අවහිරයක් නැතිව අද ඒවා ගේන්න පුළුවන්කම තිබෙනවා.

මෙහි ප්‍රතිඵලය මොකක්ද ? අද වයස අවුරුදු දහතේ, දහඅටේ, දහනවයේ ඇතැම් ශිෂ්‍ය-ශිෂ්‍යාවන් මත්ද්‍රව්‍ය පාවිච්චි කරන්නට පුරුදු වී සිටිනවා. ඒකයි අද රටේ යථාර්තය. ඒ වාගේ දේවල් කීයක් තිබෙනවාද ? දූෂණය ගැන නම් කියන්නට ඕනෑ නැහැ. නාස්තිය, දූෂණය ගැන මුදල් ඇමතිතුමාත් කරුණු කියනවා. මම එතුමා සමග සම්පූර්ණයෙන්ම එකඟ වෙනවා. අද දූෂණය හොඳ කරන්නට පුළුවන් රෝගයක් නොවෙයි. ඉස්සර මිනිසුන් දේශ පාලකයන්, පරිපාලකයන් ගැන කතා කරන විට, "ඒ මහත්තයා හොඳ මහත්තයා, සල්ලි ගන්නේ නැහැ, දූෂණ නැහැ" යි කිව්වා. නමුත් අද මොකක්ද කියන්නේ ? ආකල්ප වෙනස් වී තිබෙන තරම බලන්න. "කමක් නැහැ පගාව ගන්නට, වැඩේ කරල දෙනවනේ." අද ඒක මිනිස්සුන් බලාපොරොත්තු වන තත්ත්වයට පත්වෙලා. හැම තැනම දූෂණය රජ වෙලා.

රට මේ වාගේ පරිහානියට පත් වී තිබෙන අවස්ථාවක මේ රට පාලනය කරන්නට තමුන්නාන්සේලාට කිසිම විධියකින් යුතුකමක් අයිතියක් තිබෙනවාද ? තමුන්නාන්සේලාට මේ රට පාලනය කරන්නට කිසිම පුළුවන්කමක් නැති බව තමුන්නාන්සේලා ප්‍රදර්ශනය කර තිබෙනවා. පෙන්නා තිබෙනවා. ඒකයි තත්ත්වය. ඒකයි අද ජනාධිපතිතුමාගේ කතාවේ තේරුමත්. ඒ ගැන විවාදයක් තිබෙනවා යයි කියනවා. ඒ නිසා මම ඒ ගැන එහිදී කතා කරන්නම්.

"That even after the conditions precedent for the continuance of a state of emergency had ceased to exist, you did continue to recommend to the President that such conditions did in fact exist and that you did thereby cause the state of emergency to continue until it lapsed on 16th February 1977."

Is any responsible person going to say that a state of Emergency does not exist today ? And mind you, at that time Parliament had no say in extending the Emergency. Today it is different. You have to come here and get a two-thirds majority.

Now let me the other charge that was established.

Charge No. 7 :

"By the aforesaid act you did seek to suppress legitimate political opposition to you and your Government and to harass and interfere with the rights and liberties of your political opponents."

Then Allegation No. 8 :

"That you did approve of a course of action which resulted in unlawful actions which were calculated to disrupt and prevent the Satyagraha organised by the United National Party at Attanagalla in December 1973."

Allegation No. 9 :

"That you did cause the eviction of (*a*) the Venerable Meetiyagoda Gunaratna and (*b*) the Maha Sangha Peramuna from the premises occupied by them at Bauddhaloka Mawatha, Colombo".

Allegation No 10 :

"Whilst the Criminal Investigations Department had, on the directions of the Inspector-General of Police given on the 9th April 1976 been conducting investigations into the alleged threat on the life of Mr. J. R. Jayewardene, then Leader of the Opposition, you did on or about the 26th April 1976, direct the Inspector-General of Police that no complaint made by a politician should be investigated without your permission."

Now, you will see the whole argument of Mrs. Bandaranaike about her civic rights fall by the wayside. I thought that I should clear the air.

The position taken up by Mrs. Bandaranaike in regard to the present crisis was quite different from what she is saying today. She is now demanding an election. Like parrots some of the followers come here and echo that.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

I think that is not parliamentary language.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

"Parrot" is not an unparliamentary word.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

Why not ? Because, Sir, I like to point out to you that when I first came to this House I mentioned that an election should take place. I do not parrot like you.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

"Parrot" is not an unparliamentary word and I am entitled to use that word. But, your nose looks like a parrot.–(*Interruption*). It is very good. It is better than mine.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

You are little jealous of it.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

No. I am jealous, because you have a fine parrot nose.

Now, Sir, I was trying to point out that the attitude of the SLFP was quite different and they scored a very important point. They tried to show to the people that they are prepared to help to solve this problem, and this statement you cannot easily forget.

ගරු කථානායකතුමනි, මම කියාගෙන ආවේ ඒකයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද ඉතාම කනගාටුදායක තත්ත්වයකට පත් වී තිබෙනවා. මම බොහෝම කැමතියි තමුන්නාන්සේලා මෙතැන හිනා වෙනවාට, මම බොහෝම සන්තෝෂයි. (බාධා කිරීම්) ඉතින් අපට බාධා නොකර ඉන්නකෝ, කතා කරන්න. (බාධා කිරීම්) තමන් ශක්තිමත් නම් කලබල නැතිව ඉන්නකෝ වාඩි වෙලා. (බාධා කිරීම්) අපි කියන එක අහගෙන. තමුන්නාන්සේලා කිව්ව ඔක්කොම අපි අහගෙන හිටියානේ. (බාධා කිරීම්)

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

මේක විවාදයක්නේ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

අද තමුන්නාන්සේලා සතුටෙන් ඉන්නවා වාගේ පෙන්වන්නට මෙතැන කොපමණ උත්සාහ කලත් විජය කුමාරතුංගට කියන්න තිබෙන්නේ එක වචනයයි. විරුද්ධ පාර්ශ්වයේ නායකතුමාට කොයිතරම් දුරට විජය කුමාරතුංග එපා වුණාද කිව්වොත් එතුමා බෙලිඅත්තට ගිහින් සෙනග පහලොස් දහක් ඉදිරිපිට මොකද කිව්වේ ?

"අනුර බණ්ඩාරනායක මහතා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරිහානියට පත් කලේ මගේ අවාසනාවන්ත විජය කුමාරතුංග මස්සිනායයි කිය."

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පරිහානියට පත් කලේ ! එය කිව්වායයි එතුමා පිළිගත්තා. දැන් මම කිව්වාම තරකයි. මම කවදාවත් ඔප්පු කරන්නට බැරි දෙයක් මේ ගරු සභාවට ඇවිත් කතා නොකරන බව තමුන්නාන්සේලාට කියා තිබෙනවා. (බාධා කිරීම්)

You are a lawyer. I am not a lawyer. But I was born and bred below the Courts at Hulftsdorp. So I know how to present these things. I am below the Courts.

දැන් මම කිව්වොත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරිගානියට පත්වෙලාය කියා තමුන්නාන්සේලා හූ, හූ ගාලා හිනාවෙනවා. මම කිව්වතේ පොඩ්ඩක් ඉන්න කියලා.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

From where are you reading ?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I am reading from the report of the meeting, which you yourself now accepted as correct.–(*Interruption*). From Beliatta.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I know. What are you quoting from ?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

From "Dinakara."

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I see ! You are reading it.–(*Interruption*)

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

No. From "Lankadipa."

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Early morning you read it.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

"Lankadipa."

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

That is still worse.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Do not be in a hurry. You are very impatient. You have lost your balance altogether. I only mentioned Vijaya Kumaranatuga. First listen to me. That is your trouble, you are impatient. This is not the way to behave in Parliament. You will get into a lot of trouble. I myself have learnt lessons like that. I was also in your position sometimes. Then I learnt these things. You just learn. When you just shout you get into a lot of trouble. Just listen to what I am going to say and then reply or interrupt and your interruption must be intelligent. You must not be idiotic. You will get into trouble.–(*Interruption.*) I am reading from "Lankadipa" of 21 st February 1984.

විපක්ෂ නායක අනුර බණ්ඩාරනායක මහතා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය පරිහානියට පත්කලේ මගේ අවාසනාවන්ත විජය කුමාරතුංග මස්සිනායයි කීය.

මෙතැනත් දැන් කිව්වා ඒක. පරිහානියට පත් කලේ ! පරිහානියට ! මම ඒක කිව්වේ බොහෝම ලිහිල්ව. දුර්වල කළාය කියා.

විජය හා ඔහුගේ මාමා වන කේ. පී. සිල්වා එක් වී මටත් අම්මාටත් දැන් ඉතාමත්ම කැත නින්දිත විධියට අපහාස කරනවා.

" කේ. පී. සිල්වා " – මොකක්ද මේ නැකම ?

I say, what is this ? Your General-Secretary is supposed to be a *Mama* of Vijaya Kumaranatunga ? So there is *Pavul Wadaya* there also.

" විජය හා ඔහුගේ මාමා වන කේ. පී. සිල්වා එක්වී මටත් අම්මාටත් දැන් ඉතාමත්ම කැත නින්දිත විධියට අපහාස කරනවා. මා විරුද්ධ පක්ෂයේ නායකයා බවට පත් වනවා දකින්නත් බැරිව විජය නොයෙක් යටි කුට්ටු ව්‍යාපාර ගෙන ගොස් එය වලක්වන්නට උත්සාහ දැරුවා. "

How can he stop your becoming the Leader of the Opposition ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

You ask him.

ආර් ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

That is why I say that he is such a powerful fellow.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

But he could not do it although he tried. Not only he, others also tried.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Do not get angry now.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

I am not angry. I have stopped getting angry with you four or five years ago.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

මම කිව්වොත් විජයකුමාරතුංග " පවර්ෆුල් " කියලා ඒක වැරදියි.

But you are saying that he tried to stop that. I also know that he tried. I also know that you had to bring certain people and keep them in Colombo.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

No! I say that that is completely incorrect.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

But he was conspiring?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

He was conspiring, but I did not bring anybody and keep in Colombo. That is very unfair. It is very unfair for the Prime Minister to say that. He must withdraw that.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

All right. What did I say?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

That I kept people in Colombo–M.Ps.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I did not say M.Ps.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Then what did you say?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I said 'people'.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

How can I keep people? Colombo is yours, not mine?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Even to protect?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

No!

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

What? He is on the other side?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Who?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Why, Vijaya? You are such a decent person that you do not want to fight him there. I know the problems you are having there.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

How do you know?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You are asking me? Now, he is trying to put you into trouble. He is asking me, How do you know?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

You are the man who is trying to put him into trouble!

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

One thing, please be careful of him. That I will tell you. Do not think that he is happy with you.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

We will not do what you did to the Rukman Senanayake boy. We will not do that to this boy.

මන්ත්‍රීවරු
(அங்கத்தினர்)
(Members)

Boy? Boy?–*(Interruption)*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

What you did to Rukman we will not do to Anura Bandaranaike.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Who is the boy ? Is he the boy or are you the boy ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

What you did to Rukman will not happen to Anura.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Yes. We threw Rukman out of our Party. That is an open thing. We were all party to that–we all contributed to that. We voted publicly at the Ramakrishna Mission Hall. We will not do anything underhand.

" 'මම විරුද්ධ පක්ෂයේ නායකයා බවට පත් වෙනවා දකින්නත් බැරිව විජය නොයෙක් යටි කුට්ටු ව්‍යාපාර ගෙන ගොස් එය වලක්වන්නට උත්සාහ දැරුවා. මමත් අම්මත් අතරේ භේද ඇති කරන්නට විජය මුල සිටම ක්‍රමානුකූල කුමන්ත්‍රණ ඇටෙව්වා. මුහුණේ දැලි ගා ගෙන ගෙදර යන එකම කාලකන්නියා විජය කුමාරතුංගයි. ඔහු දේශපාලනයෙන් හුඟක් වාසි ලබා ගන්නා. රදළ පවුලක කාන්තාවක් විවාහ කරගෙන රදළයන්ට බණිනවා. එහෙම නම් මාලතී පොත්සේකා වැනි කතක් කසාද බඳින්නට තිබුණා නේද ? චන්ද්‍රිකා හදපු ගෙයි ඉඳගෙන අපේ දේවල් කකා බිබී අපට බණිනවා ' යයිද අනුර බණ්ඩාරනායක පැවසීය. ළඟදීම මෛත්‍රීපාල සේනානායක මහතා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට එන බව අනුර බණ්ඩාරනායක මහතා කීය. " (බාධා කිරීම්)

අපේ සොබ්‍ය ඇමතිතුමා කියනවා ඕවා අහන්න පහලොස් දහක් එන එක පුදුමයක්ද කියලා. ඒ වාගේම තමයි එයාගේ මේ රැස්වීම්වලත්. අනුර බණ්ඩාරනායක විපක්ෂ නායකතුමාට පතුරු යන්නට බණිනවා. අපිට බණින එක කාරියක් නැහැනෙ. අපි පතුරු ගැහිලා ඉන්නේ. (බාධා කිරීම්) මට බණින්නේ නැහැ ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

තමුන්නාන්සේ ගැන මොනවාවත් කියන්නේ නැහැ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

මම ඒ ගැන කණගාටු වෙනවා.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

බණින්නේ ජනාධිපතිතුමාට විතරයි. තමුන්නාන්සේ ගැන මොනවාත් කියන්නේ නැහැ (බාධා කිරීම්)

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

තමුන්නාන්සේලා ඉස්සර කිව්වා මම තමයි රෝහණ විජයවීරට උදව් කරන්නේ කියලා. ඇයි මතක නැද්ද. (බාධා කිරීම්)

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඔය විධියට ඒ කාලයේදී විජයවීරවත් වර්ණනා කළා.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

මම දැන් වර්ණනා කරන්නේ නැහැ. මම මේ වර්ණනා කරනවා නොවෙයි. මම කියන්නේ එයාට විරුද්ධව කියාපුවා.

ගරු කථානායකතුමනි, මොකක්ද බණ්ඩාරනායක මැතිණිය කිව්වේ ?

" උතුරේ කොටි ව්‍යාපාරය දැන් නැගෙනහිර පළාතටත් ව්‍යාප්ත වී ඇතැයි සඳහන් කළ එම මහත්මිය අද උතුරේ පාලනයක් නොමැති තරම් යයිද කීවාය. උතුරේ කොටි මරන්න යනවා නම් අපිත් එනවා යයිද, වට මේස සාකච්ඡාවලින් උතුරේ ප්‍රශ්නවලට විසඳුමක් ඉදිරිපත් වේදැයි සැක සහිත යයිද එතුමිය කීවාය. "

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

She never said that.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

She never said that ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

No.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

If you say that I will accept it. She did not say, " වට මේස සාකච්ඡාවෙන් ප්‍රයෝජනයක් නැහැ " ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

First thing, about the " කොටියා "-she did not say that.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

" උතුරේ කොටි මරන්න යනවා නම් අපිත් එනවා " කියා කිවේ නැද්ද ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

නැහැ, ඒක කිවේ නැහැ. I was there.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Did she say how to combat terrorism in the North ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

No. She may have referred to it but she did not say that particular thing.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

මම ඒකටයි එන්නේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ හමුදාවල් දුර්වලයි කියා කීවා මේ විවාදයේදී. අපේ හමුදාවලට මුකිස්සම් නැතිව තුවක්කු දෙනවලු පාවිච්චි කරන්න. තමන්ගේ රාජකාරිය ඔවුන්ගේ හමුදා නීතිරීති අනුව කරන්නට හමුදාවලට ඉඩ දෙනවට කැමතිද කියා මා අහන්න කැමතියි නියෝජ්‍ය කථානායකතුමනි. ඒකට කැමතිද ?

Are you asking us to tell the security services, the defence forces, "Now look, there is a serious threat to the independence, unity and integrity of this country; you are the forces of this country, you are people of this country; it is an abnormal situation." According to Mrs. Bandaranaike it is a very, very serious situation. I want to ask this question from the Opposition. Are you asking us to tell the defence forces, "Now go and combat terrorism in the manner that you think it can be done"? Is the Opposition going to support that? These are important questions.

It was His Excellency the President, our leader, the Leader of the Opposition in 1971, who told Mrs. Bandaranaike across the floor of the Parliament, "You do anything to combat the present situation; we are with you". I can give you the quotation. I have it with me. Have you got the guts to say the same thing to us today? I am asking that. You can talk all sorts of things here. You can say, "this Government is weak, your writ is not running in the North and the East". You can say, "what are you doing when your banks are robbed, when people are shot, when terrorists are having more sophisticated arms, than your forces?" You can say all this here. You can take satisfaction over that. On the other hand you say that the forces are just watching, they are not given the freedom to act. You can say all that. Can you answer my question? Are you prepared to tell the forces, "Now look, it is a very, very serious situation; this is a situation that threatens the integrity and sovereignty of this country; let the forces combat that." Are you prepared to say that?

That is one of the questions that has come up before the All-Party Conference. It is easy for political parties to come here and criticize and mouth all sorts of inspiring and attractive slogans, but they are not ready to take their responsibility. Why cannot they come to the conference where all parties are meeting and take part in the deliberations? There are two things that we are discussing, which is very well known. Firstly, the question of eradication of terrorism from Sri Lanka. That is a common threat not only to the UNP. Are you going to say that we shall dissolve Parliament today, hold elections tomorrow, and the day-after-tomorrow when you come into office this terrorism will go off?

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

We will fight it.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You will fight it! I know how you will fight it. All right, we will make you the commander-in-chief. You go and fight.

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

That is also a part of the thing.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I know, I will tell you how you people fought. When Kandasamy was shot in 1947 at Dematagoda all the leaders ran away! You should have asked the late Mr. Phillip Gunawardena. On that occasion in 1947, in the public servants' strike, you led the demonstration towards the oil installation. The police opened fire. The Kandasamy sacrificed his life. The leaders all disappeared.

දෙමටගොඩ රාළහාමිගේ වත්තේ කම්බි පොටවල් අටකට උඩින් පැන්නේ එක නායකයෙක්. එහෙම පැනල ගිහින් ගෙයකට රිංගුවා. ඒ අවස්ථාවේදි ඒ ගෙදර කාන්තාව කම්බායක් අඳිනවා මාර්කට් එකට යන්න. ඒක පොරවාගෙනයි එයා ඇඳ අස්සට රිංගුවේ.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

විරයෝ ! විරයෝ !

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

It was stated publicly by Mr. Phillip Gunawardena.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

ඇගේ තිබුණු රෙද්දත් නැහැ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

අපට පුළුවන් ගිහින් කරන්නට කියා කියනවාද ? ඇයි මිසිස් බණ්ඩාරනායක කියන්නේ නැත්තේ ඒක ? ලංකාදීප පත්තරයේ කියලා තිබෙනවා, "උතුරේ කොටි මරන්න යනවා නම් අපිත් එනවා" කියා. නමුත් විපක්ෂ නායකතුමා කියනවා එහෙම එකක් කීවේ නැහැ කියා. එහෙම කියන නිසා මා එය බාර ගන්නවා. කොහොමද මේ කොටි මර්දනය කරන්නේ ? කියන්න. කොහොමද එය මර්දනය කරන්නේ ? ඡන්දයක් පවත්වනවා නම් උතුරේ හා නැගෙනහිරේ හැර එය පවත්වන්නද කියන්නෙ ? මහ මැතිවරණයක් ඉල්ලනවා. නමුත් මැතිවරණ කොමසාරිස්ට පුළුවන්ද ඡන්දයක් පවත්වන්නට. මොනවද නියෝජ්‍ය කථානායකතුමනි කියන්නේ ? මෙහි කෑ ගහන්න පුළුවන් වීරයන් වගේ නමුත් රාජකාරියක් කරන්න යන විට කියනවා, "අපොයි මට නම් යන්න බැහැ" කියා. මට නිලධාරියෙක් යවා ගන්න

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

බැරිව ඉන්නවා, රාජකාරිවලට. නමුත් කථා කරනවා මහ ලොකුවට. ඒ නිසයි මා කිව්වේ නිකම් බොරුවට පුහු තර්ක ඉදිරිපත් කරන්න ඕනෑ නැහැ කියා. මේ වේලාවේදී අවශ්‍යතාවය මහ මැතිවරණය නොවෙයි ? මහ මැතිවරණයක් පවත්වන්නටත් අවශ්‍යයි සාමය. මතුගම ගරු මන්ත්‍රීතුමා (අතිල් මුණසිංහ මහතා) කියනවද, එතුමාගේ මේ ප්‍රකාශය මේ රටේ ජනතාව පිළිගන්නවයි කියා.

මොකක්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සිදු වුණේ ? එය මම කියන්නම්. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඒ පක්ෂය ඇතුළේ තිබුණු ත්‍රස්තවාදය මර්දනය කර ගන්න බැරි වුණා. ඒ පක්ෂයෙන් කණ්ඩායමක් කැඩිලා ගියා. අද ඒ කණ්ඩායම ශ්‍රී ලංකා නිදහස් පාක්ෂිකයන්ව එක්රැස් කර ගන්නවා. එය පිළිගන්නට ඕනෑ. විජයකුමාරණතුංග බොහොම මහන්සිවෙලා වැඩ කරනවා. එය පිළිගන්න ඕනෑ. එය ඕනෑම දේශපාලනඥයෙකුට ආදර්ශයක්. රැස්වීමක් පවත්වන්නට ඉස්සෙල්ලා ඒ මුළු පලාතෙම රැස්වීම් පවත්වනවා. මා කියන්නේ දක්ක එකක්. මෙහි ඇත්ත තත්ත්වය කිව්වම ඇති වරද මොකක්ද ? ඒ අයට මුදල් ලැබෙනවා කියා බණ්ඩාරනායක මැතිණිය කියනවා. මුදල් නැතිව කොහොමද ඒවා කරන්නේ ? මුදල් ලැබෙනවා. [බාධා කිරීම්] තමුන්නාන්සේලා දන්නවද, තමුන්නාන්සේලාට ලැබුණු මාර්ගවලින් තමයි එයාටත් ලැබෙන්නේ.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)
නැහැ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)
ඇයි නැත්තේ ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
අද මහාරාජා සංවිධානයේ වාහනයක්—

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)
ඉන්ඩකො කලබල නැතිව. දැන් තමුන්නාන්සේලාට මුදල් දුන්න අය විශ්වාස කරනවා—

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
අද මහාරාජා සංවිධානයේ වාහනයක් පාවිච්චි කරන්නේ, නුවරඑළිය දිසා ඇමතිතුමියගේ පරණ කාර් එක.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)
මොකක්ද ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
අද විජයකුමාරණතුංග පාවිච්චි කරන්නේ මහාරාජා සංවිධානයෙන් නිකම් දුන්න වාහනයක්.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)
කාගෙ ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
නුවරඑළිය දිසා ඇමතිතුමියගේ වාහනය.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)
කව්ද කිව්වේ ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
මට ආරංචියි.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)
ආරංචි කියන්න එපා. ඒක ඇත්තටම සොයාබලා කියන්න. [බාධා කිරීම්] ඒක මම විකුණලා නැහැ. මගේ නමින් හොඳට තියෙනවා වාහනය. තමුන්නාන්සේ ඒක සොයා බලන්න.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
ඒක දුවවන්නේ විජේකුමාරණතුංග.

රේනුකා හේරත් මහත්මිය
(திருமதி ரேணுகா ஹேரத்)
(Mrs. Renuka Herath)
මා හිතන්නේ බයවෙලා ඇති. පසුගිය දවස්වල විජේකුමාරණතුංග නුවරඑළියෙන් ආවනේ. ඒකට බයවෙලාද දන්නේ නැ ඔහොම කියන්නේ.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
කිසි බයක් නැහැ. මිනිස්සු 300 ක්වත් හිටියෙ නැහැ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)
මොකක්ද කියන්නේ ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
මහාරාජා සංවිධානයෙන් දුන්න වාහනයක් අද විජේකුමාරණතුංග පාවිච්චි කරන්නේ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)
කාගේ එකක්ද ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
මහාරාජා සංවිධානයෙන් දුන්න එකක්. එය ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ සංවිධානයක් නොවෙයි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)
එහෙම නම් මේ නුවරඑළිය දිසා ඇමතිතුමිය ගැන කීවේ මොකක්ද ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)
ඒක එතුමියගේ වාහනයක්.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)
එතුමියගේ පරණ කාර් එක.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

එතුමියගේ කාර් එක ඒ ගොල්ලො සල්ලිවලට අරගෙන තිබෙනවා. කුමාරණතුංග ඒක නිකම් පාවිච්චි කරනවා.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ඒක වැදගත් ආරංචියක්. මට පේන්නෙ මේ රටේ කාන්තාවො ඔක්කොම විජය කුමාරතුංගගෙ පැත්තට හැරෙනව වගෙයි.

You are telling a very serious thing. It looks as if all the women, irrespective of their party affiliations, are joining Kumaratunga.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

එක්සත් ජාතික පක්ෂයෙ කාන්තාවොත් යයිද දන්නෙ නැහැ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ඒක තමයි. මට පේන්නෙ පක්ෂ භේදයෙන් තොරව කාන්තාවො කවුරුත් විජය කුමාරතුංගටම එකතු වේ ගෙන යනව වගෙයි.

So it is a threat to both parties.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

And to you.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Very good that you gave me this information. Now we have to be careful about ourselves also.

මම කියන්නෙ තමුන්නාන්සේලාගේ පක්ෂය පමණක් නොවෙයි අපේ පක්ෂයත් දූන් ටිකක් කල්පනාකාරී විය යුතු බවයි. මට ආරංචියි අපේ උදවියත් බැදෙනවාය කියලා.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

ඔව්

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You have come to an agreement with me and all the time they were fighting with me! When I said that 'samavadanas' are also joining, he said "yes".

(*Interruption*) That is right. I am coming to that. You gave me a very good point.

එතකොට බලන්න කල්පනා කරල. බලයේ ඉන්න පක්ෂයෙන් සමහර අය බැදෙනවා නම් මේ බලය නැති පක්ෂයේ අය බැදෙනවාය කියන එක පුදුමයක්ද ?

Let us face the realities. You must accept the position that since the establishment of the Sri Lanka Mahajana Pakshaya, the SLFP has lost its balance.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

Not at all.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Certainly not!

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Tell me, why did you–

අනිල් මුණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

You are taking the argument away from the Emergency.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

No, no; I am only replying to all your arguments. You never confined yourself only to the Emergency. This is a bigger emergency. This is a threat to all established parties. So you must be very careful.

නියෝජ්‍ය කථානායකතුමනි, මේකයි ප්‍රශ්නය. මේ රටේ ත්‍රස්තවාදය මර්දනයට සහ මේ රටේ ඇති වී තිබෙන ජාති භේද වාදී අරගලයට විසඳුමක් සෙවීමට පියවර ගැනීම මේ තරම් අවශ්‍යයි කියපු ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇයි මේ සර්ව පාක්ෂික සම්මේලනයට දැන් නැවිත් ඉන්නෙ ? මහජන එක්සත් පෙරමුණ සම්මේලනයෙන් ඉවත්ව ගිය වෙලාවෙ බණ්ඩාරනායක මහත්මිය කළ ප්‍රකාශය මා ළඟ තිබෙනවා. "අපි නම් කවදවත් සම්මේලනයෙන් පැනල යන්නෙ නැහැ " කිව්වා.

We will be there to protect the interests of all the people. But now what are you doing ?

ඒකයි මම කිව්වෙ. නැතිව අවුස්සන්න කිව්ව නොවෙයි.

She said this in Galle.

"Ethnic problem–SLFP will help to find a solution–Sirima."

I am quoting from the "Ceylon Daily News" of 16th January, 1984 at page 1. (Galle Spl. Correspondent.) :

"The leader of the SLFP Mrs. Sirima Bandaranaike said here that her party was prepared, regardless of political differences, to assist in finding a lasting solution to the country's ethnic problem in the interest of the people."

Now this report tallies with the "Lanka Guardian". The "Lanka Guardian" is not a Lake House paper මොකද ? Because the hon. Member for Attanagalla asked. "What paper ? The "Daily News" ? All right !" කියන කොට මම දැනගත්ත ඒක.

(*Interruption*) Right, I know you, don't I ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

I also know you.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

It goes on further :

"Addressing the annual prize day meeting of the Siri Pavarakitti daham pasala at the Asvattaramaya at Talgasyaya in the Akmeemana electorate she said minority communities should be granted their due rights while preserving the unitary status of the country."

That is also in keeping with the first statement. Very good. That is our position also.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

You are changing the systems of the government.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

We are worried when you brought that.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

That is right. So, your responsibility is to oppose it, and suggest an alternative. We are entitled to our view and you are entitled to your view. So you study it and without running away face the issue like a responsible party.

"The whole nation would face a major catastrophe in the future unless a solution was found to this problem.

She said India's Prime Minister, Mrs. Indira Gandhi, too was facing a similar problem in her country.

A solution to the ethnic problem would not be difficult if the amity talks are conducted in an honest and sincere manner.

The SLFP is sending two delegates to these talks following a majority decision by its politburo, she added."

Then others also have spoken at that meeting.

I now quote the "Sun" of the 21st of January, 1984, where Mrs. Bandaranaike says :

"There is a difference of opinion in regard to our political views and party policies. But, in a crisis of this nature, we must forget all our differences and make an attempt to find a solution through discussion and compromise. Walkouts and evading the problems are no solutions, the SLFP leader said."

" විදේශ ආක්‍රමණ ඇති නොවේ යැයි සිතන්න බෑ—ජාතියේ ස්වාධීනත්වයට තර්ජනය සහාය දෙනවා—සිරිමාවෝ බණ්ඩාරනායක "

1984 ජනවාරි 21 වන දින " දවස " පත්‍රය. 1 වන පිටුව. 6 වන තීරුව.

That is the crisis. ඒක මම කිව්වම හිනහ වෙනවා.

The crisis today is not only an internal crisis. It is more an external one.

බණ්ඩාරනායක මහත්මිය කියනවා " විදේශීය ආක්‍රමණ ඇති නොවේ යැයි සිතන්න බෑ " කියල. ඒක වළක්වන්න පුළුවන්කමක් නැහැ මෙහෙ ඡන්දයක් පවත්වල. අපි මෙහෙ ඡන්දයක් පැවැත්වුවාය කියල විදේශීය ආක්‍රමණ නොවී තියෙන්න බැහැ.

මොකක්ද විපක්ෂ නායකතුමා අද කිව්වෙ ? එතුමාගේ කථාවක් " දිනකර " පත්‍රයේ වැරදියට වාර්තා කර තිබෙනවාය කිව්වා. " ඉන්දියාව මේ රට ආක්‍රමණය කරයි " කියන වාර්තාව. ඒක ගැන එතුමා පැහැදිලි කළා. මොකක්ද එතුමා කිව්වෙ ? ජූලි මාසයේ ඇති වූ සිද්ධිය වාගේ තව එක සිද්ධියක් ඇති වුණොත් ආක්‍රමණයක් වළක්වන්න ඉන්දියානු අගමැතිනියටත් බැරි වෙයි කිව්වා. ඒක එතුමා අදත් මෙතැනදී කිව්වා. ඉන්දිරා ගාන්ධි මැතිනිය ආක්‍රමණය කරයි කියල කිව්වෙ නැහැ. නමුත් එතුමියටවත් වළක්වන්න බැරිය කිව්වා. ඡන්දයක් පවත්වන කොට එහෙම තව අර විධියෙ සිද්ධියක් ඇති වුණොත් මොකක්ද තත්ත්වය ? තිකම් කට තිබුණට වචන ගලාගෙන ආවට කැගහන්න පුළුවන්කම තිබුණට යමක් කියන්න පුළුවනි. නමුත් යථාර්ථයෙන් මේ ප්‍රශ්නය දිහා බලන්න ඕනෑ. මම එතුමන්ලාගේම තර්ක අරගෙනයි මේ කථා කරන්නෙ.

ජනවාරි මාසයේදී බණ්ඩාරනායක මැතිණිය කිව්වා, විදේශ ආක්‍රමණ ඇති නොවෙයි කියා හිතන්න බැහැ කියලා. " මෙය විදේශ ආක්‍රමණ ඇතිවෙන දෙයක් නොවෙයි ; මෙය ආභ්‍යන්තරික සිද්ධියක්. මේකට තියෙන්නෙ මැතිවරණයක් පවත්වන එකයි " කියල එතුමිය කියනවා නම් ඒක වෙනම දෙයක්. නමුත් විජය කුමාරණතුංග කලඑළි බහින්න ඉස්සෙල්ල තත්ත්වය යථාර්ථයෙන් දක්කා. ප්‍රකාශ කළා. විජය කුමාරණතුංග කියන්න පටන්ගත්තා, " අයියෝ දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයක් නැහැ. අනුර බණ්ඩාරනායක මහත්මයා—විරුද්ධ පක්ෂයේ නායකතුමා—ජනාධිපතිතුමාගේ මිත්‍රයෙක් " කියල. එතකොට ඕව නේ රැස්වීම්වල ගිහින් කියන්නෙ ? " දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්සත් ජාතික පක්ෂයේ වලිගයක් වෙලා. කියන කියන හැටියට කරනවාලු " ඔන්න කලබල වුණා. එහෙම නොවෙයි නම් මොකටද කලබල වෙන්නෙ ? නායකත්වයකට, පක්ෂයකට යම්කිසි ශක්තියක්—ආත්ම ශක්තියක්—තිබෙන්න එපායැ ? " මේ කිසි වගකීමක් නැති මනුෂ්‍යයෙක් කියන කතාවක්. අපි මේ රටේ වගකීමගන්න ඉන්න පක්ෂයක්. අපි මෙහි ඇත්ත තත්ත්වය දකල තිබෙනවා " කියල කලබල නොවී ඉන්න එපායැ ? අද විපක්ෂ නායකතුමාම කියන විධියට ඉන්දිරා ගාන්ධි මැතිණිය නොවෙයි ආක්‍රමණය කරන්නෙ. නමුත් වෙනත් අය ආක්‍රමණය කරන එක එයාට නවත්වන්නත් බැරි වෙයි. මේ වෙලාවෙ තිබෙන්නෙ අර පටු පක්ෂ භේද උඩ ක්‍රියා කිරීම නොවෙයි. මේවාට විසඳුමක් ඇති කර ගන්න ඕනෑ. " අපි ඉදිරි කාලයේදී මේ රට පාලනය කරන්න ඉන්න කණ්ඩායමක්. සාමය තිබෙන්න ඕනෑ. " අන්න එහෙම නේ කතා කරන්න ඕනෑ. නමුත් අද මොකක්ද ඇතිවෙලා තිබෙන තත්ත්වය ? විජය කුමාරණතුංග හෙට මොනවා හරි කිව්වොත්, අනිද්ද ශ්‍රී ලංකා නිදහස් පක්ෂය රැස්වෙනවා. ඒ මනුෂ්‍යයාට පක්ෂය ඇතුලේ ඉදගෙන කරන්න බැරි වුණ දේවල් දැන් පක්ෂයට පිටින් ඉදගෙන කරනවා. මේ අය ඔක්කොම නටවනවා. එක වචනයක් කිව්ව හැටියේම ප්‍රවෘත්ති පත්‍ර ප්‍රකාශ ගණනාවක් නිකුත් කරනවා. So we have seen the weakness of these people. He is overtaking the SLFP. ඒක කිව්වාම, මමලු ඊට උදව් කරන්නෙ කියල මට කිව්වා. මම නොවෙයි, නමුන්නාන්සේලාගෙ ක්‍රියා කලාපයයි උදව් කරන්නෙ.

කාරණා දෙකක් උඩ සර්ව පාක්ෂික සාකච්ඡාවෙන් පිටමං වෙනවය කිව්වා. ඒ කාරණා දෙකම අද බොරු වී තිබෙනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය එක්සත් ජාතික පක්ෂයට එකතු වෙනවය කියල විජය කුමාරණතුංග කියන නිසා ඒ සාකච්ඡාවට එන්නෙ නැහැ. එතැනට එන අය ඔක්කොම අප කියන ඒවට එකඟ වෙන අයද ? අපි කියා තිබෙන්නෙ නම නමන්ගේ පක්ෂවල මත මතාන්තර ඉදිරිපත් කරන්නය කියලයි. සර්ව පාක්ෂික සම්මේලනයේ ලේකම්තුමාට මම ඊයේ කිව්වා, ඉදිරිපත් කළ ලියවිලි ඔක්කොම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයටත් යවන්නය කියා.

All proposals made by various people you can go into. We have nothing to hide, the UNP has nothing to hide. We have given them. Now, he will send them to you. Although you are not coming to the All Party Conference, His Excellency the President agreed with

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

me and said that they will be circulated to all Parties, including your Party. These things will be tabled at the appropriate time. Nothing will be done without Parliamentary sanction. Not only Parliamentary sanction, but without the endorsement of the people of Sri Lanka we shall not do anything. So do not just try to score petty political points by just shouting all sorts of irresponsible statements.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඒ අයට කියන්න කැමතියි, මොකක්ද වගකීම කියල කල්පනා කරන්නය කියා. මේ රටේ මහජනතාවගේ කැමැත්තෙන් බලයට එන්න බලාපොරොත්තු වෙනවා නම් වගකීමක් ඇතිව වැඩ කරන්න ඕනෑ. වගකීම ඇති පක්ෂයකට තමයි මේ රටේ ජනතාවගේ ඡන්දය ලැබෙන්නෙ. දේශපාලනඥයන් යමක් කියන විට කරන්න පුළුවන් ඒවා මොනවාද, බැරි ඒවා මොනවාද කියල මේ රටේ ජනතාව දන්නවා. අවුරුදු හතලිහක් පනහක් තිස්සේ මේ රටේ වාමාංශික පක්ෂ කිව්ව දේවල් අපි දන්නවා. මොන තරම් හිත් කාවදින සටන් පාඨද ඒ අය කිව්වේ ? ඒවායින් මේ රටේ ජනතාව රවටන්න පුළුවන් වුණාද ? අද අන්තිමට එක්කෙනාට බැහැල. උසාවි තීන්දුවෙන්වත් බේරෙන්නයි කියල මම ප්‍රාර්ථනා කරනවා. නිකම් කෑගහල කියන සිත් කාවදින සටන් පාඨවලින් මේ රටේ ජනතාව මුලාවෙන්නෙ නැහැ. මොනවාද කරන්න පුළුවන් ඒවා, මොනවාද කරන්න බැරි ඒවා කියල ජනතාව දන්නවා. මොන තරම් සිත් කාවදින සටන් පාඨද කිව්වෙ ? බැංකු ගන්නවයි කිව්වා. අරව ගන්නවයි කිව්වා, මේක ගන්නවයි කිව්වා. ඇමතිකම් දෙක තුනක් දීල බැලුවා. අයියෝ, ඒ හරිය මොනවාටද මම මතක් කරන්නෙ ? ඒ ඉතිහාසය මොකටද මතක් කරන්නෙ ? විපක්ෂ නායකතුමාම කියනවා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය අද මේ තත්ත්වයට වැටුණේ මොන ප්‍රතිපත්ති අනුගමනය කරන්න ගිහිල්ලද කියල. ඉලංගරත්න හින්දයි ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැති වුණේ කියලත් දැන් එතුමා කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ඇති වී තිබෙන ත්‍රස්තවාදී තත්ත්වය මර්දනය කරන්නට මේ රජය අපොහොසත් වී තිබෙනවාය කියා එක පැත්තකින් අපට කියනවා. දැන් අමෙරිකාවත් එක්ක එකතු වෙලා, අමෙරිකන් හමුදාවත් ගෙනල්ලා මේක මර්දනය කරන්නට හදනවාය කියා අනික් පැත්තෙන් කියනවා. මොකක්ද මේ තර්කයේ තේරුම ? හොඳයි බැරිවෙලාවත් අපි එහෙම පසුගිය අවුරුදු පහ හය තුළදී අපේ ධන සම්භාරය යොදා, අපේ හමුදා තර කළා නම්, ගරු මුදල් ඇමතිතුමා ආරක්ෂක අංශයට රුපියල් කෝටි ගණනක් වෙන් කර තිබුණා නම් ආරක්ෂක අමාත්‍යාංශයේ වැය ශීර්ෂය සාකච්ඡා කරන අවස්ථාවේදී මේ ගරු සභාවට ඇවිදින් මොකක්ද කියන්නේ ? පතුරු ගහයි නියාගෙන. "රට සංවර්ධනය කරනවාද ? මේ හමුදාවන් තර කරන්නේ මොනවාටද ? මේ පුහුණු කිරීම් කරන්නේ මොනවාටද ? මේ අවි ආයුධ රැස් කරන්නේ මොනවාටද ?" කියලා කියන්නේ නැද්ද ? මට හිතෙන හැටියට අපේ ආරක්ෂක අංශයට තමයි, ඉතාමත් අඩු මුදලක් වෙන් කර තිබෙන්නේ.

ආර්. ජේ. ජී. ද මැල් මහතා (මුදල් හා ක්‍රම සම්පාදන ඇමතිතුමා)
(திரு. ஆர். ஜே. ஜீ. த மெல் — நிதி, அமைப்புத்திட்ட அமைச்சர்)
(Mr. R. J. G. de Mel-Minister of Finance and Planning)

Two per cent.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Two per cent.

ඒකත් දැන් තරකට හිටලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආභ්‍යන්තරික ආරාවුල්, කැලඹිලි මතුවන්නේත්, ඒවා මර්දනය කරන්නට ගන්නා ක්‍රියා කලාප කාටත් දැන ගන්නට ලැබෙන්නේත් ජන සම්මතවාදී පාලන ක්‍රම ඇති රටවල පමණක්ය කියල මම කිව්වා. සමාජවාදී රටවල් ගෙනයන වැඩ පිළිවෙළම මෙහෙත් ක්‍රියාත්මක කරන්නය කියා කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) අපට කියනවාද ? "මේ දේශපාලන පක්ෂ ක්‍රමය අවශ්‍ය නැහැ, ඒකෙන් කෙරුණු සේවය අවසානය. දැන් මේ රටේ දියුණුවක් ඇති කරන්නට සියලු දෙනාගේම අදහස් උදහස් යොදවා වැඩ කරන ක්‍රමයක් ගැන අපි හිතන්නට ඕනෑ" කියා මම කිව්වාම ඒකට මොකක්ද කියන්නේ ? "ඒක හොඳ නැහැ. මේ තනි පක්ෂයක් තියා ගන්නටයි හදන්නේ" කියා එතකොට කියනවා. කවුද මේ කියන්නේ ? තනි පක්ෂයකින් රට පාලනය කරන වැඩ පිළිවෙළවල් හිස් මුදුනින් අදහන මන්ත්‍රීවරයෙක්.

සෝවියට් දේශයේ තිබෙන දේශපාලන ක්‍රමය මොකක්ද ? නැගෙනහිර ජර්මනියේ තිබෙන දේශපාලන ක්‍රමය මොකක්ද ? කියුබාවේ තිබෙන දේශපාලන ක්‍රමය මොකක්ද ? ඒක මම කියන්නට ඕනෑද ? ඒකත් මම විස්තර කරලා දෙන්න ඕනෑද ? ඒ රටවල එහෙම මේ වගේ කැලඹිල්ලක් ඇති වුණොත් කොයි විධියටද මර්දනය කරන්නේ ? ඒවා හරි අපට කියල දෙන්න. අපේ තවත් මිත්‍ර රටක් විවේචනය කරන්නට කලවානේ ගරු මන්ත්‍රීතුමාට (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) හොඳයි. හැබැයි, සෝවියට් දේශය ගැන මම එහෙම යමක් කිව්වොත්, "අපෝ ! ඒක අපේ විදේශ ප්‍රතිපත්තියට සුදුසු නැහැ නේද ?" කියල කියයි. එය, ඒගොල්ලන්ගේ රටක් ගැන කිව්වොත් පමණයි. මම ඒ තරම් දුරට යන්නට නොවෙයි හදන්නේ. මම එහෙම කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. එක එක රටවල් තම තමන් කැමති වැඩ පිළිවෙළවල්, දේශපාලන ක්‍රම පිළිගෙන තිබෙනවා. ඒවා සංසන්දනය කරන්නට ඕනෑ නැහැ. අමෙරිකාව ඒගොල්ලන්ගේ ක්‍රමය පිළිගෙන තිබෙනවා. සෝවියට් දේශය ඒගොල්ලන්ගේ ක්‍රමය පිළිගෙන තිබෙනවා. චීනය ඒගොල්ලන්ගේ ක්‍රමය පිළිගෙන තිබෙනවා. ඉන්දියාව ඒගොල්ලන්ගේ ක්‍රමය පිළිගෙන තිබෙනවා.

නමුත් මම පෙන්වන්නට හදන්නේ ජනසම්මතවාදී රටවල්වල ආභ්‍යන්තරික අර්බුද විශේෂයෙන්ම මතු වී පෙනෙන බවයි. ඒ වාගේම ඒවාට ගන්නා ක්‍රියා කලාපයක් මතු වී පෙනෙනවා. 1971 කැරැල්ලේදී සමසමාජ පක්ෂය කිව්වේ මොකක්ද ? ඒකම නේද කිව්වේ ? ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට ඒක දැන් මතක නැහැ. ඒගොල්ලන්ට සමසමාජ පක්ෂය කී දේ දැන් ඒ ගොල්ලන් අපට කියන්නට පටන් ගෙන තිබෙනවා. 1976 අප්‍රියෙල් 22 වැනිද හැන්සාඩ් වාර්තාවේ 2084 තීරුවේ මේ විධියට කියනවා.

"(Mrs. Sirimavo R. D. Bandaranaike–Prime Minister and Minister of Defence & Foreign Affairs, Minister of Planning & Economic Affairs and Minister of Plan Implementation)

Today's 'Janadina' contains a news item under banner headlines–'American Army to Kill our Youth'. According to this news item, the leader of the L.S.S.P., Dr. N. M. Perera, has made a statement at Ragama that I had proposed that American troops be brought down to Sri lanka in order to bring under control the insurgency that broke out in April 1971. He has also stated that, had he not participated in the diccussions at 'Temple Trees' on this occasion as a member of the L.S.S.P., the proposal I made would have been accepted, and the children of our cultivators would have been killed at the hands of American soldiers."

Now, who has said this ? A responsible Minister of the Government who had been holding office in 1971. He makes a public statement. What does he say ? He is making the charge against Mrs. Bandaranaike that Mrs. Bandaranaike proposed that American troops be brought down to Sri Lanka in order to bring under control the insurgency that broke out in April 1971. Whom are you going to believe, Mrs. Bandaranaike or Dr. N. M. Perera ? Now, that is a matter of choice. I know that the hon. Member for Kalawana will believe Dr. N. M. perera. The hon. Leader of the Opposition will believe his mother. I do not know aout the others. Openly they may believe something; inside they may believe something else. I do not know. Whom are we to believe? That is the question. The hon. Member for Matugama must have believed it then. He would have believed Dr. N. M. Perera in 1971, but now he will

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

believe somebody else. That is how it works with him (*Interruption*). Now, now, you do not want me to bring out your record–how you change your beliefs in regard to people ?

Then she says :

"I am astonished that a person of Dr. N. M. Perera's standing can fabricate such a story".

She has made a very serious charge against Dr. N. M. Perera. In fairness to Mrs. Bandaranaike I will read the whole thing.

"During the early days of the insurgency we met in Cabinet almost every day to review the situation, after obtaining reports from the Service Commanders and the I.G.P. At no stage did I make a proposal, nor did the thought enter my mind, of obtaining foreign troops to deal with the situation. We were certainly short of vital equipment such as helicopters, vehicles, firearms and ammunition, and this we proceeded to obtain from among friendly countries.

The statement attributed in the 'Janadina' to the ex-Minister of Finance is such a blatant untruth that no person with a modicum of intelligence or reason could be expected to believe it."

I am reading extracts from the same HANSARD Column 2085.

ආචාර්ය එන්. එම් පෙරේරා මහතා
(கலாநிதி என். எம். பெரேரா)
"(Dr. N. M. Perera)

Mr. Speaker, I should be surprised if she does not deny this. After all, this is not the first time that she has thought it fit to deny a statement made by her in the past. This is not a fabricated story. This is one hundred per cent true.

ටී. බී. ඉලංගරත්න මහතා
(திரு. ரீ. பி. இலங்கரத்ன)
(Mr. T. B. Ilangaratne)
It is a lie !

ආචාර්ය එන්. එම් පෙරේරා මහතා
(கலாநிதி என். எம். பெரேரா)
"(Dr. N. M. Perera)
What do you know about this? Just shut your mouth. Let me give the facts.

ටී. බී. ඉලංගරත්න මහතා
(திரு. ரீ. பி. இலங்கரத்ன)
(Mr. T. B. Ilangaratne)
Absolute lie.–(*Interruption*).

සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)
Why did you keep quiet all this time ?

ආචාර්ය එන්. එම් පෙරේරා මහතා
(கலாநிதி என். எம். பெரேரா)
"(Dr. N. M. Perera)
I will tell you. Just wait a minuite. May I read out what I said? This is what you should remember. This is what I said at Ragama:

" අගමැතිණිය පෙරේද කදානේ දී කළ ප්‍රකාශයකට පිළිතුරු වශයෙන් ඉහත සඳහන් තොරතුරු අනාවරණය කළ ලංකා සමසමාජ පක්ෂයේ නායකයා මෙසේ ද කීය.

මම මේවා කියන්නට සතුටු නැහැ. "

That is a quotation from Dr. N. M. Perera.

" නමුත් අප්‍රේල් කැරැල්ලේ තරුණයන් පුනරුත්ථාපනය කිරීමට ලංකා සමසමාජ පක්ෂය එද විරුද්ධ වූ බව මැතිණිය කදානේ දී කියා තිබෙනවා "

සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)
I never said that.

ආචාර්ය එන්. එම් පෙරේරා මහතා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
Why did you not deny this? It was on this basis that I had to make that statement.

සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)
Therefore, you have to tell a lie ?

ආචාර්ය එන්. එම් පෙරේරා මහතා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)
To continue :

" මැතිණිය කට වහගෙන හිටියා නම්, හුවණට හුරුයි. එහෙම හිටියා නම් මා මේ රහස් හෙළි කරන්නේ නැහැ. මට ඇත්ත කියන්න සිදු වන්නේ මැතිණිය කට වහගෙන ඉන්නෙ නැති නිසයි.

සිරිමාවෝ බණ්ඩාරනායක මහත්මිය
(திருமதி சிறிமாவோ பண்டாரநாயக்க)
(Mrs. Sirimavo Bandaranaike)
මගෙ කට වහන්න කාටවත් බැහැ.

ආචාර්ය එන්. එම් පෙරේරා මහතා
(கலாநிதி என். எம். பெரேரா)
(Dr. N. M. Perera)

Let me continue to read :

" අප්‍රේල් කැරැල්ලේ තරුණයන් පුනරුත්ථාපනය කිරීමට අගමැතිණිය යෝජනා කළා. නමුත් එතුමියගේ ක්‍රමයට අපි විරුද්ධ වුණා. ඒ තරුණයන්ට බණ කියලා පුනරුත්ථාපනය කරන්න බැරි බව අපි කීවා.

මේ කැරැල්ලට සම්බන්ධ උනේ විප්ලවකාරී, සමාජවාදී අදහස් ඇති, අපේ තරුණ කොටසක් බව අප අගමැතිණියට එද කීවා. පැය 24 න් විප්ලව කරන්න බැරි බව ඇත්තයි. ඒ උනත් මෙම උද්යෝගිමත් විප්ලවකාරී තරුණ පිරිසට විප්ලවකාරී මග පෙන්විය යුතු බව ලංකා සමසමාජ පක්ෂයේ කෙනෙකු හැටියට මා යෝජනා කළා. නමුත් ඒකට අගමැතිණිය විරුද්ධ උනා.

අමෙරිකාවෙන් සොල්දදුවන් ගෙනැවිත් අපේ තරුණයන් මෙල්ල කරන්න මැතිණිය සූදනම් උනා. ඒ ආරංචිය ගෙනාවේ පිලික්ස් උන්නැහේයි. "

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ විධියටද මේක මර්දනය කරන්නටයි අපිට කියන්නේ ? මේවා නොකරන නිසාද, අපි දුර්වලය කියා අපට කියන්නේ ? ' අපිට ආඩම්බරයෙන් කියන්න පුළුවනි, 1971 අප්‍රේල් කැරැල්ල අපි එක සුමානයෙන් මර්දනය කළාය කියා ' අන්න එහෙමයි කියන්නෙ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආර්. ප්‍රේමදාස මහතා]

At what cost ? At what cost? How many thousands of youth were wiped out overnight ?

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Slaughtered.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

බොහොම ලස්සනට කියන්න පුළුවනි. සුමානයෙන් මර්දනය කළාය කියා. එදා හිටපු අර නියෝජ්‍ය රාජ්‍ය ආරක්ෂක ඇමතිතුමා කිව්වා—

"Within a week we dealt with it"! Here is Dr. N. M. Perera bearing testimony to the manner in which you dealt with those *tharunayas.*

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Mr. J. R. Jayewardene complimented us for controlling it.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

But these are facts.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

You are contradicting Mr. J. R. Jayewardene.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

We will compliment you even now for the manner in which you dealt with Vijaya Kumaranatunga.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Nevermind about Vijaya Kumaranatunga. Why are you contradicting your President ?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You sent Vijaya Kumaranatunga out. Very good. But you are scared of him.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

As leader of the Opposition sitting on this side of the House, Mr. J. R. Jayewardene complimented Mrs. Bandaranaike's Government for the manner in which it handled the insurgency.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I do not deny that.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

But what are you saying today ? Do not embarrass the President.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I am not embarrassing the President. I am not embarrassing anybody. I am only stating the facts. Dr. N. M. Perera explains the method you adopted to wipe out those *tharunayas.* I am only stating those facts. I do not know how you did it, but we are congratulating you for what you did to arrest that situation. But we do not know how you did it. Tell us how you did it.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Now you are walking on a tight rope.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Dr. N. M. Perera says how you did it. But I want to tell you, if that is the way you did it, we do not want to do that.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Let him rest in peace. He has gone a long time ago!

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විරුද්ධ පාර්ශවයේ තමුන්නාන්සේලා අද අපට කරන චෝදනාව මොකක්ද ? අපි දුර්වලයි ලු. ඒ අය සුමානයෙන් කළා ලු. ඒක කළ කාලය ඒකෙ ඇතුළෙ හිටි එක්කෙනයි කියන්නෙ. අපි දන්නෙ නැහැ. අපිව කිට්ටුවටත් ගන්නෙ නැහැ නෙ. අපිට මොකුත් කිව්වෙත් නැහැ නෙ. අදවත් කියන්නෙ නැහැ නෙ, ඒ තොරතුරු. අපි එහෙම නොවෙයි. අපි කරන ඔක්කොම තමුන්නාන්සේලා දන්නවා. "අපේ හමුදාවල් දුර්වලයි. අපේ රජය දුර්වලයි. අපට මුනිස්සම් නැහැ, අපට තුවක්කු නැහැ, මෙහෙමද මේක කරන්නෙ" කියා තමුන්නාන්සේලා අපටකියනවා. අන්න ඒකයි මම මේ කාරණා ඉදිරිපත් කළේ. නැතිනම් මේවා යටපත් වෙනවා. එම නිසා, තමුන්නාන්සේලාට අපි ස්තුතිවන්ත වෙනවා, මේවා ගැන එළිදරව් කරන්නට මේ සාකච්ඡාවේදී අපට අවස්ථාවක් ලබා දීම ගැන.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රජය උත්සාහ කරන්නේ මේ වැඩ පිළිවෙළට සියලු දෙනාම සම්බන්ධ කර ගන්නටයි. ඒක වැරදිද කියනවාද ? අපිට කිව්වා " Take the country into your confidence." කියා.

We have already taken all political parties into our confidence. Let us evolve a strategy and place that before the people (*Interruption*). With regard to Vasudeva, I will tell you the problem. It is a security problem. The Security Council says that he is

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

required. The security forces say that he is required, that Mr. Rohana Wijeweera is required. They must come and make certain statements because there are certain statements made against them. So let them come and make their position clear, and we will not keep them any longer. I have assured this House of that. Let them clear themselves. So many have done that. Why can they not come? If you know where they are, bring them.

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

They are not sure of their lives.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You can hand them over to me. I will look after them in the same maner in which you are being looked after. If you do not trust any one of us–

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Your Government cannot look after the prisoners in your own jail.!

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

We are not guarding the jails. That is the difference. I am telling you here, you can hand them over to me, to the President or to the Deputy Minister. There will not be any problem. We will give you a guarantee. We will be responsible to you. If you have any doubts–

අනිල් මූණසිංහ මහතා
(திரு. அனில் முனசிங்ஹ)
(Mr. Anil Moonesinghe)

No. But if they are handed over to you, you will hand them over to the prison.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Leave them to us. Have trust in us.

නියෝජ්‍ය කථානායකතුමනි, කථා කරන්නත් වාලේ කථා කර මේ තර්කවලට මුහුණ දෙන්න පුළුවන්ය කියා මම හිතන්නෙ නැහැ. ඒ නිසා මම නමුන්නාන්සේගෙන් මේ අවස්ථාවේදී ඉල්ලා සිටිනවා මේ යෝජනාව අනුමත කරන්නය කියා.

With the enactment of the Sixth Amendment to the Constitution the Members of the TULF refrained from attending the Sittings of Parliament, and consequently their seats fell vacant. With the interest of promoting a favourable climate for the round table amity talks now going on the Government decided to postpone the elections to the 16 vacant seats in the Northern and Eastern Provinces along with the election to the Minneriya seat.

The Government was of the opinion that the practice of postponing elections by a regulation published under the Public Security Ordinance offends Article 155 (2) of the Constitution and therefore decided to amend the Ceylon (Parliamentary Elections) Order in Council. This was on the advice of the Attorney-General, whose letter I read out just now.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Article 155 (2) of the Constitution reads as follows :

"The power to make emergency regulations under the Public Security Ordinance or the law for the time being in force relating to public security shall include the power to make regulations having the legal effect of over-riding, amending or suspending the operation of the provisions of any law, except the provisions of the Constitution."

This is why the Attorney-General is advising us in this manner. It may be mentioned that a similar provision exists in the Constitution of 1972, namely Article 45 (4).

The Cabinet of Ministers has certified that this Bill is inconsistent with the Constitution and is intended to be passed by a special majority as required by article 84 of the Constitution.

These are the circumstances under which this Bill was introduced. It is not fair to attribute all sorts of unwarranted reasons to the Government. We are dedicated to the principles of democracy. We are always prepared to hold elections. We held the local government elections recently and we also held by-elections. We could have kept quiet without holding by-elections, but we held them. Even in the future, we assure this House that we will hold elections at the appropriate time.

ආනන්ද දසනායක මහතා (කොත්මලේ)
(திரு. ஆனந்த தஸநாயக்க — கொத்மலே)
(Mr. Ananda Dassanayake Kotmale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකා පාර්ලිමේන්තු මැතිවරණ රාජ සභා ආඥාවේ 27 වන වගන්තිය සංශෝධනය කර මැතිවරණ කල් දැමීම සම්බන්ධව එයට සංශෝධන එකතු කරන්න යනවා. ඇත්ත වශයෙන්ම අපි මෙහිදී අදහස් දැක්විය යුතුයි. මැතිවරණ දැන් විහිළුවක් වෙමින් යනවා. මැතිවරණ ආඥා පනතත් දැන් විහිළුවට ලක් වෙනවා. ඒ මොකද, මුල සිටම පාර්ලිමේන්තු මැතිවරණ තිබුණ තත්ත්වය දැන් සීමාවක් නැතිව සම්පූර්ණයෙන් වෙනස් කරගෙන යනවා.

ඇත්ත වශයෙන්ම පැහැදිලි ලෙස මුල සිටම බලනවා නම් අපි ඒ දවස්වල විරුද්ධවූ ඒවා දැන් එකින් එක නැවත නැවත ස්ථිර වෙනවා. අපි ඒ දවස්වල කිව්වා, මහජන ඡන්දයක් නොමැතිව පාර්ලිමේන්තුවේ සම්මත කිරීමකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කිරීම වැරදියි කියා. රටේ වැදගත්ම පාර්ලිමේන්තුව හා රට පාලනය කරන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සකස් කළේ මහජන ඡන්දයකින් නොවෙයි. එය අපි පිළි ගන්නට ඕනෑ. සමහරවිට තමුන්නාන්සේලාගේ වාසියට ඒවා ඇත්තයි කියනවා. අපි එය පිළි ගන්නවා. පාර්ලිමේන්තුවේ මැජෝරිටි එක නැත්නම් වැඩි ඡන්දය තිබුණ පලියට තමුන්නාන්සේලාගේ වාසිය සඳහා තමුන්නාන්සේලා ඒවා කළා. පාර්ලිමේන්තුවේ ඡන්දයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්මත කරන්න බැහැ. එය වැරදියි. ඒ වැරදි මොන ආණ්ඩුව කළත්, ඒ කළ වැරදි පිළි ගන්නට ඕනෑ. එදා තමුන්නාන්සේලා ඒ වරද කළා. එයින් තමුන්නාන්සේලා අනවශ්‍ය විධියට බලතල ලබා ගත්තා. සමහරවිට පාර්ලිමේන්තුවට ඕනෑ විධියට එය වෙනස් කරගෙන, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද තවත් තහවුරු කරමින් ඊළඟට පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද සමහරවිට එක පුද්ගලයෙකුට පාවිච්චි කරන්න පුළුවන් තත්ත්වයට ගෙන ගියා. අපි එය පැහැදිලි කළා. දැන් ඊට වඩා දේවල් වෙමින් යනවා.

පසුගිය කාලයේදී තමුන්නාන්සේලාගේ මේ ආණ්ඩුවම, මේ රජයම, මේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවම, පිළපිටිය මන්ත්‍රීතුමාගේ සිද්ධියේදී ඒ මන්ත්‍රීතුමාට මේ පාර්ලිමේන්තුවට ඇවිත් වාඩි වෙන්නත් ඉඩ දුන්නා එහෙත් විරුද්ධ පාර්ශ්වය යම්කිසි ප්‍රශ්නයක් මතු කිරීමෙන් පසුව තමයි එදා සිටි කථානායකතුමාගේ ඕඩරයක් පිට එතුමා හෙම්න්ම පාර්ලිමේන්තුවෙන් පිට වුණේ. පිළපිටිය මන්ත්‍රීතුමාගේ නම නොමිනේට කළා. ඉන්පසුව එතුමා පාර්ලිමේන්තුවේ වාඩිවෙලා සිටියා. ඊට පසුව බයි ඉලෙක්ෂන් එකක් තිබ්බා. එහිදී එතුමා කීවේ මොකක්ද ? තරඟ කළ අනික් එක්කෙනා බයි ඉලෙක්ෂන් එකෙන් දිනුවත් එයාට පාර්ලිමේන්තුවට එන්න දෙන්නේ නැහැ කීවා. අපි එදා එයට විරුද්ධ වුණා, වැරදි මත වැරදි පාර්ලිමේන්තු ක්‍රම ක්‍රියාවට යොදනවාය කියා.

ගරු අගමැතිතුමායි ඒ පනත ගෙනාවෙ. එදා ඒකටත් අපි විරුද්ධ වුණා. එදා ගරු අගමැතිතුමා ගෙනා ඒ පනත පාර්ලිමේන්තුවේදී සම්මත වුණා. නමුත් අන්තිමේදී මොකද වුණේ ? මේ සියල්ලම අවසන් වෙනවාත් සමගම, ඡන්දෙන් පස්සෙ සරත් මුත්තෙට්ටුවේගම මහතා මන්ත්‍රීවරයෙක් වශයෙන් පාර්ලිමේන්තුවට තේරුණා. අන්න එතකොට ඒ සම්මත කළ පනතත් නිකම්ම අහෝසි වුණා. ඊළඟ සුමානෙ එතුමා පාර්ලිමේන්තුවට ගෙන්නුවා දිවුරුම් දෙන්න. එතකොට හිටපු පිළපිටිය මන්ත්‍රීතුමා කොහේ ගියාද එතුමාට මොනවා වුණාද දන්නෙ නැහැ.

අර තරම් මහන්සි වෙලත් මොකක්ද වුණේ ? ඇත්ත වශයෙන්ම මේ විධියේ වැඩවලින් මේ පාර්ලිමේන්තුව විහිළුවට ලක් වෙනවා. අපි ඒවා කිව්වම තමුන්නාන්සේලා අපට කියන්නේ විරුද්ධ පාර්ශ්වයේ ඉඳගෙන අපි හැම එකකටම විරුද්ධ වෙනවාය කියලයි. නැහැ. අපි විරුද්ධ වුණු ඒවා පස්සෙ හරි ගස්සන්න තමුන්නාන්සේලාට සිද්ධ වුණා. සරත් මුත්තෙට්ටුවෙගම මහතා අද පාර්ලිමේන්තුවේ ඉන්නවා. නමුත් එතුමාට එන්න දෙන්නෙ නැහැ කියන හැඟීමක් එදා පාර්ලිමේන්තුවේදී ඇති කළා. බහු ආසනයක් කරන්න ඕනෑය කියා ආයින් පනතක් ගෙනාවා. මේ විධියේ දේවලට අපි එදා විරුද්ධ වුණේ සාධාරණ හේතු උඩයි. නමුත් එදා ඒ කළ දේවල් වැරදියි කියන එක අද තමුන්නාන්සේලා පිළිගෙන ඉවරයි.

දැන් තමුන්නාන්සේලා එක අතකින් කියනවා ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කරනවාය කියා. ගරු අගමැතිතුමාමත් කියනවා අතුරු මැතිවරණ පවත්වනවාය කියා. හරි, අපි පිළිගන්නවා. සමහර විට තමුන්නාන්සේලාට ඇටෝර්නි ජෙනරාල්තුමා මේ අදහස දුන්නද, එසේ නැත්නම් ඇටෝර්නි ජෙනරාල්තුමාගෙන් ආණ්ඩුව විමසුවාද කියන කාරණය කෙසේද කියා අපි දන්නෙ නැහැ. සමහර විට ඒ විධියේ මතයක් එන්න ඇති. මොනවා වුණත් පාර්ලිමේන්තු මැතිවරණ කල් දැමීමට වුවමනා නම් මොකක්ද කරන්න ඕනෑ ? දැන් ආසන ගණනක් පුරප්පාඩු වී තිබෙනවා. මොකක් නිසාද ? 1983 ජූලිවලදී සිදු වුණු අවාසනාවන්ත සිද්ධීන් උඩයි. ඒ අවස්ථාවෙන් පසුව 6 වන සංශෝධනය අනුව ඒ ගොල්ලන් දිවුරුම් දෙන්න ආවෙ නැහැ. ඒ සංශෝධනය ඒ ගොල්ලන් පිළිගන්නෙ නැති නිසායි. ඒ නිසා ඒ අයට පාර්ලිමේන්තුවට එන්න ක්‍රමයක් නැහැ. එක අතකට ඡන්දයෙන් තේරුණු මන්ත්‍රීවරුන් වශයෙන් අපි ලැජ්ජ වෙන්න ඕනෑ. ඒ මොකද ? කිසිම හේතුවක් නැතිව ඒ ගොල්ලන් පැත්තකට තල්ලු කර තිබීම ගැන.

එසේ පැත්තකට තල්ලු කර ඒ ගොල්ලන් තවත් වියරු වට්ටවන්න ඒ ගොල්ලන්ගේ වේදනාව තවත් වැඩි කරන්න අපි ආයින් කියනවා දැන් උතුරේ හා නැගෙනහිර තිබෙන පාර්ලිමේන්තු ආසන දහසයේ ඡන්දය පවත්වන්න බැහැ සර්ව පාක්ෂික සාම සාකච්ඡාවලින් තීරණයක් ගන්න තුරු කියා. එහෙම නම් මෙතෙන්දී සීමාවක් කරන්න ඕනෑ. පාර්ලිමේන්තු වරප්‍රසාද යටතේ ඒ මැතිවරණ කල් දාන්න ඕනෑ නම්, එහෙම නම් යාපනේ හෝ කන්කසන්තුරේ හෝ මානිපායි හෝ අහවල් මැතිවරණ කොට්ඨාශයේ මැතිවරණ කල් දානවාය කියා ආසන වශයෙන් නම් කරන්න ඕනෑ. අවුරුද්දක් හෝ යම් කාලයක් නියම කර මේ සාකච්ඡා අවසන් වන තුරු කරන්න බැහැ කියා කල් දාන්න ඕනෑ. එතෙන්දී අපට පිළිගන්න පුළුවන් ඒක හරිය කියා. එහෙම නම් ඒ සාකච්ඡා ඉවර වුණාට පසුව ඒ අවුරුද්ද තුළ මැතිවරණ තබනවා කියන හැඟීමක් ඇති වෙනවා. ඒ නිසා මෙය ආසනවලට පමණක් සීමා කරන්න ඕනෑ. එසේ නැතිව මේ අන්දමට පොදුවේ සම්මත වුණොත් විරුද්ධ පාර්ශ්වයේ ගරු මන්ත්‍රීතුමන්ලා සඳහන් කළ අන්දමට මෙය අපේ නීති පොතේ සාමාන්‍ය නීතියක් බවට පත් වෙනවා ; අපේ ව්‍යවස්ථාවට ඇතුළත් වෙනවා.

ව්‍යවස්ථාවට ඇතුළත් වෙනවා කියන්නේ බලයට පත් වන ඕනෑම ආණ්ඩුවකට නැත්නම් පිරිසකට මෙය ප්‍රයෝජනයට ගන්නට පුළුවන් වෙනවා කියන එකයි. ඉතාම ආසාධාරණ ලෙස මෙය ප්‍රයෝජනයට ගන්නට පුළුවන්.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආනන්ද දසනායක මහතා]

මේ පනත අනුව ඕනෑම අතුරු මැතිවරණයක් කල් දමන්නට පුළුවන්. ඕනෑම හේතුවක් උඩත් එය කරන්න පුළුවන්. any other reasons කියලයි තිබෙන්නේ. ඕනෑම හේතුවක් සඳහන් කර ඡන්දය අවුරුද්දකින් කල් දමනවා යයි කියන්න පුළුවන්. එතකොට ඒක කරන්නේ public security හෙවත් මහජන ආරක්ෂාව සඳහාම කළ යුතු දෙයක් හැටියට නොවෙයි. මුළු ජාතියටම බලපාන ජාතික විපතක් උඩ නොවෙයි. ඕනෑම කරුණක් උඩ මැතිවරණය කල් දමන්නට පුළුවන්. එමෙන්ම එසේ කල් දැමීම අතුරු මැතිවරණ සම්බන්ධයෙන් පමණක්ය කියලත් නැහැ. අතුරු මැතිවරණ පමණක් නොවෙයි, මහ මැතිවරණයක් වුණත් කල් දමන්නට අවස්ථාව සැලසෙන වගන්ති තිබෙනවා. මැතිවරණ පැවැත්විය යුත්තේ සාමකාමී වාතාවරණයක් ඇතිවයි. එ නිසා උතුරේ සිද්ධීන් ඉවරයක් වන තුරු අතුරු මැතිවරණ කල් දැමීම කරනවා නම් මම යෝජනාවක් කරන්න කැමැතියි. අතුරු මැතිවරණ පැවැත්විය යුතු දනට හිස්ව තිබෙන ආසන අතුරින් විශේෂයෙන්ම හය වන ව්‍යවස්ථා සංශෝධනය අනුව දිවුරුම් නොදීමේ හේතුවෙන් හිස් වූ උතුරු නැගෙනහිර පළාත්වල ආසනවලට පමණක් මේ පනත සීමා කරනවා නම් ඒ ආසන නම් වශයෙන් සඳහන් කරනවා නම් මෙයට අපි එකඟයි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Send the amendment to us so that we may consider it.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

අපේ පක්ෂයේ අනික් අය මොනවා කියාදැයි මම දන්නේ නැහැ. මම කිව්වේ මගේ අදහසක් පමණයි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

So you do not want that view implemented? – (*Interruption*). We can consider. Let him send the amendment.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම කියන්නේ මෙයයි. උතුරු ප්‍රදේශයේ මේ විධියේ කරදර තිබෙනවා යයි තමුන්නාන්සේලා කියනවා. එහෙනම් ඒ ආසන විකේ අතුරු මැතිවරණ පමණක් All Party Conference එකේ සාකච්ඡා ඉවර වන තුරු කල් දමන්න. ඒ සාකච්ඡා ඉවර වුණාට පසුව ඒ අතුරු මැතිවරණ පවත්වන්න. හය මාසයකට කලින් ඉවර වුණොත් ඉවර වුණු වහාම පවත්වන්න.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

We have got one amendment. Let him also send the amendment, Sir, to consider.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

I can. අපි කියන්නේ මේක සීමා කරන්න ඕනැ කියන එකයි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ඉතින් සංශෝධනයක් එවන්නකෝ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

එහෙම නැතිව මෙය මේ විධියට සම්මත වුණොත් "බයි-ඉලෙක්ෂන්ස්" පමණක් නොවෙයි, මහ මැතිවරණත් කල් දැමීමට අවස්ථාව සැලසෙනවා.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

There is something in what he says.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඒක තමයි මම කියන්නේ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

There is something in what you say. Send me the amendment so that I may consult our legal advisers.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

කථා කරන ගමන් ඒක කරන්න බැහැනේ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ලියලා එවන්නකෝ.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

කථාව ඉවර වූ හැටියේම අපි සාකච්ඡා කර ඒක කරන්නම්.

මම කියන්නේ මේකයි. අපේ හැඟීමේ හැටියට මෙහි තිබෙන "ඉලෙක්ෂන්ස් කල් දැමීම" කියන එක මහ මැතිවරණවලටත් බලපානවා. එය වැරදියි. යම් යම් ත්‍රස්තවාදී ව්‍යාපාර උතුරේ තිබෙන නිසා ඒ ආසන 16 යේ "බයි-ඉලෙක්ෂන්ස්" තබන්නට බැහැ කියනවා නම් ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. ඒවාට විසඳුම් සොයන්නට All Party Conference එකේ සාකච්ඡා පැවැත්වෙන නිසා. ඒ නිසා ඒවා කල් දැමීම සුදුසුයි. ඒ නිසා අපි විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා, ඒ විධියේ සංශෝධනයකින් පසුව පවත්වන අතුරු මැතිවරණ උතුරේ ඒ ආසනවලට පමණක් සීමා කරනවා ඇත කියා. එහෙම කළාට ප්‍රශ්නයක් නැහැ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

උතුරෙයි, නැගෙනහිරයි.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

ඔව්, උතුරෙත් නැගෙනහිරත් ආසන 16 ක් තිබෙනවා නම් ඒ ආසන 16 තුළ පමණක් මේ කාලය තුළ මේවා කරනවා කියන්න.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Yes, so send your amendments.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මම විශේෂයෙන්ම කියනවා මේ කාලය සීමා විය යුතුයි. එය මීට වඩා අඩු කාලයක් විය යුතුයි. එම කාලය අවුරුද්දක් විය යුතුය කියන එක ඊට වඩා අඩු විය යුතුයි. මේ ජාතියේ ආරක්ෂාව සඳහා යම් යම් පියවර ගන්නවා නම්, ඒ පියවරවලට, ඒ සාකච්ඡාවලට, බාධාවක් නොවන්නට මෙසේ කිරීමේ අවශ්‍යතාවක් තිබෙනවා නම් එතැනත් සීමා වෙන්නට ඕනැ ; ඒ ආරක්ෂාව අවසන් වෙනවාත් සමගම ඒ කරදර අවසන් වෙනවාත් සමගම මැතිවරණයක් තබනවාය කියන එක එහි සඳහන් වෙන්නට ඕනැ. මේක ඒ කොටසට පමණක් සීමා කරනවා නම් ඒක අපට පිළිගන්න පුළුවන් වේනවා. [බාධා කිරීමක්]

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

' ටු ෆිල් එ වේකන්සි ', හරි මම පිළිගන්නම්. මම කියන්නේ හැම අතුරු මැතිවරණයක්ම ගැනයි. දැන් දකුණේ අතුරු මැතිවරණයක් ආවොත්– දැනටමත් මින්නේරියේ තබනවා. කුණ්ඩසාලෙන් එයිද දන්නෙ නැහැ. එහෙම ආවොත්–ඒවත් කල් දමන්න වෙනවා. ඒ හැම එකක්ම කල් දමනවා නම් ඒක ප්‍රජාතන්ත්‍රවාදිය කියා අපිට පිළිගන්න බැහැ. [බාධා කිරීමක්]

නමුත් මේ සංශෝධනය උඩ යම්කිසි හේතුවක් දෙන්නට පුළුවන්. මොන කරුණක් හෝ කියන්න පුළුවන්. එසේ කියා නිදහසක් දෙන්නට පුළුවන්. [බාධා කිරීමක්] සිකියුරිටි කියන විට ගරු අගමැතිතුමනි, ජාතියේ ආරක්ෂාව සඳහාය කියා ඕනෑම දෙයක් කියන්න පුළුවන්. ජාතියේ දැන් තිබෙන සාමය කඩවෙන්නට ඉඩ තිබෙනවාය කියා කියන්න පුළුවන්. ' එනි අදර් රීසන් ' කියන තත්ත්වයේ හැටියට සුළු ගංවතුරක් ගැලුවත්, කන්දක් කඩාගෙන වැටුනත් ඒක නිසා බැහැ කියන්න පුළුවන්.

ආර්. ප්‍රේමදස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ඉතින් එවන්නකො සංශෝධනය.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මගේ කථාව අවසන් වුණු හැටියෙ මම එවන්න බලන්නම්.

ආර්. ප්‍රේමදස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

සාකච්ඡා කරලා එවන්න.

ආනන්ද දසනායක මහතා
(திரு. ஆனந்த தஸநாயக்க)
(Mr. Ananda Dassanayake)

මේ සංශෝධනයට නැවත සංශෝධනයක් ඇවිල්ලා ඒ විධියට වෙනස් කළොත් සමහර විට සෑහෙන දුරට අපට පිළිගන්න පුළුවන්.

ආර්. ප්‍රේමදස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ලියා එවන්න.

අ. භා. 10

අමරසිරි දොඩන්ගොඩ මහතා (බද්දේගම)
(திரு. அமரசிறி தொடங்கொட — பத்தேகம)
(Mr. Amarasiri Dodangoda Baddegama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හදිසි නීතිය සම්බන්ධ විවාදයේදී මම කථා නොකළත් මේ සංශෝධනය පිළිබඳ විවාදයේදී අපි ඊට වඩා සාකච්ඡා කළ යුතුයි කියා මම විශ්වාස කරනවා. ආණ්ඩු පක්ෂයේ තමුන්නාන්සේලා අද මේ පනත සම්මත කිරීමට, නැත්නම්, මේ පනත සංශෝධනය කිරීමට සහභාගී වෙලා කලකට පස්සේ ආපසු හැරී බැලුවොත් මේ සංශෝධනය තුළින් ක්‍රියාත්මක වන දේ මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදී පැවැත්මට බලවත් තර්ජනයක් වන බව පෙනේවි. මම එහෙම කියන්නේ මේ ඉදිරිපත් වුණු අදහස් තුළින්. මැතිවරණ කල්දැමීම සහ මැතිවරණ ආඥාපනතේ සංශෝධන ගැන මේ පසුගිය කාලපරිච්ඡේදය තුළ සිදුවූ වෙනස්වීම් ගැන බලනවිට ආණ්ඩු පාර්ශ්වය කෙසේ වෙතත්, ආණ්ඩු පාර්ශ්වයේ සමහර පිරිස් කෙසේ වෙතත්– මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය අගය කරන වැඩි පිරිසක් ඒ සංශෝධන කෙරෙහි වැඩි ප්‍රසාදයක් නොදක්වන බව පෙනී යනවා. ආණ්ඩු පාර්ශ්වය තුළ අප්‍රසාදය තිබුණත් ඒ අවස්ථාවල එකඟවුණේ කණ්ඩායමක් වශයෙන් එක්ව සිටීම නිසා වන්නට පුළුවන්. මේ ඉදිරිපත් කරනු ලැබූ සංශෝධනය තුළ සැඟවී තිබෙන දෙයක් ගැන කරුණු පහදා දෙන්නටය කියා මම ගරු අගමැතිතුමාගෙන් ඉල්ලනවා.

මේ පනත් කෙටුම්පතේ 2 (ආ) වගන්තියෙන් කෙරෙන සංශෝධනය අනුව, මුල් ආඥාපනතේ 381 වන අධිකාරයේ 27 වෙනි වගන්තියේ දෙවන උප වගන්තිය වශයෙන් මෙය බලපාන්නේ මැතිවරණ දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් පුරප්පාඩුවක් පිරවීමට අතුරු මැතිවරණයක් පැවැත්වීමට කටයුතු කරන වෙලාවේදියි. රටේ මහ මැතිවරණය 1984 වර්ෂයට යෙදී තිබෙනවායයි හිතමු. 1984 ජනවාරි මාසයට පෙර දිස්ත්‍රික්ක කීපයක පුරප්පාඩු ඇති වෙනවා නම් ඒ පුරප්පාඩු පිරවීම මොන හේතුවක් නිසා හෝ කල් දැමුවොත් පවත්වනු ලබන මහ මැතිවරණයේදී මුළු රටේම දිස්ත්‍රික්ක නියෝජනය වන සභිකයින් සභාවට එන්නේ නැහැ. ඒ කියන්නේ අපි ලබන අවුරුද්දේ මහ මැතිවරණයක් පවත්වන්නට යනවා නම් ඒ මහ මැතිවරණය තිබියදී මේ අවුරුද්දේ ඔක්තෝබර් මාසයේ දිස්ත්‍රික්ක කීපයක මන්ත්‍රීවරු සිය කැමැත්තෙන් ඉල්ලා අස්වුණොත් ඒ දිස්ත්‍රික්ක කීපය තුළ ඒ පුරප්පාඩු තිබෙනවා. දිස්ත්‍රික්ක පහක පුරප්පාඩු තිබෙනවා යයි සිතමු. ඒ පුරප්පාඩු සඳහා මැතිවරණයක් නොපවත්වා, ජනවාරි මාසයේ පැවැත්වීමට නියමිත මහ මැතිවරණය පවත්වනවාද කියන එක ගැනයි මේ කියන්නේ. රටේ දිස්ත්‍රික්ක විසිපහක් තිබෙනවා නම් එයින් විස්සකයි මැතිවරණ පැවැත්වෙන්නේ. දිස්ත්‍රික්ක පහක මැතිවරණ කල් තැබෙනවා. එම නිසා මුළු රටේම මහ මැතිවරණයකින් තීන්දුවක් ගන්න ලැහැස්තිවන අවස්ථාවක මුළු රටම නියෝජනයවීමක් සිදුවන එකක් නැහැ. එම නිසා එම වගන්තිය "මහ මැතිවරණයක් පවත්වන අවස්ථාවකදී හැර" කියලා සංශෝධනය වුණොත් සෙසු අවස්ථාවල ඒ කියන්නේ–දෙවන උප වගන්තිය මුලට–[බාධා කිරීම්] ලියලා එවන්න පුළුවන්.

ආර්. ප්‍රේමදස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I must tell the hon. Members that if they are suggesting any amendments, let them send that in writing. I have to consult the legal officers.

We are prepared to accept any reasonable amendment.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

We are appreciative of what the Prime Minister says, because it is only after we discussed and came out with these facts that you are in agreement with it.

ආර්. ප්‍රේමදස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Is it that you do not agree with him ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

No, certainly not. I agree with you.

ආර්. ප්‍රේමදස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Do you agree with him on this amendment ?

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Do you agree with him ?

ආර්. ප්‍රේමදස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

That is why I am asking for the amendment for me to consider. I thought you all are working together.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Of course, we are.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

So let us have a clear amendment. One of your Members was suggesting an amendment. The Member for Kotmale was suggesting an amendment. Every amendment proposed to a Bill shall be examined by the Attorney-General in terms of Article 77 of the Constitution. So it is nothing but right for me to ask for the amendment in writing.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Of course.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

So please tell us. I am not saying that I am not prepared to consider these things. Please send it in writing.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම අදහස් ඉදිරිපත් කළේ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

මට තව කාරණයක් ගරු මන්ත්‍රීතුමාට කියන්නට තිබෙනවා. මෙය කියවා බලන්න. යම් මැතිවරණ දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් පුරප්පාඩුවක් පිරවීමට මැතිවරණයක් පැවැත්වීමට ආඥ කරමින් දැන්වීමක් පළ කිරීමෙන් පසුව. කවුද ඒ දැන්වීම පළ කරන්නේ ?

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

ජනාධිපතිතුමා.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

නැහැ, මැතිවරණ කොමසාරිස්. That is very important. I want him to keep that in mind. අනෙක් නිවේදනය එන්නේ එහෙම පළ කිරීමෙන් පසුවයි. සමහර උදවිය පෙන්වන්න උත්සාහ කරනවා, මේ සංශෝධනය මගින් බලාපොරොත්තු වන්නේ මැතිවරණ නොපවත්වන්නය කියා. මම මේ අංශය මතක් කරන්නේ ඒ නිසයි. මේ පනත් කෙටුම්පතේ 2 වැනි වගන්තියේ (ආ) උප වගන්තියේ මෙසේ සඳහන් වෙනවා :

"(ආ) ඒ වගන්තියේ අවසානයට පහත දැක්වෙන උප වගන්තිය එකතු කිරීමෙන් :—
'(2) යම් මැතිවරණ දිස්ත්‍රික්කයක් සම්බන්ධයෙන් පුරප්පාඩුවක් පිරවීමට මැතිවරණයක් පැවැත්වීමට ආඥ කරමින් දැන්වීමක් පළ කිරීමෙන් පසුව, ජාතික ආරක්ෂාවට හෝ මහජන සාමයට අදාළව පවත්නා. . . . . . .'"

අර "පළ කිරීමෙන් පසුව" ඒ කාර්යය දැනටත් කෙරී තිබෙනවා. නමුත් නීතිපතිතුමා කියනවා, හදිසි නීති යටතේ එවැනි නියෝගයක් පිළිබඳ දැන්වීමක් පළ කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනිය, පාර්ලිමේන්තුවේ 2/3 ක වැඩි ඡන්දයෙන් ඒ තත්ත්වය හරිගැස්සුවේ නැත්තම් අර හදිසි නීති රෙගුලාසිවලට විරුද්ධව උසාවිය ඉදිරියේ තර්ක කරන්න ඕනෑම කෙනෙකුට පුළුවන්ය කියා. ඒකයි නියම තත්ත්වය. එම නිසා වරදවා තේරුම් ගන්න එපා, මෙය මැතිවරණ නවත්වන්න හෝ අතුරු මැතිවරණ නවත්වන්න හෝ ගන්නා පියවරක්ය කියා. අපි කලින් තීරණය කළේ හදිසි නීති යටතේ ඒ දේ කරන්නයි. පසුගිය රජයටත් සිදු වුණා, හදිසි නීති යටතේ ඒ විධියට අතුරු මැතිවරණ කල් දමන්න. මම ඒ අවස්ථාවනුත් පෙන්වා දුන්නා. නමුත් හදිසි නීති යටතේ එසේ කිරීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව නීතිපතිතුමා පෙන්වා දුන් නිසයි, අප මේ සංශෝධනය ගෙනාවේ. එම නිසා අර සැකය නැති කර ගන්න ඕනෑ.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

මා හිතන හැටියට අතුරු මැතිවරණ කල් දැමීමේ දැන්වීම පළ කිරීමෙන් පසුව, පාර්ලිමේන්තුව විසුරුවා හැරීම නිසා මහ මැතිවරණයක් පවත්වන්න සිදු වුණොත් අර දැන්වීමට අදාළ දිස්ත්‍රික්ක අත් හැරෙනවා.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

අත් හැරෙනවා ?

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

ඒ ඔක්කෝම අහෝසියි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ඔව්.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

එහෙම නම් ඒ දැන්වීම පළ කිරීමෙන් පසුව මහ මැතිවරණයක් පැවැත්වෙන විට ඒ දැන්වීමට අදාළ දිස්ත්‍රික්ක අත්හැරෙනවා ?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

නැහැ, නැහැ. මහ මැතිවරණයක් කීවාම ඔක්කොම ඇතුළත් වෙනවා. අර දැන්වීමට අදාළ ඒවා අත්හැරෙන්නේ නැහැ. ගරු මන්ත්‍රීතුමාට ඇති ප්‍රශ්නය පහසුවෙන් විසඳා ගන්න පුළුවන්කම ලැබෙනවා, එතුමා අදහස් කරන සංශෝධනය මට ලියා එවනවා නම්.

May I point out Standing Order 38 (1).

"Every Amendment shall be put in writing and handed to the Secretary-General by the Member proposing it."

That is very important, Sir. With regard to this controversial Bill we won't be able to make a decision. As I said earlier, I have to consult the Attorney-General in regard to this Section also.

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

සමහර විට ඒක මේ වගන්තියට ඇතුළත් කරන්න පුළුවන් වෙයි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Let us have your amendments in writing without just making all sorts of suggestions and attributing all sorts of motives to the Government. If you want things cleared, please give us in writing.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අමරසිරි දොඩන්ගොඩ මහතා
(திரு. அமரசிறி தொடங்கொட)
(Mr. Amarasiri Dodangoda)

මේ පනත් කෙටුම්පත සම්බන්ධයෙන් කථා කරන්න මා අදහස් කළේ, සම්මත කෙරෙන මේ සංශෝධන හේතුකොට ගෙන ; මහ මැතිවරණයක් මගින් මුළු රටෙම කැමැත්ත විමසෙන අවස්ථාවක මේ සංශෝධන අනුව අතුරු මැතිවරණ කල් දමා ඇති දිස්ත්‍රික්ක ඒ මහ මැතිවරණයට සහභාගි නොවීමේ තත්ත්වයක් ඇතිවීම වැලැක්වීමේ අදහසින් බව ප්‍රකාශ කරන අතර, මගේ සංශෝධන ලිඛිතව ඉදිරිපත් කරන බවත් මතක් කරමින් මම නිහඬ වෙනවා.

අ. භා. 10.10

දිනේෂ් ගුණවර්ධන මහතා (මහරගම)
(திரு. தினேஷ் குணவர்த்தன — மஹரகம)
(Mr. Dinesh Gunawardene–Maharagama)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ සංශෝධන පනත් කෙටුම්පත පිළිබඳව කථා කිරීමට නොවෙයි, බලාපොරොත්තුවෙන් සිටියේ. නමුත් ගරු අගමැතිතුමාගේ අර්ථ නිරූපණයෙන් පස්සේ වචන කීපයක් පමණක්වත් කියන්න ඕනෑ. හදිසි නීති යටතේ අතුරු මැතිවරණ කල් දැමීම පිළිබඳ නිවේදන පළ කිරීමේ වලංගුතාවක් නැති බවට නීතිපතිතුමා උපදෙස් දී ඇති නිසාත්, සර්ව පාක්ෂික සාකච්ඡා පැවැත්වෙන නිසා අතරතුර ඇතැම් අතුරු මැතිවරණ පැවැත්වීමේ අයෝග්‍යතාවක් පෙනෙන නිසාත් මේ සංශෝධන පනත් කෙටුම්පත ඉදිරිපත් කළායයි ගරු අගමැතිතුමා කීවා. පාර්ලිමේන්තුව තුළ මහජන මතය දැක්වීම සඳහා මහජන නියෝජිතයන් පත් කර ගැනීම සඳහායි, අතුරු මැතිවරණ පවත්වන්නේ. ඒ ඒ අවස්ථාවල නොයෙකුත් ප්‍රශ්න රට තුළ ඇති වෙන්න පුළුවනි. පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් පත් වන්නේත් ආණ්ඩු පත්වන්නේත් බොහෝ විට මැතිවරණ කාලයේදී පවතින ප්‍රධාන ප්‍රශ්න මුල් කරගෙනයි. ඒ නිසා, සර්ව පාක්ෂික සාකච්ඡාවක් රටේ පවතින නිසාම අතුරු මන්ත්‍රී තරග පැවැත්වීමේ යෝග්‍යතාවක් නැත කියන දේ මෙහි විශේෂයෙන් සඳහන් කිරීමේ අවශ්‍යතාවක් අපි දකින්නේ නැහැ. එහි සාධාරණත්වයක් අපි දකින්නේ නැහැ.

දෙවැන්න, හයවැනි සංශෝධනය නිසා මේ පාර්ලිමේන්තුවට ඒමට නොහැකිනාවක සිටි, හිටපු මන්ත්‍රීන් ගණනාවක් වෙනුවෙන් අතුරු තරග පැවැත්වීමට කිසිම ප්‍රශ්නයක් තිබිය යුතු නැත කියන හැඟීමයි මහජන එක්සත් පෙරමුණ වෙනුවෙන් මම ප්‍රකාශ කරන්නේ.

මේ රටේ ද්‍රවිඩ ජනතාව නියෝජනය කරන්නේ ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණ පමණක් නොවෙයි. එම නිසා අතුරු තරඟයක් පැවැත්වුණොත් හය වැනි සංශෝධනය පිළිගත්තා ද්‍රවිඩ ජනතා නියෝජිතයන් මැතිවරණවලදී තම අදහස් නියෝජනය කරන්නට ඉදිරිපත් වෙයි. එයයි අපගේ මතය. මෙය විශේෂයෙන් සඳහන් කිරීමට මම අදහස් කළේ උතුරු පළාතේ තත්ත්වයන්හි වැරදිනා අප දකින නිසායි. මම මීට වඩා දීර්ඝ වශයෙන් කතා කිරීමට අදහස් කරන්නේ නැහැ. වෙන් වී යාමේ මතය පළකළ පක්ෂයට පමණක් නොවෙයි පාර්ලිමේන්තුව තුළ ද්‍රවිඩ ජනතාව නියෝජනය කිරීමේ අයිතිය තිබෙන්නේ. තමන්ගේ මතය පාර්ලිමේන්තුවට ගෙන එමින් ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්නවලට විසඳුම් සෙවීමට ආත්ම ශක්තිය සහ විශ්වාසයක් තිබෙන වෙනත් කොටස් ද්‍රවිඩ ජනතාව අතර තවත් සිටින්නට පුළුවනි. එම නිසා මේ සාකච්ඡාවේදී මම කියන්නට අදහස් කළේ, මෙය ඒ හේතුකොට ගෙන අතුරු මැතිවරණ කල් දැමීම සඳහා වූ සංශෝධනයක් ඇති නොවිය යුතුය කියන ටිකයි.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

දැන් ඇති වී තිබෙන තත්ත්වය උඩ, ද්‍රවිඩ එක්සත් විමුක්ති පෙරමුණෙන් බාහිර කණ්ඩායමකට වුවත් තරග වදින්නට පුළුවන් වාතාවරණයක් උතුරේත් නැගෙනහිරේත් තිබෙනවායයි අපට හිතන්නට අමාරුයි. ගරු මන්ත්‍රීතුමා එහෙම කියනවායයි මම හිතන්නේ නැහැ. එය ඉතාම වැදගත්.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගරු අගමැතිතුමා කියන දේට අන්තිමට මම එන්නයි බලාපොරොත්තු වුණේ. මින්නේරියේ අතුරු තරගය පැවැත්වීමට දින නියම වී තිබුණා. ජනවාරි මස 19 වැනිද නාම යෝජනා බාරගන්නට නියමව තිබුණා. නමුත් නාමයෝජනා බාරගත්තේ නැහැ. මින්නේරිය ප්‍රදේශයේ ඊට බලපාන ආකාරයේ කිසිම ප්‍රශ්නයක් තිබුණේ නැහැ.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

ගංවතුර විතරයි.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

ගංවතුරු තත්ත්වයන් තුළ මේ රටේ මහා මැතිවරණ පවා පවත්වා තිබෙනවා. 1947 මහා මැතිවරණය, 1952 මහා මැතිවරණය ඊට කදිම උදාහරණ. ගංවතුරු කාලවලදී පවා ඡන්දදායකයන් ඡන්ද පොළවලට ගිහින් ඡන්දය පාවිච්චි කරනවා. එහි යම් වැරදිනාවක් තිබෙනවා නම් ඡන්ද පෙත්සම් මගින් ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලංකා පාර්ලිමේන්තු ආඥාපනතේ තිබෙනවා.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

1952 දී යූ. එන්. පී. එක හුඟාක් සීට් දිනුවේ ගංවතුරු නිසා.

දිනේෂ් ගුණවර්ධන මහතා
(திரு. தினேஷ் குணவர்த்தன)
(Mr. Dinesh Gunawardene)

මම විශේෂයෙන් කියන්නේ ඒ ප්‍රශ්නය නොවෙයි. මෙය ක්‍රියාත්මක වන්නට යන්නේ නීතිපතිතුමාගේ උපදෙස් මත නම් මෙහි අපි දකින පැත්ත මෙයයි. මහජන නියෝජිතයන් පත්වීමට තිබෙන අවස්ථා පසුගිය කාලයේදී වේගයෙන් කපා හරිනු ලැබුවා. මහජන ආරක්ෂාව අවශ්‍ය නිසා අතුරු තරඟවලින් මහජන නියෝජිතයන් පත්කිරීම සඳහා අතුරු මැතිවරණ පවත්වන්නට බැරි නම්, ගරු අගමැතිතුමා විසින් පැහැදිලි කරන ලද්දේ රජයේ චේතනාව නම්, මෙය දින තිහක් පමණක් කල්දැමීමේ බලය ජනාධිපතිවරයාට දිය යුතුය. ඊට වඩා කල් දමනොත් ඒ සඳහා මහා පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා පැමිණිය යුතුය. යනුවෙන් කලවානේ ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවෙගම මහතා) ඉදිරිපත් කළ සංශෝධනය පිළිගන්නට රජයට කිසිම අමාරුවක් නැහැ. එම නිසා මම මීට වැඩි දෙයක් කියන්නේ නැහැ. මේ තත්ත්වය යටතේ අපට මීට එකඟවන්නට පුළුවන් වන්නේ මේ සංශෝධනය පිළිගන්නේ නම් පමණක් බවත් එසේ නැත්නම් මීට විරුද්ධ වන්නට අපට සිදු වන බවත් කියන්නට ඕනෑ.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Mr. Deputy Speaker, when you open the first page of this Bill to amend the Ceylon (Parliamentary Elections) Order in Council, 1946, and look at the "Statement of Legal Effect", you can clearly see the purpose of this Bill.

"The legal effect of this Bill is to enable the President to postpone, on the grounds of national security, the nomination day or date of poll fixed in respect of an election."

That is the statement of Legal Effect. When you read the body of the Bill proper, Section 2 (b) (2) says :

"If after the publication of a notice ordering the holding of an election to fill a vacancy in respect of any electoral district, the President is satisfied that, owing to the prevailing conditions relating to national security or public order or for any other reason"–

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනුර බණ්ඩාරනායක මහතා]

You say in the Statement of Legal Effect clearly and categorically on the grounds of national security, but when you read the body of the Bill it says also "for any other reason". There is a stark contradiction. (*Interruption*) Act of God? There are lots of acts of God. There is a stark contradiction of this Bill itself. Here the statement of Legal Effect clearly says national security, but when you read the Bill you go from national security to public order and from public order you divert and deviate for "any other reasons". What is this "any other reasons?" What is the grounds of national security? What is the "any other reasons?" Why do you have that? If you are quite clear in the Statement of Legal Effect, that it is only on the grounds of national security, why do you want to say "for any other reasons"? What is the reason for putting that? That is why I say there is an anomaly and contradiction in terms of this whole Bill and therefore the Sri Lanka Freedom Party is totally opposed to this.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Why did you postpone the Puttalam by-election?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

You all criticized that.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

No, no, we did not criticize that, we supported it at that time. Under the emergency you did it in 1971.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

It was a national crisis in 1971. The whole country was in flames. Here only one or two districts are involved.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

The same districts, North and East.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

What about Minneriya?

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Minneriya – we can correct that!

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

That is why the hon. member for Kotmale, very rightly said "restrict it to the North and the East," but this is for the whole country. You are permanently binding them. We are keen on all elections.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Including North and East at this moment? You think elections can be held in the North and East at this moment?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

I will come to that in a minute.

Now Sir, what is the real purpose of this Bill? Is that you want to postpone a by-election or for a vacancy in the House that has been created on some ground or the other for a period of one year. My Friend hon. Member for Kalawana is of the view, which I think is quite justifiable, that it can be extended every year. That is his point of view. There is something valid in that. The sum total of the effect of this whole Bill is that you want to arm yourself with new powers to postpone by-elections for a period of one year on some pretext or the other. And even the pretext is not there. The pretext under the statement of Legal effect is one thing, and in the body of the Bill the pretext diverts into various other channels, like the Mahaweli diversion!

Now Sir, we are worried about this for the simple reason–the Prime Minister assured us that they are not scared of by-elections; all that is well and good–but look at the record of this Government regarding by-elections. We can only judge your performance by your record. We cannot be taken in by various assurances given from time to time. Look at your record–Look at your 1978 Constitution. For a Government that claims to be democratic, for a Government that claims to be safeguarding the rights of the people, a Government that talks about democracy from morning till night from every roof top, you are the first Government that has the audicity to postpone by-elections permanently, have completely cancelled by-elections.

In case some of the members have fogtten, I will remind them. Take the 1978 Constitution, Section 161, sub-section (*d*) (iii):

" where a vacancy as is referred to in sub-paragraph (i) or (ii) has occurred, the Secretary-General of Parliament shall forthwith inform the Commissioner of Elections of such vacancy. The Commissioner of Elections shall thereupon require the Secretary of the political party to which such Member belonged to nominate a member of such partry to fill such vacancy" –

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

This is the first time in any democratic party in this country claiming to be democratic enshrined in their own constitution the permanent burial rights of all by-elections in this country. Thereafter we will say goodbye to by-elections. Suddenly you had a change of mind, you rushed into this House with a Fifth Amendment, changed that Section 161–I do not want to read that now, Sir, because we all know what the Amendment five to the constitution is–where, if the party which won the seat that has fallen vacant does not nominate a Member of Parliament within a stipulated period of time you will have a by-election.

Now that was your Fifth Amendment to the Constitution. What did you do to that. You brought in that here and 19 members of Parliament who were unceremoniously sent out of this House. Some of them even did not know that they had ceased to be members of Parliament. I found one Member of Parliament sitting inside his jeep crying outside Diyawanna Oya because he came into this House and was not permitted to come because he was no longer a member, and the man had not even been informed. That was the way in which you rushed through your Fifth Amendment and completely threw out, unseated, ejected 19 members of this House of your own party completely out of this House.

සරත් මුත්තෙට්ටුවේගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

Some others came and enquired whether their letters had also been sent !

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

That is the way you treated 19 members of this House. Then what did you do after that.

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

Where are those letters ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Sir, this is a very interesting record. Shoddy to say the least. Then what did the government do. You declared 19 by-elections. But you had by-elections only for 18 seats. You declared 19 vacancies, declared 19 by-elections and had only by-elections for 18 seats. What happened to that extra one seat. It will go down in the Parliamentary history as the biggest insult to the intellegence of the people of this country. What did you do to the Panadura seat. You had a set of standards by which you are going to have by-elections. I cannot remember all the standards. One was that the United National Party candidate for the Presidency, His Excellency Mr. J. R. Jayewardene, should have polled less than all the candidates of the Opposition, that is the SLFP, LSSP, Mr. Wijeweera and so on. Panadura fell into that category. The anti-UNP votes were more than what Mr. J. R. Jayewardena polled.

Then take the results of the referendum. The number of people of Panadura who wanted elections was, I think, 25,569. 19,459 people voted for postponing elections. We had a majority of over 6,000 in the Panadura seat who voted for the poll. Now you declared a by-election. Everybody was waiting. We announced our candidate also which is a mistake we made. The SLFP candidate for Panadura was Dr. Neville Fernando, whom you had the great distinction by unceremoniously kicking out of this House, for speaking his mind. After we announced Dr. Fernando's nomination, you got cold feet. You got scared that he was coming to this House and in the shoddiest, in the ugliest possible manner you went and appointed a chit MP having declared a by-election because you wanted to prevent Dr. Neville Fernando whom you threw out of this House from coming back to this House as a member of the SLFP. That was the greatest tribute you paid to Dr. Fernando (*Interruption*). The M.P. for Attanagalle was not nominated in that style. Certainly not. You declared 19 by-elections and you got so scared that the man whom you threw out might come into this House through another party, that you shut the door to him and threw him out.

Now, Sir, look at the history, look at the shoddy, sad, miserable history of how you have treated with contempt the concept of by-elections from the beginning up to date. The Prime Minister can read the Attorney General's report, all manner of things he can say in this House, but we are guided by your record. And when you look at the record of the United National Party it is a sad commentary on your belief in the fundamental rights of the people of this country.

Now, Mr. Deputy Speaker, there is another matter which I would like to remind this Government. Now in this amendment to the Ceylon (Parliamentary Elections) Order in Council, you say that you can postpone by-elections for 12 months. (*Interruption*). I am coming to the conditions. That is exactly what I am going to say. Now please listen to me. " Owing to the prevailing conditions relating to the national security, " if that is genuinely your reason which I do not think it is–we pay you the compliment of saying that it is genuinely your reason–Then you have insulted the All-Party Conference beyond redemption. because you summoned the All-Party Conference to solve the national question, to solve the racial issue. You have invited all the parties in this country. Some

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනුර බණ්ඩාරනායක මහතා]

came, some did not come, some came and went. Even today, this morning, His Excellency the President in the course of his address to this House pinned a lot of faith and hope in the All-Party Conference.

I believe that the strategy of the United National Party Government is to try and find, through consensus or whatever it is, at least some form of solution to this national question. Now if you assume that this national question, the question of national security and public order is going to continue for time immemorial, then that means you have no faith in the very proposals that the UNP brought before the All Party Conference. You have no faith in the participants of the All Party Conference. (*Interruption*) Then you accept the amendment brought by the hon. Member for Kalawana.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

What is that ? An amendment cannot rectify that.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Every month you come to this House and get it rectified. (*Interruption*) When you say that about national security and public order and so on and so forth, that means you have no inherent confidence in yourself to solve this problem. Then what about the other Parties? As the hon. Member for Matugama very rightly said, the Hon. Prime Minister, you remember said in this House when he proposed the All Party talks–I think in June–as he came to this House from Matugama, " I do not believe in round tables or square tables or rectangular tables. " Within three months he had to eat his words. He had come and invited all of us to participate in the conference. The Hon. Prime Minister made a long speech today arguing this way and that way with his customary skill–I will come to his speech in a little while–trying to tell us that we should come back and take the responsibility and implement this and so on and so forth. He brought in all sorts of unnecessary side talk also–I will come to that later. He asked us to come back. What did the Hon. Minister for Mahaweli Development say ? Hon. Gamini Dissanayake, a member of the UNP delegation said : " We do not want Mrs. Bandaranaike and the SLFP ". (*Interruption*) Why not, they were headlines ! I have nothing against my good Friend Hon. Dissanayake, but he says the conference will progress satisfactorily even without Mrs. Bandaranaike and the Sri Lanka Freedom Party. And you come and tell us to come back. Please co-ordinate your wave length at some point or the other. The Hon. Prime Minister is going in one direction, Hon. Dissanayake is going in another direction and the President seems to be going in a completely different direction and we are all wondering where the hell we are all going. (*Interruption*).

ලක්ෂ්මන් ජයකොඩි මහතා
(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)
(Mr. Lakshman Jayakody)

The Hon. Minister of Finance is going in another direction, through the Treasury.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

The Hon. Minister of Finance is on his own little race. He is hammering the Hon. Minister of Industries, hammering the Hon. Minister of Trade. The Hon. Minister of Labour is hammering my Friend the Hon. Minister of Education.

සරත් මුත්තෙට්ටුවෙගම මහතා
(திரு. சரத் முத்தெட்டுவெகம)
(Mr. Sarath Muttetuwegama)

And the Benz cars are going in another direction !

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

What is this, Sir ? Today, I must say–I hope the Hon. Prime Minister does not misunderstand me – I do not mean this in bad faith. He is one of the most skilled persons who makes situations worse. Where the SLFP is concerned he has been doing that job with masterful elegance for four or five years. He comes here – he has a lovely command of the Sinhala language. He rolls it this way, he rolls it that way. Back benchers laugh and encourage him and he gets even more aggressive, and he has revelled in this for years. That is what he should do. He must do that. That is his job, I must confess. But today you did it very badly Hon. Prime Minister. Pardon me for saying this with all respect to you. You skated on very thin ice, because I was amazed that a man of your competence, of your experience should talk such a great deal about Vijaya Kumaratunga. You talked, and you talked, and you talked. I think half of your speech was on Kumaratunga. You complimented him.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

You did the same thing at Beliatta.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

That was a public meeting.–(*Interruption*.) That I agree. He is whacking me from morning till night, but you are praising him.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I was not praising anybody.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

You said that he is a hard working man. I think the Hon. Prime Minister on the Floor of this House only three or four months ago said that he is the only man who can lead the SLFP.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

If somebody asked me to vote between you and Mr. Vijaya Kumaranatunga, I would vote for you.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Thank you. I am deeply honoured.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Are you happy about it ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

But that is not the point. Now, again you are trying with your customary skill, to draw a red herring.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

No, no. You were saying that I was praising Mr. Vijaya Kumaranatunga. When I express my appreciation of you, you say that is a red herring. (*Interruption*).

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

The Hon. Prime Minister must be a little cautious because he is praising you. Kumaranatunga is praising you on every platform.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Is that so ? I did not know that.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

I will give you the tape. He is praising you, and you are praising him.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I am praising you.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

The dangerous thing is this, Sir. There is a dangerous point here. I do not think the Hon. Prime Minister has realized that.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Where did he praise me ?

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

All over the place – Gampaha. I will give you the tape.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Oh, I see. (*Interruption*).

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Not Nugegoda. At a number of places. At three or four meetings he has praised you to the sky as the saviour of the UNP and the country and so on. The dangerous thing is not that. You are also praising him here. The worst part is this. Kumaranatunga is blackguarding the President. He is scolding the President in rank filth. Of course, he is scolding me, because it is his main pastime. That is all right. He might try to create the impression in the country that you are getting him to do that. Please be careful of that.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

I am.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Both of you are complimenting each other like two lovers. He may be trying to create a serious doubt in the minds of the people that you are the one who is behind it. I am not saying you are. You are far more sensible than that, Hon. Prime Minister. I know that. You are a man of great experience and skill. I know you will never get involved with that ragamuffin. But

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අනුර බණ්ඩාරනායක මහතා]

when you compliment each other like this and he scolds the President – Sir, he scolds the President from morning till night. I am not saying he should not do it.– (*Interruption*). I think there will be another word that can be used to describe it.

මන්ත්‍රීවරයෙක්
(அங்கத்தவர் ஒருவர்)
(A Member)

Neck to neck.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Neck to neck. Therefore, he is trying to put you in trouble. He wants to put you in trouble by showing that you are supporting him.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr R. Premadasa)

You also praise me.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

Whenever you do a good thing I praise you. We have clashed but I have always complimented you on your housing programme. Whenever you do good things, certainly we praise you. But this time what he is trying to do is to put the Hon. Prime Minister into trouble.

ආර්. ප්‍රේමදාස මහතා
(திரு. ஆர். பிரேமதாச)
(Mr. R. Premadasa)

Do not worry about it.

අනුර බණ්ඩාරනායක මහතා
(திரு. அனுர பண்டாரநாயக்க)
(Mr. Anura Bandaranaike)

No, but it is not good. I am very concerned because he is a very real – (*Interruption*). The other thing is, the Hon. Prime Minister compliments him while the President went on the air and on television and said that the main reason for his postponing the elections was because of the naxalites. He called him a rank naxalite. So I think the Hon. Prime Minister should be a little cautious when he does this kind of tight-rope walking. That is a real tightrope.

The Hon. Prime Minister referred to 1971 and said that we were responsible for the killing of a number of people. He waxed eloquent on this. But does he forget that his leader, His Excellency Mr. J. R. Jayewardene, complimented Mrs. Bandaranaike on the Floor of this House in 1971 on the way she handled the insurgency, the way she controlled terrorism in this country? Today you are asking something quite contrary.

